(ඊ) රාජ්‍ය මූල්‍ය

1970/71 සහ 1971/72 යන වර්ෂයන්හි මුල් ඇස්තමේන්තු සහ ඉකුත් මුදල් වර්ෂ නවයකට අදළ දත්තයන්ද සමඟ 1970/71 මුදල් වර්ෂයේ (එනම් 1970 ඔක්තෝබර් සිට 1971 සැප්තැම්බර් දක්වා) රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රධාන ලක්ෂණයන් II (ඊ) 1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1973 ජනවාරි 1 ද සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් වර්ෂය ලෙස ලිත් වර්ෂය අනුගමනය කිරීමට රජය ගත් තීරණය නිසා 1971/72 මුදල් වර්ෂයට, 1971 ඔක්තෝබර් 1 සිට 1972 දෙසැම්බර් 31 දක්වා වන මාස 15 ක කාලවෙජදයක් අයත්වන බව සැලකිය යුතුය. 1970/71 සහ1971/72 යන වර්ෂයන්ට අදළ දත්තයන් පිළිබඳ විස්තරාත්මක වර්ගීකරණයක් සහ විග්‍රහයක් මෙම සංඛ්‍යා සටහන්හි සහ විස්තරයෙහි දක්වා තිබේ. අදළ අවස්ථාවන්හිදී මාස 15 කින් යුත් 1971/72 මුදල් වර්ෂයේ සංඛ්‍යා ඉකුත් මුදල් වර්ෂයන්හි දත්තයන් සමඟ සංසන්දනය කිරීමට හැකිවන පරිදි මාස 12 ක අනුපාත පදනමක් යටතේ දක්වා තිබේ.

සැලකිල්ලට භාජනය වන 1970/71 මුදල් වර්ෂයේ මුළු ආදයම රුපියල් දශලක්ෂ 2815 ක් වූ අතර, මුළු වියදම රුපියල් දශලක්ෂ 4143 ක් විය. මෙම මුළු වියදම රුපියල් දශ ලක්ෂ 4035 ක් වූ සම්මත වියදමෙන් සහ 'අත්තිකාරම් ගිණුම්'[1] සම්බන්ධයෙන් වූ රුපියල් දශලක්ෂ 108 ක ගෙවුම්වලින්ද සමන්විත විය. ඉකුත් මුදල් වර්ෂයට වඩා මුළු ආදයම සහ මුළු වියදම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 79 කින් (නැතහොත් 2·9% කින්) සහ රුපියල් දශලක්ෂ 257 කින් (නැතහොත් 6·6% කින්) වැඩි විය. රුපියල් දශලක්ෂ 3225 ක්වූ පුනරාවර්තන වියදම 1969/70 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 352 ක (නැතහොත් 12 3% කින්) කැපී පෙනෙන වැඩිවීමක් පෙන්විය. අනෙක් අතට, රුපියල් දශලක්ෂ 810 ක් වූ ප්‍රාග්ධන සම්මතයන්ට අදළ වියදම් ආසන්න වශයෙන් ඉකුත් මුදල් වර්ෂයේ මට්ටමෙම පැවතින.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ රුපියල් දශලක්ෂ 1327 ක් වන අය - වැය හිඟය මේ වන විට වාර්තාගත වූ ඉහළම හිඟය වනු ඇත. දේශීය වෙළඳ පොළ ණය ගැනීම් මගින් රුපියල් දශලක්ෂ 693 ක් ද, විදේශීය මූල්‍ය මගින් රුපියල් දශලක්ෂ 370 ක්ද, දේශීය වෙළඳ පොළ නොවන ණය ගැනීම් (ශුද්ධ පරිපාලන ණය ගැනීම්) රුපියල් දශලක්ෂ 140 ක්ද බැගින් මෙම හිඟය පියවන ලදී. මීට අතිරේකව, හිඟයේ ඉතිරි කොටස පියවීමට මුදල් ශේෂයන් රුපියල් දශලක්ෂ 123 කින් පහත හෙළනු ලැබීය.[2] රුපියල් දශලක්ෂ 244 ක ණය ආපසු ගෙවීම[3] අත්හළ විට 1970/71 මුදල් වර්ෂයේ ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 1083 ක් විය.

මූලික අය-වැය යෝජනා සමඟ සසඳන කළ, 1970/71 වර්ෂයේ මුළු වියදම රුපියල් දශලක්ෂ 85 කින් වැඩිවිය. මුදල් වර්ෂයේ අවසාන භාගයේදී පාර්ලිමේන්තුව විසින් රුපියල් දශලක්ෂ 333 ක පරිපූරක ඇස්තමේන්තු (පුනරාවර්තන සම්මතයන් සඳහා රුපියල් දශලක්ෂ 209 කින් සහ ප්‍රාග්ධන සම්මතයන් සඳහා රුපියල් දශලක්ෂ 124 කින් සමන්විත වන) සම්මත කිරීමද සැළකිල්ලට ගත් විට වියදමේ වැඩිවීම පාලනය කළ හැකි අනුපාතයන්හි තබාගෙන තිබෙන බව පෙනේ. සම්මත කරනු ලැබූ පරිපූරක ඇස්තමේන්තුවලින් ඉහළ අනුපාතයක් සෘජුව හෝ වක්‍රව හෝ වර්ෂය තුළදී ඇති වූ ප්‍රස්තවාදි කටයුතු මැඩලීම සඳහා රජයට දැරීමට සිදුවූ අමතර වියදම්හි ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ ඒවා විය. වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන වියදම මූලික ඇස්තමේන්තු වලට වඩා පහළ නොවැටුණි නම්, වියදමේ වැඩිවීම මීටත් වඩා වැඩිවීමට ඉඩ තිබුණි. මෙයටද එක් හේතුවක් වූයේ වර්ෂය තුළ රටේ පැවති නොසන්සුන් තත්ත්වයන්ය. විශේෂයෙන්ම, සේවා නියුක්ති වැඩ පිළිවෙල වෙනුවෙන් සම්මත කළ රුපියල් දශලක්ෂ 200 කින් ඒ සම්බන්ධව වියදම් කළේ රුපියල් දශලක්ෂ 8 ක් පමණි. වර්ෂය සඳහා වූ මූලික ඇස්තමේන්තුවල ඇතුළත් නොවූ අත්තිකාරම් ගිණුම්

1· 151 පිටුවෙහි ඇති පාද සටහන් බලන්න

2· 154 පිටුවෙහි ඇති පාද සටහන් බලන්න.

3· II (ඊ) 1 සංඛ්‍යා සටහනේ (ඇ) පාද සටහන බලන්න

වෙනුවෙන් කළ රුපියල් දශලක්ෂ 108 ක ශුද්ධ ගෙවීමද, මුළු වියදමේ වැඩිවීමට හේතුවිය. අනෙක් අතට, මුළු ආදයම කලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 63 කින් අඩුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මූලික ඇස්තමේන්තු සංඛ්‍යාවට වඩා අය-වැය හිඟය රුපියල් දශලක්ෂ 147 ක වැඩිවීමක් පෙන්විය. මෙම වැඩි වූ හිඟය පියවීමේදී දේශීය වෙළඳපොළ ණය ගැනීම් මූලිකව පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 151 ක් වැඩිපුර සැපයීණ. අය වැය වාර්තාවෙහි මූලිකව අපේක්ෂා නොකළ රුපියල් දශලක්ෂ 140 ක දේශීය වෙළෙඳපොළ නොවන ණය ගැනීම් එනම් පරිපාලන ණය ගැනීම්ද, රුපියල් දශලක්ෂ 123 මට්ටම දක්වා මුදල් ශේෂයන් (ප්‍රතිපාර්ශවීය අරමුදල්ද ඇතුළත්ව) පහළ හෙළීමද ඉතිරිව ඇති හිඟය පියවීමට ආධාර විය. අපේක්ෂිත වූ දේශීය ණය වල ඇතිවූ රුපියල් දශලක්ෂ 268 ක සැළකිය යුතු පහළ වැටීම මෙම මූල්‍ය මාර්ගයන් තුනෙහි වැඩි වීම මගින් පියවනු ලැබිණ.

1970/71 වර්ෂයේදී අය වැය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 231 ක් විය. මෙය මූලික වශයෙන් ඇස්තමේන්තු කළ සංඛ්‍යාව වූ රුපියල් දශලක්ෂ 97 ට වඩ වැඩි වුවද, 1969/70 තත්ත්වය හා සසඳන විට එය සැළකිය යුතු දියුණුවක් පෙන්නුම් කරයි. මුදල් වර්ෂයේ අවසානයේදී ශුද්ධ රාජ්‍ය ණය රුපියල් දශලක්ෂ 8108 ක් වූ අතර, එය 1969/70 මුදල් වර්ෂය අවසානයේ සිට රුපියල් දශලක්ෂ 871 කින් වැඩි වීමකි.

1971/72 මුදල් වර්ෂයේ (මාස 15) ආදයම සහ වියදම පිළිවෙළින් රුපියල් දශලක්ෂ 3945 ක් සහ රුපියල් දශලක්ෂ 5743 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පුනරාවර්තන වියදම් රුපියල් දශලක්ෂ 4432 කින් සහ ප්‍රාග්ධන වියදම් රුපියල් දශලක්ෂ 1186 කින් වියදම සමන්විත වේ. පළමුවරට, අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 125 ක ශුද්ධ ගෙවීමක් වෙනුවෙන් වෙන්කිරීමක් කර තිබේ. අය-වැය කෙරෙහි මෙම ගිණුම් කටයුතු වලින් සිදුවන බලපෑම තුලනාත්මක ලෙස මීට පෙර සැළකුණද. මෑත වර්ෂවලදී ඇත්ත-වශයෙන්ම මෙම ගිණුම්වලින් සැහෙන පමණ පිටට ගෙවීම් සිදුවී තිබේ මෙම හේතුව නිසා මුලින් ඇස්තමේන්තු කරනු ලැබූ ප්‍රමාණයට වඩා අවසාන අය වැය හිඟය විශාල වී තිබුණ අතර, මූලික ඇස්තමේන්තුවල අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වෙන් කිරීමක් කර නොතිබූ බැවින් එම හිඟයන් නිසැකයෙන්ම රාජ්‍ය මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම ඉහළ නැංවීමට හේතු විය. අය වැය කථාවෙහි අපේක්ෂිත රුපියල් දශලක්ෂ 1513 ක අය වැය හිඟය රුපියල් දශලක්ෂ 1798 දක්වා ඉහළ නැගීමට හේතු වූ අය-වැය යෝජනා පිළිබඳ සමහර වෙනස්කිරීම්[2] සංඛ්‍යා සටහනෙහි දැක්වෙන මූලික ඇස්තමේන්තු සැළකිල්ලට ගෙන ඇත. මෙම අය-වැය හිඟය පියවිය යුතු වන්නේ රුපියල් දශලක්ෂ 1086 ක දේශීය වෙළඳපොළ ණය ගැනීම් සහ රුපියල් දශලක්ෂ 712 ක විදේශීය ණය ගැනීම් මගිනි. මේ අනුව අය-වැයෙහි ප්‍රසාරණාත්මක බලපෑම, අය-වැය ලේඛනයේ ඇතුළත් වූ බැංකු ක්‍රම යෙන් ණය ගැනීම් රුපියල් දශලක්ෂ 161 ක් ද අඩංගුව රුපියල් දශලක්ෂ 446 වනු ඇත.

පසුගිය දස වර්ෂය තුළදී (1962/63 වර්ෂය හැර) වියදමේ මෙන්ම ආදයමේද වේගවත් ඉහළයාමක් ඇතිවී තිබෙන බව 11 (ඊ) 1 සංඛ්‍යා සටහනින් පෙනේ. කෙසේ වෙතත්, ආදයමේ ඉහළයාම, වියදමේ ඉහළයාමට සමාන වේගයකින් සිදුවී නොමැත. 1961/62 සිට රජයේ අයනාරය 74% කින් ඉහළ ගොස් ඇති අතර, වියදමේ වැඩිවීම 95% ක් වී තිබේ. සම්පත් සංවලනය කිරීමේ උත්සාහය විශේෂයෙන් 1967/68 වර්ෂයේ සිට සැළකියයුතු වුවද, එම වර්ෂයේ සිට මුළු වියදමේ වැඩිවීම ආදයමේ ඇති වූ සැළකිය යුතු වැඩිවීම සමඟත් කර තිබේ. මේ නිසා, අය වැය හිඟයේ අනුක්‍රමික වැඩිවීමක් මෙම වර්ෂයන් තුළදී (නැවතත් 1962/63 වර්ෂය හැර) ඇතිවී තිබේ. පසුගිය වර්ෂ පහ තුළදී මෙම හිඟයන්ගේ සාමාන්‍ය මට්ටම රුපියල් දශලක්ෂ 999 ක් වූ අතර, ඊට පෙර වර්ෂ 5 තුළදී එහි සාමාන්‍ය මට්ටම රුපියල් දශලක්ෂ 532 ක් විය.

---

1. 155 පිටුවේ ඇති පාද සටහන බලන්න
2. මෙම වෙනස්වීම් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සඳහා 182 පිටුවේ 1971-72 අය වැය ලේඛනය පිළිබඳ කොටස බලන්න

රාජ්‍ය මූල්‍ය කටයුතුවල පිළිබඳ

ශීර්ෂ	1961/62	1962/63	1963/64	1964/65
1. ආදායම ..	1,621	1,593	1,759	1,816
2. වියදම	2,122	2,032	2,278	2,337
2. 1 පුනරාවර්තන වියදම (ආ) ..	1,626	1,643	1,891	1,893
2. 2 ප්‍රාග්ධන වියදම (ඇ) ..	481	403	403	471
2. 3 අත්තිකාරම ගිණුම් හා අනෙකුත් ..	15	– 14	– 16	– 28
3. අයවැය හිඟය ..	501	439	519	520
4. ණය ආපසු ගෙවීම (ඇ) ..	45	47	57	90
5. ශුද්ධ මූල්‍ය හිඟය ..	456	392	462	430
6. අයවැය හිඟය පියවීම ..				
6. 1 වෙළඳ පොළ නොවන ණය ගැණුම් ..	105	– 34	– 2	50
6. 2 දේශීය වෙළඳ පොළ ණය ගැණුම් ..	374	372	368	334
6. 3 විදේශීය මුදල් ..	63	100	108	117
6. 4 මුදල් ශේෂවල අඩුවීම ..	– 40	...	45	20
7. ශුද්ධ මූල්‍ය හිඟය පියවීම .				
7. 1 දේශීය වෙළඳ පොළ නොවන ණය ගැණුම් ..	105	– 34	– 2	50
7. 2 දේශීය වෙළඳ පොළ ණය ගැණුම් ..	339	333	323	261
7. 3 විදේශීය මුදල් ..	53	92	95	100
7. 4 මුදල් ශේෂවල අඩුවීම ..	– 40	...	45	20
8. රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම ..	190	162	163	35
9. නොබෙරූ රාජ්‍ය ණය (ශුද්ධ) . ..	2,689	3,065	3,436	3,772

(අ) II වැනි පරිශිෂ්ඨයේ 31 හා 33 වැනි සංඛ්‍යා සටහන්හි සා සටහන්වල දක්වා ඇති හේතු නිසා මෙහි සංඛ්‍යා රජයේ ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා වලින් වෙනස් වේ.

(ආ) 1968/69 සිට ප්‍රාග්ධන වියදම් වශයෙන් වර්ග කරන ලද නිදන් අරමුදල් ගෙවීම්, සෘජු ණය බෙදීමේ හා ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වලට ගෙවනු ලබන දායක දීමනා, සංසන්දනය කිරීමේ අවශ්‍යතා සඳහා පුනරාවර්තන වියදමට පවරා ඇත.

සම්පිණ්ඩනය - 1960/61 සිට 1971/72 දක්වා(අ)

රුපියල් දශලක්ෂ

1965/66	1966/67	1967/68	1968/69	1969/70	1970/71		1971/72 මුල් ඇස්තමේන්තු	
					මුල්	තාවකාලික	12 මාසය* කාලච්ඡේදය	15 මාසය කාලච්ඡේදය
1,833	**1,955**	**2,156**	**2,497**	**2,736**	**2,878**	**2,815**	**3,156**	**3,945**
2,515	**2,677**	**3,007**	**3,445**	**3,886**	**4,058**	**4,143**	**4,594**	**5,743**
1,976	2,012	2,321	2,544	2,873	3,089	3,225	3,546	4,432
528	625	714	852	812	969	810	949	1,186
10	42	– 29	49	201	—	108	100	125
682	**723**	**850**	**947**	**1,150**	**1,180**	**1,327**	**1,438**	**1,798**
116	117	135	160	214	249	244	307	384
566	**607**	**716**	**788**	**936**	**932**	**1,083**	**1,131**	**1,414**
112	72	10	52	16	—	140	—	—
498	418	630	358	815	542	693	869	1,086
154	256	247	426	345	638	370	570	712
– 82	– 22	– 36	111	– 26	—	123(ඉ)	—	—
112	72	10	52	16	—	140	—	—
418	348	552	271	720	440	585	736	920
118	209	190	354	226	491	235	395	494
– 82	– 22	– 36	111	26	—	123	—	—
122	**56**	**267**	**179**	**428**	**97**	**231(ඉ)**	**357**	**446**
4,268	4,782	5,689	6,239	7,237	ල.නො.	8,108	ල.නො.	ල.නො.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ජාතික සංවර්ධන සංචිතයෙන් වැයවූ වියදම ඇතුළත්වේ.

(ආ) නිදන් අරමුදල් ගෙවීම, ණය ආපසු ගෙවීම් හා ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වලට ගෙවනු ලබන දායක දීමනා ඇතුළත් නැත.

(ඉ) 154 පිටුවේ ඇති පාද සටහන බලන්න.

* අනුපාත පදනමක් මත.

පසුගිය වර්ෂ දහය තුළදී ආදයම වර්ෂයකට 6·3% ක (සංයුක්ත) සාමාන්‍ය මට්ටමකින් වැඩිවී තිබෙන අතර, වියදම වාර්ෂිකව 7·7% ක (සංයුක්ත) සාමාන්‍ය මට්ටමකින් වැඩිවී ඇත. (පුනරාවර්තන වියදම 7·9% ක් සහ ප්‍රාග්ධන වියදම 5·9% ක්). පසුගිය වර්ෂ පහ තුළදී වාර්ෂික වැඩිවීමේ සාමාන්‍ය අනුපාතිකය මීටත් ඉහළ විය. එම කාලවෙදය තුළදී ආදයම වර්ෂයකට 9·5% කින් ඉහළ ගිය අතර, වියදම වර්ෂයකට 11·5% කින් ඉහළ ගියේය. (පුනරාවර්තන වියදම සියයට 12·6 ක් හා ප්‍රාග්ධන වියදම සියයට 6·7) රජයේ ආදයමේ ඇතිවූ ඉහළ වැඩිවීම් අනුපාතිකයට ප්‍රතිපක්ෂව පසුගිය වර්ෂ පහ තුළදී වියදමද ඉහළ වෙගයකින් වර්ධනය වී තිබෙන බව මෙසේ දැකීමට පුළුවන පසුගිය වර්ෂ පහ තුළදී, මුළු වියදමේ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ පුනරාවර්තන වියදම වන බවද සඳහන් කළ යුතුවේ. 1968/69 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 852 ක් වූ ප්‍රාග්ධන වියදම ඇත්තවශයෙන්ම එම වර්ෂයේ සිට පහළ බැස තිබේ.

අය-වැය හිඟයන්හි මෙම අනුක්‍රමික වැඩිවීම දේශීය සහ විදේශීය මූලයන්ගෙන් කරනු ලැබූ වැඩිවූ ණය ගැනීම් මගින් පියවාගෙන තිබේ. මෑත කාලයේදී අය-වැය හිඟයන් පියවීමේදී විදේශීය සම්පත් විශාල ලෙස ආධාරකාරී වී තිබේ. ඒවායේ දායකත්වයන් 1961/62 වර්ෂයේ සිට අනුක්‍රමයෙන් වැඩිවී තිබෙන අතර, 1968/69 මුදල් වර්ෂයේදී එය මුළු අය වැය හිඟයෙන් සියයට 45 ක මට්ටමට ළඟා විය. එම වර්ෂයේ සිට, ඒවායේ දායකත්ව අනුපාතය ක්‍රමයෙන් අඩුවී තිබෙන අතර, 1970/71 මුදල් වර්ෂයේදී එය සියයට 28 ක් පමණ විය. මෙම පහළ වැටීම, මූලික වශයෙන් විදේශ ආධාර ලැබීම් පහළ වැටීමේ (මූලික වශයෙන් අපේක්ෂිත ලැබීම් සමඟ විශේෂයෙන් සළකා බලන විට) හේතුව නිසාද වේ. 1969/70 සහ 1970/71 වර්ෂයන්හිදී අය වැය කාර්‍යයන් සඳහා ප්‍රයෝජනයට ගත් දළ විදේශීය සම්පත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 345 ක් සහ රුපියල් දශලක්ෂ 370[1] ක්වූ නමුත්, මූලික වශයෙන් අපේක්ෂිත ප්‍රමාණයන් පිළිවෙලින් එම වර්ෂ දෙක සඳහා රුපියල් දශලක්ෂ 502 ක් සහ 638 ක් විය. 1971/72 දී (මාස 12 ක්) අපේක්ෂිත විදේශීය ණය රුපියල් දශලක්ෂ 570 ක් විය. විදේශීය මූල්‍ය පිළිබඳ සාපේක්ෂ වැදගත්කමෙහි ඇතිවූ මෙම පහළ බැසීම අය-වැය හිඟයන් පියවීම උදෙසා දේශීය සම්පත් ලබාගැනීමහි වැඩිවීම දෙසට විතැන්වීමක් නිරූපණය කරයි. දේශීය ස්ථායිතාව ලබාගැනීමේ සහ විදේශීය අසමතුලිතතාව අඩුකිරීමේ අරමුණින්, පසුගිය අය-වැය ලේඛනයන් දෙක එසේ කිරීමට දැඩි ප්‍රයත්නයක් ගෙන තිබේ.

අපේක්ෂිත විදේශීය මූල්‍යයෙහි ඇතිවූ සැලකියයුතු අඩුවීමට පරස්පරව 1970/71 වර්ෂයේදී මූල්‍ය කටයුතු වලින් ඇතිවන ප්‍රසාරණාත්මක බලපෑමේ සැලකිය යුතු වැඩිවීම දේශීය බැංකු නොවන ණය ගැනීම් සහ පරිපාලන ණය ගැනීම් පිළිබඳව වැඩි පෙළඹ-වීමක් ඇති කරනු ලැබීය. 1970/71 වර්ෂයේදී මුළු දේශීය වෙළෙඳපොළ ණය ගැනීම් ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 693 න් රුපියල් දශලක්ෂ 586 ක් බැංකු නොවන මූලයන්ගෙන් ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී පරිපාලන ණය ගැනීම් රුපියල් දශලක්ෂ 140 ක් විය. දේශීය සහ විදේශීය යන මූලයන් දෙකෙන්ම කළ මෙම ණය ගැනීම්, 1970/71 වර්ෂය අවසානය වනවිට රුපියල් දශලක්ෂ 871 කින් වැඩිවූ නොබෙරන ලද ශුද්ධ ණයෙහි පිළිබිඹුවේ. මෙම වැඩිවීම සමන්විතවූයේ, දේශීය ණය රුපියල් දශලක්ෂ 655 කින් සහ විදේශීය ණය රුපියල් දශලක්ෂ 216 කිනි. සමාලෝචිත වර්ෂය අවසානයේදී, නොබෙරන ලද ශුද්ධ රාජ්‍ය ණය රුපියල් දශලක්ෂ 8108 ක් වූ අතර, මෙය දේශීය ණය රුපියල් දශලක්ෂ 6340 කින් සහ විදේශීය ණය රුපියල් දශලක්ෂ 1768 කින්ද සමන්විත විය.

පහත II (ඊ) 2 සංඛ්‍යා සටහන, 1970/71 වසරට අදළ මූලික ඇස්තමේන්තු සමග පසුගිය දශවසර තුළ වර්තන ගිණුමේ අතිරික්තයන් හෝ හිඟයන් සහ ප්‍රාග්ධන වියදම් සම්බන්ධ දත්ත යන් පෙන්වයි. තවද, එම කාලවෙදය තුළදීම දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂව රජයේ ආදයම සහ පුනරාවර්තන වියදම හැසිරී ඇති ආකරය ඉන් පෙන්නුම් කෙරේ.

1· 154 පිටුවේ පාද සටහන බලන්න.

2· දේශීය බැංකු නොවන වෙළඳපොළ මූලාශ්‍රයන්ගෙන් ණය ගැනීම් පිළිබඳ සුළුල් විස්තරයක් සඳහා 168 පිටුවේ එන 'රාජ්‍ය ණය, පිළිබඳ කොටස බලන්න.

II (ඊ) 2 සංඛ්‍යා සටහන

ආදායම, වියදම සහ වර්තන ගිණුමේ ඉතුරුම්

ශීර්ෂ	1961/62	1962/63	1963/64	1964/65	1965/66	1966/67	1967/68	1968/69	1969/70	1970/71 තාවකාලික	1971/72[1] මුල් ඇස්ත මෙන්තු
1. ආදායම රු. දශලක්ෂ ..	1621	1593	1759	1816	1833	1955	2156	2497	2736	2815	3156
2. පුනරාවර්තන වියදම, ණය ආපසු ගෙවීම අඩුකොට[2] රු. දශලක්ෂ ..	1596	1582	1818	1775	1870	1937	2157	2433	2860	3089	3358
3. වර්තනගිණුම් අතිරික්තය (+) හිඟය (−) රු. දශ ලක්ෂ ..	25	11	−59	41	−37	18	−1	64	−124	−274	−182
4. ප්‍රාග්ධන වියදම[3] රු. දශලක්ෂ ..	526	450	460	561	644	742	849	1012	1026	1054	1493
5. දල ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ආදායම ..	24·9	23·4	24·1	24·2	23·7	23·6	21·8	23·2	23·5	23·8	—
6. දල ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පුනරාවර්තන වියදම ..	24·5	23·3	24·9	23·7	24·3	23·4	21·8	22·6	24·6	26·1	—

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1. දෙලොස් මසක කාලවශේදය සඳහා සමානුපාතික ප්‍රමාණයන්.
2. අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් ශුද්ධ ලැබීම් හෝ ගෙවීම් සඳහා ගලපා ඇත.
3. රාජ්‍ය ණය සෘජු ආපසු ගෙවීම් සහ නිදන් අරමුදල් දායකත්වයන් ඇතුලත්ව.

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහන, පසුගිය දශකය පුරා වර්ධනය වී තිබෙන ගැටළුවෙහි පුළුල් ස්වරූපය සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කරයි. පසුගිය පස් වසර තුළදී ප්‍රාග්ධන වියදමේ (ණය ආපසු ගෙවීම ඇතුළත්ව) සාමාන්‍ය මට්ටම ඊට ප්‍රථම පස් වසරේ පැවති මට්ටම මෙන් ආසන්න වශයෙන් දෙගුණයකින් එනම්, රුපියල් දශලක්ෂ 528 සිට රුපියල් දශලක්ෂ 936 දක්වා වැඩිවී තිබේ. සංඛ්‍යා සටහනේ පෙන්නුම් කරන ප්‍රාග්ධන වියදමෙහි වැඩිවන අනුපාතයක් නිරූපණය කරන්නේ ණය ආපසු ගෙවීම් බව සත්‍යයකි. කෙසේ වුවද, ණය ආපසු ගෙවීම් බැහැර කළ විට ප්‍රාග්ධන වියදම්වල උපනතිය මූලික වශයෙන් එසේම පවතී. පසුගිය පස් වසර තුළදී රජයේ ප්‍රාග්ධන වියදම ආසන්න වශයෙන් දෙගුණ වීමත් සමඟ රජයේ ඉතුරුම් නිරූපණය කරන වර්තන ගිණුම් අතිරික්තය වඩා මෑත වර්ෂ වලදී සැළකිය යුතු හීනයක් වාර්තා කරතිබේ. අනෙකුත් වසරවලදී වාර්තා ගතවූ අතිරික්තයන්ද එක්කෝ ඉතා කුඩා හෝ නැතිනම් නොසැළකියයුතු තරම් වේ පසුගිය දස වසර පුරාම වර්තන ගිණුමේ ශේෂයන් සහ අතිරික්තයන් අක්‍රමවත් ආකාරයකින් වෙනස් වී ඇති බැවින් ඒ පිළිබඳ උපනතියක් විග්‍රහ කිරීම අපහසුය. කෙසේවුවද, පසුගිය පස් වසර තුළදී, සැළකිය යුතු අයුරින් වර්ධනයවූ ප්‍රාග්ධන වියදම පියවීමට ප්‍රමාණවත් වර්තන ගිණුම් අතිරික්තයක් උත්පාදනය කිරීමට රජයට නුපුළුවන්විය.

තවද, 1967/68 වසරේ සිට පුනරාවර්තන වියදම්වල වර්ධන අනුපාතිකය දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකයට වඩා දිගටම වැඩිවෙමින් පවතී. පසුගිය දස වසර මුළුල්ලේම රජයේ ආදයම් හා දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතය සියයට 23 ට ආසන්නව පැවති අතර, 1967/68 සිට සුළු ඉහළ නැඟීමේ උපනතියක් දක්වයි. රජයේ ආදයම 1964/65 න් පසුව රුපියල් දශලක්ෂ 1,000 කින් ඉහළ ගොස් ඇති නමුදු, දියුණුවන රටවල් බොහොමයක තත්ත්වයන්ට සාපේක්ෂව ඉහළ බදු-දළ ජාතික නිෂ්පාදිත අනුපාතයක් පවත්වා ගෙන යාමට ලංකාව සමත්වී තිබේ. එසේවුවද, මෙම ඉහළබදු මට්ටම රජයේ ඉතුරුම් අවශ්‍යතාවය වැඩි කරයි. වැය කළ හැකි ආදයමේ පහළ යාම හේතුකොට ගෙන පෞද්ගලික ඉතුරුම් හැකියාව අඩු කරනු ලබන ප්‍රමාණයට රජයේ ඉතුරුම්වල වැදගත්කම වැඩිවෙමින් පවතී. තවද, 1971/72 වසරේ අනිවාර්ය ඉතුරුම් ක්‍රමය මගින් වැය කළ හැකි ආදයම මසකට රුපියල් 2,000/- කව සීමා කිරීමට බලාපොරොත්තු වේ. සංක්‍රාම වියදම් පෞද්ගලික ඉතුරුම් වලට වඩා පෞද්ගලික පරිභෝජනය ධෛර්යමත් කරන්නක් නිසාද, රජයේ ඉතුරුම් වැදගත් වේ. රජයේ මුළු වර්තන වියදමෙන් අඩක්ම වාගේ සංක්‍රාම ගෙවීම්වලින් සමන්විත වන අතර, ඉන් අඩක් දළ ආහාර සහනාධාරය උදෙසා වැයවන අතර ශේෂය විශ්‍රාම වැටුප්, රාජ්‍ය ණය පොලී සහ සහන ආදිය සඳහා වේ.

ලංකාව මුහුණපාන අය-වැය ප්‍රශ්නයේ එක් වැදගත් ලක්ෂණයක් නම්, රජයේ ආදයම් සහ වියදම් ප්‍රතිපත්ති පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී අතිශයින් වැදගත් බවට පත්වීමය. සැලැස්ම අවධාරණය කරන පරිදි, ''සේවා නියුක්තිය සහ රටේ ධනය යන දෙකම වැඩිකිරීමට හේතුවන පරිදි ආදයම් නුපදවන වියදම් කෙරෙන්, ආදයම් උපදවන ආයෝජන කෙරෙහි රජයේ වියදම් ස්වරූපය අනිවාර්යයෙන්ම වෙනස් කිරීමට අවශ්‍යය.''[1] එබඳු වෙනස් කිරීමක් යනුවෙන් හැඟෙනුයේ, රජයේ ආදයම එහි වර්තන වියදමට වඩා වැඩි කිරීමය. රජයේ වර්තන ගිණුමේ අතිරික්තය 1972 දී රුපියල් දශලක්ෂ 112 සිට 1976 දී රුපියල් දශලක්ෂ 383 දක්වා වැඩිවෙයයි ඇස්තමේන්තු කොට තිබේ.[2] මෙම රජයේ ඉතුරුම් මගින් 1972 සඳහා සැළසුම් කළ රුපියල් දශලක්ෂ 2565 ක් වන දළ ආයෝජනයෙන් සියයට 4 සිට ක්‍රමානුකූලව ඉහළයමින් 1976 සඳහා සැලසුම් කරන ලද රුපියල් දශලක්ෂ 3394 ක් වන ආයෝජනයෙන් සියයට 11 ක් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. පසුගිය අත්දැකීම් අනුව විමසන කළ වර්තන ගිණුමේ එබඳු ප්‍රමාණවත් අතිරික්තයන්

---

1. පස් අවුරුදු සැලැස්ම, පිටුව 27.
2. කෙසේ නමුත්, මෙම වර්තන ගිණුමේ අතිරික්තයන්, ආදයම් හා වියදම් පිළිබඳ සංශෝධිත ආර්ථික හා කාර්යාත්මක වර්ගීකරණය මත පදනම් වී තිබේ.

ඇති කිරීමට නම්, අය-වැය ප්‍රතිපත්තියේ මූලික වෙනසක් කිරීමට අවශ්‍ය වේ. එය මූලික වශයෙන්ම රදා පවතින්නේ ආදයම වැඩි කිරීමට ඇති හැකියාව සීමා කරන සීමාවන් තුළ රැඳෙමින් වර්තන වියදම් කපාහැරීමට රජයට ඇති හැකියාව උඩවන අතර මෙය ප්‍රමාණවත් අතිරික්තයක් ඇති කිරීමට ගතයුතු අවශ්‍ය පියවරකි. එසේම, සැලසුම් කාලපරිච්ඡේදය තුළදී ආදයමේ ඇතිවන වැඩිවීමෙන් කොටසක් රජයේ ආදයමට හරවා ගැනීම සඳහා අනුගමනය කරන රාජ්‍ය මූල්‍ය හා අයබදු ප්‍රතිපත්තිද එයට බලපායි. 1970/71 සහ 1971/72 වර්ෂවල අය-වැය ලේඛණ මගින් පුළුල් වශයෙන් මෙම අරමුණු ඉෂ්ඨ කර ගැනීමට දැඩි උත්සාහ යන් දරා ඇති නමුත්, සමහර අය-වැය යෝජනා වෙනස් කිරීමේ සහ ක්‍රියාත්මක නොකිරීමේ[1] ප්‍රතිඵලයක් වශයෙන් 1971/72 වසරේ අය-වැය ලේඛනයෙන් රුපියල් දශලක්ෂ 57 ක අතිරික්තයක් ඇති කිරීමට මූලික වශයෙන් බලාපොරොත්තු වූ වර්තන ගිණුම දැන් රුපියල් දශලක්ෂ 229 ක හිඟයකට (මාස 12 ක් සඳහා රුපියල් දශලක්ෂ 182) හැරී තිබේ.

ලංකාව මුහුණපාන අය-වැය ප්‍රශ්නයට මූලික වශයෙන් හේතුවී ඇත්තේ ඉහළ බදු-දළ ජාතික නිෂ්පාදිත අනුපාතය සහ පුනරාවර්තන වියදම් වැඩි කිරීමට තුඩුදුන් විශේෂයෙන්ම ආහාර සහනාධාරය සහ අධ්‍යාපනය ඇතුළත් සමාජීය ප්‍රතිපත්තීන්ය. ලංකාවේ සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් සිදුවූයේ නම් මෙම වියදම් පියවා ගැනීමට හැකිවන අතර, ඊට අතිරේකව අර්ථ ක්‍රමයේ ඉහළ වර්ධන වේගයක් ඇතිකර ගැනීමට සහ පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය අරමුදල් එක්රැස් කරගැනීමට හැකිවනු ඇත. අර්ථ ක්‍රමයේ ව්‍යුහාත්මක ප්‍රශ්නයන් සහ විදේශීය විනිමය ප්‍රශ්න අත්හරිමින් සලකනවිට ආයෝජනය කැප කොට පරිභෝජනය සපුරා ගැනීම සඳහා රජයේ වියදම් වර්ධනය යොමුවනතාක්කල් වර්ධන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දේශීය සම්පත් උත්පාදනය කළ නොහැක. තවද, පසුගිය වසර කිහිපයේදී දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය අනුපාතිකයට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම්වල වර්ධන අනුපාතිකය සමඟ ඉතුරුම් සීඝ්‍ර වේගයකින් වැඩෙන තුරු මුළු ඉල්ලුම ස්ථාවර වර්ධනයට මෙන්ම ගෙවුම් ශේෂය තුලනයටද අහිතකර ලෙස වර්ධනය වේ. එම නිසා පුනරාවර්තන වියදම්වල වර්ධනය පහත් මට්ටමක රඳවා ගනිමින් වර්තන ගිණුමේ අතිරික්තයන් ඇතිකරන පරිදි හදිසි පියවරයන් ගැනීම අත්‍යවශ්‍ය වී ඇත.

පසුගිය වසර කිහිපයේ රජයේ ලැබීම් සහ ගෙවුම් පිළිබඳ වූ මිළඟ විග්‍රහය 1969 වාර්ෂික වාර්තාවේ පළවූ රජයේ ගනුදෙනු පිළිබඳ වූ ස ශෝධිත ආර්ථික හා කායික්‍යාත්මක වර්ගීකරණය[2] මත පදනම් වී ඇත. රජයේ ආදයමේ හා වියදමේ වර්තන හා ප්‍රාග්ධන සංරචකයන් ලබාගැනීමට රජයේ ගිණුම්වල පෙන්වන ආදයම් හා වියදම් දත්තයන්ගේ ගැලපීම් කිහිපයක් කර තිබේ. 1971/72 සඳහා වූ රජයේ ආදයම් ඇස්තමේන්තු ආර්ථික හා කායික්‍යාත්මක වර්ගීකරණය මත ප්‍රථම වරට පදනම් වී ඇති බව සැළකිය යුතුය,[3] 1966/67 න් පසු වසර සඳහා රජයේ ගිණුම්වල පළකරන ලද ආදයම් සංඛ්‍යාවන් හා වියදම් සංඛ්‍යාවන් අතර සැසඳීමක් පහත II (ඊ) 3 වෙනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

---

1. අය වැය යෝජනාවන්ගෙන් රුපියල් දශලක්ෂ 130·6 ක (මාස 12 ක් සඳහා රුපියල් දශලක්ෂ 104·5) අතිරික්තයන් පෙන්වුවද අපේක්ෂිත ඇස්තමේන්තුවලට සමානුපාතික වර්තන ගිණුමේ රුපියල් දශලක්ෂ 155·7 ක හිඟයක් (මාස 12 ක් සඳහා රුපියල් දශලක්ෂ 124·6) වනු ඇත. වැඩි විස්තර සඳහා "1971/72 අය වැය ලේඛනය" 182 පිටුව බලන්න.
2. ''ලංකාණ්ඩුවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ආර්ථික හා කායික්‍යාත්මක වර්ගීකරණය පිළිබඳ සටහනක්'' යන්න බලන්න. 1969 වාර්ෂික වාර්තාවේ 188 වෙනි පිට.
3. අය වැය කෙටුම්පත් සටහනෙහි තුන්වෙනි පිටුව බලන්න

II (ඊ) 3 වැනි සංඛ්‍යා සටහන

රජයේ ආදායම සහ වියදම - 1966/67 සිට 1971/72 දක්වා සැසඳුම

රුපියල් දශලක්ෂ

ශීර්ෂ	1966/67	1967/68	1968/69	1969/70	1970/71 මුල් ඇස්ත-මේන්තු	1970/71 තාවකාලික	1971/72(උ) මුල් ඇස්ත මේන්තු
1. ආදායම (ශීර්ෂ 1 සිට 16 දක්වා)	1,954·8	2,156·4	2,497·3	2,736 4	2,878·0	2,815·3	3,944·5
එකතු කිරීම: ආහාර අලෙවි-යෙන්ලත් ලාභ (අ) ..	263·6	282·4	296·4	248·0	155·3	96·3	—
අඩු කිරීම : සහල් පිහිටාධාර බද්ද (ආ) ..	0·3	1·9	3·1	3·5	3·0	2·7	—
2. මුළු ආදායම ..	2,218·1	2,436 9	2,790·6	2,980·9	3,030·3	2,908·9	3,944·5
3. පුනරාවර්තන වියදම .. (1, 2, 4 හා 6 වැනි සම්මත) (ඇ)	1,895·3	2,186·2	2,348·2	2,658·9	2,912·7	2,980·5	4,172·9
අඩු: ශුද්ධ ආහාර පිහිටාධාරය (ඈ) ..	193·0	297·5	334·5	337·0	464·0	508·0	—
එකතු: ආහාර අලෙවියෙන් පාඩු (ඉ) ..	465·5	578·7	625·2	574·3	614·4	601·4	—
අඩු: පුනරාවර්තන සම්මතවල ප්‍රාග්ධන ශීර්ෂ (ඊ) ..	94·1	114·0	116·0	124·6	113·8	108·6	141·0
එකතු: ප්‍රාග්ධන සම්මතවල වර්තන ශීර්ෂ (උ) ..	23·2	39·1	58·2	53·5	60·0	118·7	128·5
4. වර්තන ගෙවීම් ..	2,096,7	2,392·4	2,617·1	2,825·0	3,009·3	3,084·0	4,160·4
5 ප්‍රාග්ධන වියදම් .. (3, 5, හා 7 වැනි සම්මත) (ඇ)	624·7	714·4	852·0	812·0	1,140·7	809·7	1,481·8
එකතු: පුනරාවර්තන සම්මතවල ප්‍රාග්ධන ශීර්ෂ (ඊ) ..	94·1	114·0	116·0	124·6	113·8	108·6	141·0
අඩු: ප්‍රාග්ධන සම්මතවල වර්තන ශීර්ෂ (උ) ..	23·2	39·1	58·2	53·5	60·0	118·7	128·5
6. ප්‍රාග්ධන ගෙවීම් ..	695·4	789·2	909·8	883·1	1,194·5	799·6	1,494·3

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) පිටි, සීනි සහ ඇතැම් අනෙකුත් ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලාභ — II (ඊ) 8 සංඛ්‍යා සටහන බලන්න.

(ආ) වර්ෂයකට රුපියල් 12,000 කට වැඩි තක්සේරු ගත ආදායම් ලබන සහල් සලාක පොත් හිමියන් සහ ඔවුන්ගේ යැපෙන්නන් අඩංගුව වර්ෂයකට රු 52 ක බද්දක් අය කෙරිණ.

(ඇ) නිදන් අරමුදල් දායක දීමනා, රාජ්‍ය ණය පිළිබඳ සාජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර සංවිධානවලට විශේෂ ගෙවීම් 1967/68 මුදල් වර්ෂය දක්වා පුනරාවර්තන වියදම් වලින්ද, 1968/69 සිට ප්‍රාග්ධන වියදම් වලින්ද ඉවත් කෙරිණ. 1969/70 සහ 1970/71 සඳහා පුනරාවර්තන වියදම පිළිබඳ (තාවකාලික) දත්තයනට විදේශීය ණය ආපසු ගෙවීම් හා සම්බන්ධ වූ වි. වි. හි. ස මිලදී ගැනීම් වූ රුපියල් දශලක්ෂ 39·2 සහ සමිහර රාජ්‍ය සමාගතනවලට වි·වි·හි·ස. ආපසු ගෙවීම් වූ රුපියල් දශලක්ෂ 30·9 ඇතුළත් නැත. පසු කී සංඛ්‍යාව ප්‍රාග්ධන වියදමට ඇතුලත් වී ඇත.

(ඈ) ලංකාණ්ඩුවේ ගිණුම්වල දක්වෙන සීනි, පිටි, හා ඇතැම් වෙනත් භාණ්ඩයන් අලෙවියෙන් ලද ලාභ හැර සහල් සහ රතුලූණු පිළිබඳ නිෂ්පාදක හා පාරිභෝගික පිහිටාධාරයෙන් ලැබෙන ලැබීම්වලින් සංයුක්තවේ.

(ඉ) සහල්, රතුලූණු සහ වෙනත් ආහාර මිලදී ගැනීමෙන් හා විකිණීමෙන් වූ අලාභ· II (ඊ) 8 සංඛ්‍යා සටහන බලන්න.

(ඊ) ප්‍රාග්ධන ක්‍රියාවලියන් නඩත්තු කිරීමේ වියදම් සහ ප්‍රාග්ධන ක්‍රියාවලියන්හි නිරත පුද්ගලයන්ගේ වැටුප් වලින් ප්‍රධාන වශයෙන් සමන්විත වී ඇත.

(උ) ආරක්ෂණ වියදම්වලින් හා ප්‍රාග්ධන සම්මතයන් යටතේ දක්වෙන වර්තන සංක්‍රාමවලින් ප්‍රධාන වශයෙන් සමන්විත වී ඇත.

(ඌ) මාස 15 කාලච්ඡේදයක් සඳහා (71–10–1 සිට 72–12–31 දක්වා). 1971/1972 මූලික අයවැය ඇස්තමේන්තු අනුව ආහාර විකිණීමෙන් ලත් ලාභය දක්වා ඇත්තේ ආදායම යටතේ ලැබීමක් ලෙසින් වන අතර පිහිටා-ධාර දක්වා ඇත්තේ වියදම යටතේ දල පදනමක් උඩය. එමනිසා 1971/72 සංඛ්‍යා සැසඳුමෙහි මෙම ලක්ෂණයන් අඩංගු නොවේ.

2. ආදයම

පසුගිය වර්ෂ හතර තුළදී නිරන්තරවම ඉහළ නැගීම් වලින් යුක්තවූ රජයේ ආදයම් ලැබීම් 1970/71 මුදල් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 72 කින් නැතහොත් සියයට 2 කින් අඩු විය. මෙය 1967/68, 1968/69, සහ 1969/70 යන මුදල් වර්ෂ වලදී පිළිවෙලින් ඇතිවූ රුපියල් දශලක්ෂ 219 ක නැතහොත් සියයට 10 ක, රුපියල් දශලක්ෂ 354 ක නැතහොත් සියයට 14 ක සහ රුපියල් දශලක්ෂ 190 ක නැතහොත් සියයට 7 ක ඉහළ යාම්වලට ප්‍රතිවිරුද්ධ වේ.

පසුගිය වර්ෂ නවයෙහි රජයේ ලැබීම් පිළිබඳ සංඛ්‍යාත්මක විස්තර 1971/72 වර්ෂය සඳහා වූ මූලික ඇස්තමේන්තු සමග දෙවන පරිශිෂ්ඨයෙහි 36 වෙනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. පසුගිය මුදල් වර්ෂ දෙකේ රජයේ ලැබීම් පිළිබඳ සම්පිණ්ඩනයක් 1970/71 සහ 1971/72 යන මුදල් වර්ෂයන්ට අදළ මූලික ඇස්තමේන්තුද සමග II (ඊ) 4 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

පසුගිය වර්ෂ වලදී මෙන්ම, 1970/71 වර්ෂයේදීද රුපියල් දශලක්ෂ 2909 ක්වූ රජයේ මුළු ආදයමින්, ඉතා විශාල කොටසක් සමන්විත වූයේ වර්තන ලැබීම් වලිනි. මුළු ලැබීම් වලින් සියයට 2 ක් පමණක් වූ ප්‍රාග්ධන ලැබීම් ඉකුත් වර්ෂයේදී මෙන්ම එම මට්ටමේම ස්ථාවරව පැවතියේය.

පසුගිය මුදල් වර්ෂයේදී මෙන්ම, රජයේ මුළු ආදයමින් තුනෙන් දෙකක් පමණම, නිෂ්පාදනය සහ වියදම මත පනවන ලද බදු මගින් ලැබුණි. ඉකුත් මුදල් වර්ෂයට වඩා 1970/71 වර්ෂයේදී ආදයමේ අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආහාර ද්‍රව්‍ය විකුණුම් වලින් ලද ලාභය (රුපියල් දශලක්ෂ 152), අපනයන බදු (රුපියල් දශලක්ෂ 61), විවිහිස විකුණුම් (රුපියල් දශලක්ෂ 50) සහ ආනයන බදු (රුපියල් දශලක්ෂ 24) යන මාර්ගයන්ගෙන් ලද ලැබීම් අඩු වීමය. කෙසේ වෙතත්, ඉහත සඳහන් අඩුවීම්හි ප්‍රතිවිපාකය, සාමාන්‍ය විකුණුම් සහ පිරිවැටුම් බදු (රුපියල් දශලක්ෂ 94), රාජ්‍ය සංස්ථා වල ලාභ සහ ලාභාංශ (රුපියල් දශලක්ෂ 40), දුම්කොළ බද්ද (රුපියල් දශලක්ෂ 29), රාජ්‍ය ඒකාධිකාරයන්ගේ අතිරික්තයන් (රුපියල් දශලක්ෂ 25) සහ වෙළෙඳ ව්‍යාපාරයන්හි දළ ලැබීම් (රුපියල් දශලක්ෂ 20) යන ලැබීම්හි වර්ධනයන් මගින් තරමක් සමනය විය.

විවිහිස විකිණීමෙන් ලද ලැබීම් පසුගිය වර්ෂ දෙකෙහිදී, රජයේ ආදයමට සැහෙන ප්‍රමාණයක් එකතු කරනු ලැබූ අතර, එය ආනයන තීරු බදු ලැබීම්හි අඩුවීම සමනය කිරීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා විය. කෙසේ වුවද, 1970/71 වර්ෂයේදී, ඒවා හඳුන්වා දීමෙන් පසු ප්‍රථම වරට පහත වැටුණි. 1970/71 වර්ෂයේදී සීනි ආනයන විවිහිස යටතට පත් කිරීම නිසා රුපියල් දශලක්ෂ 135 ක ප්‍රමාණයක් අතිරේකව ලැබීමට ප්‍රතිපක්ෂව මෙම ලැබීම්හි අඩුවීම සිදුවූ බව සඳහන් කළ යුතු වේ. රුපියල් දශලක්ෂ 341 ක්වූ පිරිවැටුම් බදු වලින් ලැබීම් 1969/70 වර්ෂයට වඩා සියයට 38 කින් වැඩි විය. 1968/69 වර්ෂයේ සිට, පිරිවැටුම් බදු මගින් ලැබීම් තුන් ගුණයකටත් වඩා වැඩිවූ බව සැළකිය යුතුය.

1970/71 වර්ෂය සඳහාවූ නියම ආදයම (තාවකාලික) මූලික අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 126 කින් හෙවත් සියයට 4 කින් පහත වැටුණි. මෙම අඩු වීමට ප්‍රධාන හේතූන් වූයේ, අපනයන බදු (රුපියල් දශලක්ෂ 66), විවිහිස විකිණීම් (රුපියල් දශලක්ෂ 61), ආහාර ද්‍රව්‍ය විකිණීම් වලින් ලාභ (රුපියල් දශලක්ෂ 63), අනෙකුත් ප්‍රාග්ධන ලැබීම් (රුපියල් දශලක්ෂ 17) සහ දේපල සංක්‍රාම බදු (රුපියල් දශලක්ෂ 11) යන මූලයන්ගේ ලැබීම් අඩුවීමය. ඉහත සඳහන් කළ අඩුවීම්හි බලපෑම අපේක්ෂිත ප්‍රමාණයටත් වඩා ලද පිරිවැටුම් බදු (රුපියල් දශලක්ෂ 47), ආදයම් බදු, (රුපියල් දශලක්ෂ 18), රාජ්‍ය සංස්ථාවලින් ලද, ලාභ සහ ලාභාංශ (රුපියල් දශලක්ෂ 14), සහ පුද්ගල බදු (රුපියල් දශලක්ෂ 10) යන ලැබීම් නිසා තරමක් සමනය විය.

II (ඒ) 4 වැනි සංඛ්‍යා සටහන

1969/70 සිට 1971/72 - රජයේ ආදායම් (අ)

රුපියල් දශ ලක්ෂ

මූලයන්	1969 – 70	1970 – 71 මුල් ඇස්ත-මේන්තු	1970 – 71 නියම තාවකාලික	1971/72 12 මාසය*	1971/72 15 මාසය
1. වර්තන ලැබීම්	2,926 2	2,972 1	2,854 2	3,086 6	3,858 1
1·1 පෞද්ගලික හා සමාගම් ආදායමෙන් වූ බදු	441 1	425 0	444 1	460 8	576 0
1·1·1 ආදායම් බදු	440·6	425·0	443·4	460·8	576·0
1·1·2 අනෙකුත්	0·5	—	0·7	—	—
1·2 නිෂ්පාදන හා වියදම් මත පැනවූ බදු	2,037·8	2,046·2	1,869·4	2,031·9	2,539·8
1·2·1 සාමාන්‍ය අලෙවි සහ පිරිවැටුම් බදු	247·4	293·8	341·1	382·0	477·5
1·2·2 වරණ අලෙවි බදු	275·8	300·8	302·2	331·6	414·5
(අ) දුම්කොළ බද්ද	218·3	242·5	247·7	280·0	350·0
(ආ) තේ බද්ද	41·6	38·9	37·0	30·8	38·5
(ඇ) වෙනත්	15·9	19·4	17·5	20·8	26·0
1·2·3 ආනයන බදු	306·5	288·0	282·2	267·4	334·2
(අ) එළවලු නිෂ්පාදිතයන්	25·7	40·8	32·1	40·0	50·0
(ආ) සකස් කරනලද ආහාර, බීම, දුම්කොළ ආදිය	61·1	55·5	70·1	56·0	70·0
(ඇ) වණිජ නිෂ්පාදිතයන්	39·4	8·0	15·9	8·0	10·0
(ඈ) රසායනික හා ඊට අදාළ කාර්මික නිෂ්පාදිතයන්	25·7	27·0	31·4	30·0	37·5
(ඉ) ප්ලාස්ටික් ද්‍රව්‍ය, රබර් හා අනෙකුත් කෘතිම ද්‍රව්‍ය	16·0	15·0	12·8	11·0	13·7
(ඊ) කඩදාසි සෑදීමේ ද්‍රව්‍ය	8·5	13·0	7·9	12·0	15·0
(උ) රෙදිපිළි හා රෙදි නිෂ්පාදිතයන්	18 0	28·5	35·5	32·0	40·0
(ඌ) නීව ලෝහ සහ ලෝහ ද්‍රව්‍ය	20·2	21·5	16·1	18·0	22·5
(එ) යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික අම-තර කොටස්, විදුලි උපකරණ ආදිය	31·8	31·5	22·6	24·8	31·0
(ඒ) රථවාහන, ගුවන්යානා යාත්‍රා ආදිය	31·4	27·0	20·3	21·6	27·0
(ඕ) වෙනත්	19·8	12·2	16·2	13·0	16·3
(ඕ) ආනයන බලපත්‍ර ගාස්තු	8·9	8·0	1·3	1·0	1·2
1·2·4 විදිහිස විකිණීමෙන් ලැබීම්	446·0	457·0	395·8	426·4	533·0
1·2·5 අපනයන බදු	327·2	331·8	265·9	285·5	356·9
(අ) තේ	171·6	180·3	162·7	171·3	214·1
(ආ) රබර්	70·6	69·0	13·7	14·2	17·8
(ඇ) පොල්	53·1	46·0	54·6	61·4	76·8
(ඈ) වෙනත්	32·5	36·5	34·9	38·6	48·2
1·2·6 බලපත්‍ර ගාස්තු	40·3	44·7	45·8	51·1	63·9
1·2·7 දේපල පැවරුම් බදු	22·2	20·7	10·1	20·6	25·8
1·2·8 රජයේ ඒකාධිකාරීන්ගේ අතිරික්ත	124·4	150·0	149·0	160·0	200·0
1·2·9 ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලාභ	248·0	159·4	96·3	107·2	134·0
1·3 ලැබූ පොළී හා ලාභාංශ	41·5	63·8	81·0	108·6	135·7
1·3·1 රාජ්‍ය සමාගතනවලින් ලාභ හා ලාභාංශ	31·4	57·3	71·4	100·3	125·4
1·3·2 වෙනත්	10·1	6·5	9·6	8·3	10·3
1·4 වෙළෙඳ ව්‍යවසායයන්ගේ දළ ලැබීම්	283·6	302·7	303·9	345·0	431·3
1·4·1 දුම්රිය	139·9	134·8	139·8	165·8	207·2
1·4·2 විදුලිබල	1·8	3·2	2·4	1·9	2·4
1·4·3 තැපැල් හා විදුලි සංදේශ	72·9	93·4	84·9	104·5	130·6
1·4·4 වරාය සහ නැව්තොට	44·4	52·0	50·6	52·9	66·1
1·4·5 අනෙකුත්	24·6	19·3	26·1	20·0	25·0
1·5 අනෙකුත් වර්තන ලැබීම්	122·2	134 4	136·8	140·3	175·3
1·5·1 ජාතික ලොතරැයිය	13·6	17·0	10·0	12·2	15·2
1·5·2 අනෙකුත්	108·4	117·4	126·8	128·1	160·1
2. ප්‍රාග්ධන ලැබීම්	54·7	62·2	54·7	69·1	86·4
2·1 දේශීය අංශවල ප්‍රාග්ධන ශිණුම වලින් පැවරුම්	29·2	31·3	40·4	34·2	42·8
2·1·1 බුදල් බද්ද	12·0	15·0	14·4	12·0	15·
2·1·2 පෞද්ගලික බද්ද	17·0	16·3	25·9	22·2	27·8
2·1·3 වෙනත්	0·2	—	0·1	—	—
2·2 අනෙකුත් ප්‍රාග්ධන ලැබීම්	25·5	30·9	14·3	34·9	43·6
3. මුළු ආදායම	2,980·9	3,034·3	2,908·9	3,155·7	3,944.5

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ඉහත දක්වෙන ශීර්ෂයන් පිළිබඳ වැඩි විස්තර සඳහා II පරිශිෂ්ඨයෙහි 36 වෙනි සංඛ්‍යා සටහනෙහි පාද සටහන් බලන්න.

* අනුපාත පදනමක් මත.

1971/72 මෙම මුදල් වර්ෂයේදී මාස 12 හේ අනුපාතික ආදයම රුපියල් දශලක්ෂ 247 කින් නැතහොත් සියයට 9 කින් වැඩිවෙතැයි අපේක්ෂා කරනු ලැබේ. අපේක්ෂිත සැළකිය යුතු වැඩිවීම් නම්, සාමාන්‍ය විකුණුම් සහ පිරිවැටුම් බදු සහ රාජ්‍ය වෙළඳ ව්‍යවසායයන්හි දළ ලැබීම් යන මාර්ග දෙකින්ම රුපියල් දශලක්ෂ 41 ක බැගින්, විවිධිස විකිණීමෙන් රුපියල් දශලක්ෂ 31, දුම්කොළ බද්දෙන් රුපියල් දශලක්ෂ 32, රාජ්‍ය සමායතන වල ලාභ හා ලාභාංශ වලින් රුපියල් දශලක්ෂ 29, අපනයන බදුවලින් රුපියල් දශලක්ෂ 20 සහ ආදයම බද්දෙන් රුපියල් දශලක්ෂ 17 ක්ද යන ඒවාය. දේපල සංක්‍රාම බදු, රාජ්‍ය ඒකාධිකාරයන්ගේ අතිරික්ත යන්, රජයේ ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලාභ සහ බලපත්‍ර බදු යන ඒවායින් සුළු වැඩිවීම් අපේක්ෂා කරනු ලැබේ. මෙම වැඩිවීම් හි බලපෑම ආයාත බදු එකතු කිරීමහි රුපියල් දශලක්ෂ 15 ක අඩුවීමක් මගින් සුළු වශයෙන් සමනය වී යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(i) පුද්ගල සහ සමාගම් ආදයම් මත පැවරුණු බදු

මෙම මාර්ගයෙන් ලැබෙන ආදයම මුළුමනින්ම පාහේ සමන්විත වී ඇත්තේ පුද්ගලයන් සහ ආයතන මත පැනවුණ ආදයම් බද්දෙනි.[1] ඉකුත් වර්ෂයට වඩා 1970/71 ආදයම් බදු ලැබීමහි වැඩිවීම රුපියල් දශලක්ෂ 3 ක් පමණක් විය. වර්ෂයේ මුල් ඇස්තමේන්තු වලට වඩා මෙම ලැබීම් රුපියල් දශලක්ෂ 19 කින් වැඩිය. රුපියල් දශලක්ෂ 425 ක්වූ මුල් ඇස්තමේන්තුවෙහි 1971 ඔක්තෝබර් /නොවැම්බර් විමුලාශනයෙන් අපේක්ෂිත ලැබීම් වූ රුපියල් දශලක්ෂ 100 ක්ද ඇතුළත් විය. විමුලාශනය නිසා ලද මුළු බදු ලැබීම් රුපියල් දශලක්ෂ 13 ක් පමණක් විය. මෙම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 8·5 ක් හිඟ බදු ලැබීම්ද, රුපියල් දශලක්ෂ 1·7 ක් එකතු කර ගත් අතිරේක බදුද වූ අතර ඉතිරි ප්‍රමාණය බදු සමා ප්‍රකාශ කිරීම් යටතේ එකතු කර ගන්නා ලදී. විමුලාශනයෙන් අපේක්ෂිත ලැබීම්හි පහළ බැසීමට ප්‍රතිපක්ෂව, නියම ලැබීම් 1970/71 වර්ෂයේ මූලික ඇස්තමේන්තු වලට වඩා වැඩිවීම් වැදගත් වේ. ආයතන වලින් කලින් අපේක්ෂා කළ අනිවාර්ය ඉතිරි කිරීම් දයකවීම් අත්හැරීම වෙනුවට 1970/71 තක්සේරු වර්ෂයේ සිට හඳුන්වා දුන්, සමාගම් විසින් ගෙවිය යුතු ආදයම් බදු සියයට 10 කින් ඉහළ යාම, මෙම වැඩිවීමට එක් හේතුවක් විය. මීට අතිරේකව, උපයන විට ගෙවීමේ ක්‍රමය අනුගමනය කිරීමේ අපේක්ෂාවෙන්, පූර්ව වර්ෂයන් වෙනුවෙන් වූ තක්සේරු කිරීම් ඉක්මන් කිරීම මෙම ලැබීම් වර්ධනයට හේතු විය. විශේෂයෙන් විකේන්ද්‍රණය මගින් බදු වඩා හොඳින් පැනවීම, විශාල ප්‍රමාණයේ බදු මග හැරීම් ඇතැයි සැක කරනු ලැබූ සමහර වෙළෙඳ ව්‍යාපාර පිළිබඳව කළ පරීක්ෂණ මෙන්ම, ඉක්මණින් එකතු කිරීම්ද, ආදයම් බදු ලැබීම් වැඩිවීමට හේතු විය.

1971/72 වර්ෂයේදී ආදයම් බද්දෙන් අපේක්ෂිත ආදයම (මාස 12 ට) රුපියල් දශලක්ෂ 461 ක් වේ. එය 1970/71 වර්ෂයේදී ලැබීම් වලට වඩා රුපියල් දශලක්ෂ 17 ක වැඩිවීමක් පෙන්වයි. 1971 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි උපයන විට ගෙවීමේ ක්‍රමය හඳුන්වා දීම අළුත් බදු ගෙවන්නන් එකතු කිරීම මගින් බදු ක්ෂේත්‍රය පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. තවද 1971/72 තක්සේරු වර්ෂය තුළදීද සමාගම් විසින් අනිවාර්ය ඉතිරි කිරීම් වෙනුවට ගෙවිය යුතු ආදයම් බදුවල සියයට 10 ක වැඩිවීම දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙසේ ඊට ප්‍රථම වර්ෂයේනියම ලැබීම් වලට වඩා අඩුවන පරිදි මුල් වශයෙන් අපේක්ෂිත ලැබීම් ඇස්තමේන්තු කර තිබූ පසුගිය වර්ෂ දෙකේදී මෙන් නොව, 1971/72 වර්ෂයේදී ලැබීම් 1970/71 නියම ලැබීම් වලට වඩා වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. පසුගිය වර්ෂ කිපයේදී, මුල් ඇස්තමේන්තු වලට වඩා ආදයම් බදු පිළිබඳ නියම ලැබීම් වැඩිවීම වැදගත් වේ.

(ii) නිෂ්පාදනය සහ වියදම මත පනවන ලද බදු

මෙම ශීර්ෂය සාමාන්‍ය අලෙවි සහ පිරිවැටුම් බදු (මුළුමනින්ම පාහේ ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් සහ බැංකු හර බද්දෙන් සමන්විත), වරණ අලෙවි බදු, (උදා:— දුම්කොළ සඳහා වන දේශීය භාණ්ඩ බද්ද සහ වටිනාකම අනුව පනවනලද තේ තීරු බද්ද), ආනයන බදු, අපනයන බදු, විවිධිස අලෙවියෙන් ලැබීම්, රාජ්‍ය ඒකාධිකාරීන්ගේ අතිරික්ත (එනම් අරක්කු) සහ ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලැබෙන ලාභ (උදා:- සීනි, පිටි සහ උම්බලකඩ) යන ඒවායින් සමන්විත වේ.

1· පුද්ගලයන් සහ සමාගම වලින් ලැබුණ ආදයම වෙන වෙනම දක්විය නොහැකි වුවද, එම ආදයමෙන් සියයට 40 ක් පමණ පුද්ගලයන්ගෙන්ද, සියයට 60 ක් සමාගම වලින්ද ලැබෙයයි දළ වශයෙන් අපේක්ෂා කෙරේ·

(අ) පිරිවැටුම් බදු

පසුගිය වර්ෂ කිහිපය තුළ පිරිවැටුම් බදු රජයේ ආදයම් ලැබෙන ප්‍රධාන මාර්ගයක් විය. නිෂ්පාදකයින්ගේ සහ ව්‍යාපාරිකයන්ගේ පිරිවැටුම මත පනවන ලද මෙම බද්දෙන් පසුගිය පස් අවුරුද්ද තුළ සියයට 54 ක (සංයුක්ත) වැඩිවීමක් විය. 1970/71 වර්ෂයේදී පිරිවැටුම් බද්දෙන් ලැබුණු ආදයම රුපියල් දශලක්ෂ 94 කින් ඉකුත් මුදල් වසරට වඩා වැඩිවිය. 1970/71 වර්ෂයේ මූලික ඇස්තමේන්තු වලට වඩා එය රුපියල් දශලක්ෂ 47 කින් ඉහළ යෑමක් විය. 1971/72 දී මෙම මාර්ගයෙන් අපේක්ෂිත ආදයම සමාලෝචිත මුදල් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 41 ක් වේ යයි අපේක්ෂිතය. මෙම අපේක්ෂිත වැඩිවීම සාර්ථක වීමට නම්, 1968/69 දී මුළු ආදයමෙන් සියයට 4 ක් වූ පිරිවැටුම් බදු සියයට 12 දක්වා වැඩි විය යුතුය.

1970/71 වර්ෂයේදී පිරිවැටුම් බදු වලින් ලද ආදයම ඉකුත් මුදල් වර්ෂය හා සැසඳීමේදී වැඩිවීමට හේතුවූයේ: විවිධ නිෂ්පාදන ශීර්ෂයන් සම්බන්ධයෙන් බදු අනුපාතිකය වැඩිකිරීම, විශේෂයෙන්ම පැවරල් සම්බන්ධයෙන් 1970/71 දී බදු අනුපාතිකයන් වැඩි කිරීම ඊට හේතු විය. තවද 1971 අප්‍රේල් මාසයේ සිට බලපාන පරිදි ඔට්ටු භාර ගැනීමේ ව්‍යාපාරය මත සියයට 5 ක පිරිවැටුම් බද්දක් පැනවිණ. දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ වඩාත් දියුණු බදු අය කිරීමේ ක්‍රමයද බදු එකතු කිරීම වැඩිවීමට හේතු විය. පැවරල් සඳහා බදු අනුපාතිකය සියයට 37 සිට සියයට 48 දක්වා තවදුරටත් වැඩි කිරීම සහ උගස් ව්‍යාපාරය මත පිරිවැටුම් බද්දක්[2] පැනවීම මගින් රුපියල් දශලක්ෂ 10 ක අතිරේක මුදලක් ලැබීම නිසා 1971/72 දී (මාස 12 තුළ) පිරිවැටුම් බදු ආදයම රුපියල් දශලක්ෂ 41 කින් වැඩිවෙතැයි අපේක්ෂා කෙරේ.

(ආ) වරණ අලෙවි බදු

ඉකුත් මුදල් වර්ෂය හා සසඳන විට 1970/71 වර්ෂයේදී වරණ අලෙවි බදු වලින් ලද ආදයම රුපියල් දශලක්ෂ 26 කින් වැඩි විණ. තේ බදු වලින් ලද ලැබීම්හි රුපියල් දශලක්ෂ 5 ක පහත බැසීම නිසා තරමක් සමනය වූ දුම්කොළ බදු වලින් ලද ලැබීම්හි රුපියල් දශලක්ෂ 29 ක ඉහළ යෑම මීට මූලික වශයෙන් හේතු විය. 1970/71 වර්ෂයේදී දුම්කොළ සම්බන්ධයෙන් වූ දේශීය භාණ්ඩ බද්ද, රාත්තලකට රුපියල් 37.50 සිට රුපියල් 42.50 දක්වා වැඩිවීම මෙම ඉහළ යෑමට හේතු විය. වටිනාකම අනුව අයකරන තේ බදු ලැබීම් පහත යාමට හේතු වූයේ, කොළඹ සහ ලන්ඩන් වෙන්දේසිවල පැවති පහළ මිල මට්ටමය. වරණාත්මක බදු වලින් නියම ලැබීම් ආසන්න වශයෙන් 1970/71 වර්ෂය සඳහා මූලික වශයෙන් ඇස්තමේන්තු කළ මට්ටමෙහිම විය.

1971/72 (12 මස තුළ) වරණ අලෙවි බද්දෙන් ආදයම සමාලෝචනයට භාජනය වන වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 29 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. 1971/72 අයවැය කථාවට පෙර (නිකුත් කරන ලද ප්‍රකාශණය අනුව) දුම්කොළ රාත්තලකට දේශීය භාණ්ඩ බද්ද රුපියල් 47.50 දක්වා වැඩි කිරීම නිසා දුම්කොළ බදු ආදයම රුපියල් දශලක්ෂ 32 කින් ඉහළ යතැයි අපේක්ෂා කෙරේ. තේ බදු ආදයම 1971/72 තුළ තවත් රුපියල් දශලක්ෂ 6 කින් පහළ යතැයි බලාපොරොත්තු වේ.

(ඇ) ආනයන බදු

විශේෂයෙන්ම විවිහිස ක්‍රමය හඳුන්වා දීමත් සමගම ආනයන තීරු ගාස්තු ආදයමේ පහත යෑමේ උපනතිය 1970/71 තුළදීත් දිගටම පැවතිණ. ඒවා ඉකුත් වර්ෂයේ ලැබුණු ආදයමත් සමඟ සසඳන විට රුපියල් දශලක්ෂ 24 කින් අඩු විය. ආනයන බදු වලින් ලැබුණු ආදයමෙහි ප්‍රධාන අඩුවීම වාර්තා ගත වූයේ බනිජ නිෂ්පාදිත (රුපියල් දශලක්ෂ 24), වාහන

---

1. මෙම වෙනස්වීම් පිළිබඳ විස්තර 1970 වාර්ෂික වාර්තාවේ 174 වෙනි පිටුව බලන්න.

2. මෙම සංශෝධනය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ පසුව දක්වේ. "1971/72 අයවැය ලේඛනය" යන කොටස බලන්න.

ආදිය (රුපියල් දශලක්ෂ 11) සහ යන්ත්‍ර සූත්‍ර ආදිය (රුපියල් දශලක්ෂ 4) සම්බන්ධයෙනි. රෙදිපිළි සඳහා රුපියල් දශලක්ෂ 18 ක සහ ආහාර, බීම වර්ග ආදිය සඳහා ලැබුණු රුපියල් දශලක්ෂ 9 ක සැලකිය යුතු වැඩිවීම් වලින් මෙම අඩුවීම් තරමක් දුරට මග හැරී ගියේය. 1970/71 දී කිරීමට බලාපොරොත්තු වූ ආනයනයන් ලබා ගැනීමට සිදුවූ ප්‍රමාදයන් සහ සාමාන්‍යයෙන් පහළ ආනයන පරිමාව ආනයන බදු ආදයමෙහි සාමාන්‍ය අඩුවීම පහද දෙයි. 1969/70 වර්ෂයේ මුල් අට මාසය තුළ විවෘත පොදු බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක වූ බවද සැලකිල්ලට ගත යුතුය. ඛනිජ නිෂ්පාදිතයන්ගේ ආනයන බදු සීඝ්‍ර ලෙස අඩුවීමට හේතු වූයේ, පිරිපහදු පැට්‍රෝලියම් නිෂ්පාදිතයන්ගේ අඩු ආනයන ප්‍රමාණයන්ය බදු වලින් නිදහස්ව රෙදිපිළි ආනයනය කිරීමට සීමාසහිත සළු සල වෙත දී තිබූ වාසිය ඉවත් කිරීම රෙදිපිළි වලින් ලැබුණු බදු ආදයමෙහි වැඩිවීමක් ඇතිවීමට හේතු විය. සමාලෝචනයට භාජනය වන මුදල් වර්ෂයේ මුල් ඇස්තමේන්තු හා සසඳන විට ආනයන බදුවලින් ලැබුණු ආදයමෙහිද රුපියල් දශලක්ෂ 6 ක අඩුවීමක් පෙන්විය.

ප්‍රධාන වශයෙන් වර්ෂය තුළදී බලාපොරොත්තු වන පහළ ආනයන පරිමාව හේතුකොට ගෙන 1971/72 වර්ෂයේදී (12 මාසයක) ආනයන බදු ආදයම තවත් රුපියල් දශලක්ෂ 15 කින් අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

(ඇ) විවිහිස අලෙවියෙන් ආදායම

ඉකුත් වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 161 ක සැළකිය යුතු වැඩිවීමට ප්‍රතිවිරුද්ධව විවිහිස අලෙවියෙන් 1970/71 ලැබුණු ආදයම රුපියල් දශලක්ෂ 50 කින් පහත වැටිණ. මෙම පහත වැටීම සිදුවූයේ සීනි ආනයනය කිරීම විවිහිස ට යටත් කිරීමට ගත් තීරණයද තිබියදීය 1970/71 වර්ෂයේදී සීනි ආනයන වෙනුවෙන් ගෙවූ විවිහිස ප්‍රමාණය රුපියල් දශලක්ෂ 135 ක් විය. විවිහිස අලෙවියෙන් ලත් ආදයම පහත වැටීමට ප්‍රධාන වශයෙන් පහළ ආනයන මට්ටම සහ මෙම මුදල් වර්ෂය තුළදී අධික ලෙස ආනයන ණය උපයෝජනයට ගැනීම යන හේතු නිසා සිදු විය. 1970/71 ලැබීම්ද අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 61 කින් අඩු විය. 1971/72 (12 මස) විවිහිස අලෙවියෙන් රුපියල් දශලක්ෂ 426 ක ආදයමක් ලැබෙතැයි ඇස්තමේන්තු කර තිබේ. මෙය 1970/71 නියම ආදයමට වඩා රුපියල් දශලක්ෂ 31 කින් වැඩිවීමකි.

(ඉ) අපනයන බදු

1970/71 අපනයන බදු ආදයම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 61 ක අඩුවීමක් පෙන්නුම් කළේය. රබර් වලින් ලැබුණු තීරු බදු ආදයම රුපියල් දශලක්ෂ 57 කින්ද, තේ වලින් ලැබුණු තීරු බදු ආදයම රුපියල් දශලක්ෂ 9 කින්ද සැළකිය යුතු පරිදි අඩුවිය. පොල් සහ සුළු අපනයන වලින් ලැබුණු ආදයමෙහි රුපියල් දශලක්ෂ 2 බැගින් වූ වැඩිවීම් නිසා ඉහතකි අඩුවීම් සුළු වශයෙන් මග හැරී ගියේය. රබර් මිළෙහි පරිහානියත්, ත්‍රස්තවාදී කටයුතු වලින් නිෂ්පාදනයට වූ හානියත් නිසා වූ රබර් අපනයන පරිමාවෙහි අඩුවීම තීරු බදු ආදයමෙහි පහළ යාමට හේතු විය. සිංගප්පූරු වෙළෙඳ පොලෙහි රබර් සඳහා නැ. වි. ස. (රබර් වලට වටිනාකම අනුව අයකරන ආනයන බදු පදනම් වී ඇති) මිළයන්හි අවම මිළ වූ රාත්තලකට ශත 94 ට වඩා අඩුවූ අතර මෙය 1971 ජූනි මස සිට විචල්‍ය පරිමාණය ක්‍රියාත්මක කිරීම අපහසු කළේය. මෙය හේතු කොට ගෙන එම මාසයේ සිට සෑම රාත්තලකටම ශත 3 බැගින් වූ නොවෙනස් වන බදු අනුපාතිකයක් එකතු කිරීමට සිදු විය. තේ සම්බන්ධයෙන් වන තීරු ගාස්තු ආදයමේ රුපියල් දශලක්ෂ 9 කින් අඩුවීම රේගු සටහන් කිරීමේ ප්‍රමාදයන් සහ අපනයන පරිමාවෙහි සුළු අඩුවීමක් හේතුකොටගෙන සිදු විය. එම හේතූන් නිසාම 1970/71 වර්ෂයේ අපනයන බදු ආදයම මුල් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 66 කින් පහත වැටිණ.

1971/72 වර්ෂයේදී අපනයන බදු ආදයම රුපියල් දශලක්ෂ 20 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් සමහර අපනයන භාණ්ඩයන්ගේ මිළයන්හි අපේක්ෂිත ඉහළ යාම නිසා සෑම කාණ්ඩයකටම අයත් අපනයනයන් මෙම වර්ෂය තුළ වැඩි ආදයමක් ගෙනෙතැයි ඇස්තමේන්තු කර ඇත.

(ඊ) බලපත්‍ර හා දේපල පැවරීම් බදු

බලපත්‍ර බදු (අරක්කු තැබූරුම් රේන්ද, රා මැදීමේ බලපත්‍ර ගාස්තු, ඉවන් විදුලි බලපත්‍ර ගාස්තු යනාදිය) හා දේපල පැවරීම් බදු (මුද්දර ගාස්තු, රථවාහන පැවරීමේදී අය කෙරෙන බදු ආදිය) වලින් ලද ආදයම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 7 කින් පහත වැටිණ. මෙය දේපල පැවරීම් බදුවල රුපියල් දශලක්ෂ 12 ක පහළ යාමකද බලපත්‍ර බදුවල රුපියල් දශලක්ෂ 6 ක ඉහළ යාමකද ශුද්ධ ප්‍රතිඵලයක් විය. මෙම බදු කාණ්ඩයෙන් ලත් ආදයම බලාපොරොත්තු වූ මට්ටමෙහිම වාගේ පැවතිණ. කෙසේ වුවද, 1970/71 මුල් ඇස්තමේන්තු හා සැසඳීමේදී බලපත්‍ර බදු රුපියල් දශලක්ෂ 1·0 කින් ඉහළ ගිය අතර, අපේක්ෂිත මුද්දර ගාස්තු ආදයම අඩුවීම නිසා, දේපල පැවරීම් බදු ආදයම රුපියල් දශලක්ෂ 11 කින්ද පහළ ගියේය. 1971/72 (12 මස) බලපත්‍ර සහ දේපල පැවරුම් බදු ප්‍රධාන කොට උකස් බඩු තබන්නන් වෙත බලපත්‍ර ගාස්තු හඳුන්වා දීම නිසාත්, ගස් බදු ක්‍රමය අහෝසි කොට තැබූරුම් ක්‍රමය යාපන අර්ධද්වීපයේ නැවත හඳුන්වා දීම නිසාත්, රුපියල් දශලක්ෂ 16 කින් ඉහළ යතැයි අපේක්ෂා කෙරේ.

(උ) රජයේ ඒකාධිකාරයන්ගේ අතිරික්තය

මෙම ආදයම් ශීර්ෂය මුළුමනින්ම වාගේ සමන්විත වී ඇත්තේ, රජය විසින් අරක්කු අලෙවියෙන් ලත් ලාභයන්ගෙනි. 1970/71 වර්ෂයේදී මෙමගින් ලත් ආදයම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 25 කින් වැඩිවීමක් වාර්තා කළ අතර එය වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට වඩා අඩුවූයේ සුළු වශයෙනි. ආදයම වැඩිවීම ප්‍රධාන වශයෙන්, වැඩි අරක්කු අලෙවිය නිසා සිදුවිය. 1971/72 වර්ෂයේදී වැඩි වන විකුණුම් හේතුකොටගෙන, ලාභය රුපියල් දශලක්ෂ 11 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

(ඌ) ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලැබූ ලාභ

මෙම ආදයම් ශීර්ෂය සම්පූර්ණයෙන්ම වාගේ සීනි, පිටි හා උම්බලකඩ අලෙවි කිරීමෙන් ලැබෙන ලාභයන්ගෙන් සමන්විත වෙයි. 1970/71 දී ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලැබුණු ලාභය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රුපියල් දශලක්ෂ 152කින් සැහෙන පමණ අඩුවීමක් පෙන්වූයේය. කෙසේ වුවද, මුල් ඇස්තමේන්තු හා සැසඳීමේදී සිදුවූ අඩුවීම රුපියල් දශලක්ෂ 63 ක් පමණි. 1971/72 වර්ෂයේ ඇස්තමේන්තු අනුව රුපියල් දශලක්ෂ 11 ක වැඩිවීමක් අපේක්ෂා කෙරේ. මෙම වෙනස්වීම් වලට හේතු පසුව එන ශුද්ධ ආහාර පිහිටාධාර කොටසෙහි[1] විස්තරාත්මකව සාකච්ඡා කොට ඇත.

(iii) පොළී සහ ලාභාංශ

මෙම මූලයෙන් ලත් ආදයම ඉකුත් වර්ෂයට වඩා සැළකිය යුතු පරිදි රුපියල් දශලක්ෂ 40 කින් වැඩි විය. භාණ්ඩාගාරයට රජයේ සමායතනයන්ගෙන් හා පොදු සමාගම් වලින් වැඩි දයකවීම මෙම වැඩිවීමට හේතු විය. මෙම මාර්ගයෙන් ලත් ආදයමද අයවැය ඇස්තමේන්තුවට වඩා රුපියල් දශලක්ෂ 17 කින් වැඩි විය. 1971/72 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 29 කින් තවදුරටත් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. රජයේ සමායතනයන් විසින් භාණ්ඩාගාරයට වැඩි දයකවීම් වලට හේතු වූයේ, 1970/71 අයවැයෙන් මෙම සමායතන කෙරෙහි විශේෂ අය කිරීමක් හඳුන්වා දීම නිසාය. 1971/72 වර්ෂයේදී එක් එක් සමායතනයෙන් අපේක්ෂිත ලැබීම් මෙම වර්ෂය සඳහා වන අයවැය ලේඛනයෙහි දක්වා ඇත.

(iv) වෙළඳ ව්‍යවසායයන්ගෙන් ලැබීම්

රජයේ වෙළඳ ව්‍යවසායයන්ගෙන් දළ ලැබීම් (ප්‍රධාන වශයෙන් දුම්රිය, තැපැල් සහ විදුලි පණිවුඩ සේවා හා වරාය) 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 20 කින් වැඩි විය. ඒවා, කෙසේ වෙතත් මුල් ඇස්තමේන්තු වලට වඩා වැඩිවී ඇත්තේ සුළු වශයෙනි.

---

1. 145 පිටුව බලන්න.
2. ii (ඊ) 3 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන ලැබීම රජයේ ගිණුම්වල මෙම දෙපාර්තමේන්තුව යටතේ දක්වා ඇති ආදයමට වඩා වැඩිය. මෙම වෙනසට හේතු වූ ආපසු ගෙවීම් (ශීර්ෂ viii) පොලිය හා වාර්ෂික මුදල් යනාදිය (ශීර්ෂ x) ඇතුළත් කිරීමය.

දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබීම් ඉකුත් වර්ෂයේ පැවති මට්ටමෙහිම පැවතිණ. 1971 ජූනි මසදී දුම්රිය දෙපාර්තමේන්තුව එහි මූල්‍ය තත්ත්වය දියුණු කරලීම සඳහා සැලසුම් කරන ලද නව ආදයම් වැඩපිළිවෙල හඳුන්වා දුන්නේය. මේවාට, මගීන් හා භාණ්ඩ සඳහා සංශෝධිත ගාස්තු ඇතුළත් විය. සම්පූර්ණ වර්ෂයකින් අපේක්ෂිත අතිරේක ආදයම රුපියල් දශලක්ෂ 26 ක් විය. මෙයින් රුපියල් දශලක්ෂ 9 ක් 1970/71 මුදල් වර්ෂය තුළදී ලැබෙතැයි අපේක්ෂා කෙරිණ. කෙසේ වුවද මෙම වැඩිවීම් ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදී කටයුතු නිසා දුම්රිය සේවාවන් අඩු කිරීමට සිදුවීම නිසා ලබාගත නොහැකි විය. කෙසේ වුවද ලැබීම්, අයවැයෙන් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 5 කින් වැඩි විය

තැපැල් හා විදුලි පණිවුඩ සේවාවන්ගෙන් ලැබීම් ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 12 ක වැඩිවීමක් පෙන්විය. කෙසේ වුවද, ඒවා මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 9 කින් අඩු විය. මෙම වැඩිවූ ලැබීම් මූලික වශයෙන් 1970 ඔක්තෝබර්[1] මස සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දුන් තැපැල් සහ විදුලි පණිවුඩ ගාස්තු සහ දුරකථන ගාස්තු ඉහළ නංවන අන්දමින් කළ සංශෝධනයන් නිසා සිදු විය.

ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යා හා සසඳන විට ලැබීම් අඩුවීම ත්‍රස්තවාදී කටයුතු වලින් රටෙහි ඇතිවූ කලබලකාරී තත්ත්වය නිසා සිදු වූවක් ලෙස දැක්විය හැකිය. 1971/72 වර්ෂයේදී විශේෂයෙන්ම සාමාන්‍ය ලියුම් හා තැපැල් පත්[2] සඳහා තැපැල් ගාස්තු වැඩි කිරීම නිසා රුපියල් දශලක්ෂ 20 ක ඉහළ ලැබීම් ප්‍රමාණයක් බලා පොරොත්තු වෙයි.

වරායෙන් ලැබුණ ආදයම ඉකුත් වර්ෂයේ හා සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී, මුලින් බලාපොරොත්තු වූ ප්‍රමාණය හා සසඳන විට රුපියල් දශලක්ෂ 6 කින් වැඩි විය. මෙම වැඩිවීම බෙහෙවින් වරාය ගාස්තු ආසන්න වශයෙන් සියයට 25 කින් වැඩි කිරීම නිසා සිදුවිය. 1971/72 වර්ෂයේ දී ලැබීම් රුපියල් දශලක්ෂ 2 කින් තවදුරටත් වැඩිවෙතැයි අපේක්ෂා කෙරේ.

(v) වෙනත් වර්තන ලැබීම

1970/71 වර්ෂයේදී වෙනත් විවිධ මූලයන්ගෙන් වන වර්තන ලැබීම් ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 15 කින් වැඩිවූ අතර මෙය මුල් ඇස්තමේන්තු වලට වඩා සුළු වැඩිවීමක් විය. වෙනත් විවිධ මූලයන්ගෙන් ලද රුපියල් දශලක්ෂ 18 ක ලැබීම් ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලද රුපියල් දශලක්ෂ 4 කින් වූ පහත් ලැබීම් නිසා තරමක් දුරට මගහැරී ගියේය. බාහිර රෝගීන්ගේ අංශයේ රෝගීන්ගේ එක්වර පැමිණීමක් සඳහා ශත 25 බැගින් ගාස්තුවක් අයකිරීම නිසා අපේක්ෂිත රුපියල් දශලක්ෂ 10 ක අමතර ආදයමක්ද තිබියදී 1971/72 වර්ෂයේදී වෙනත් වර්තන ආදයම රුපියල් දශලක්ෂ 1 කින් පමණක් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

(vi) ප්‍රාග්ධන ලැබීම්

(අ) දේශීය අංශයේ ප්‍රාග්ධන ගිණුම් පැවරීම

මෙම ආදයම් ශීර්ෂය ප්‍රධාන වශයෙන් බුදල් බද්දෙන් හා පුද්ගල බද්දෙන් (ඵනම් ධන හා ත්‍යාග බදු) සමන්විත වෙයි. මෙම මූලයෙන් වන ලැබීම් ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 11 කින්ද, මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 9 කින්ද වැඩිවී ඇත 1970/71 වර්ෂයේදී බුදල් බද්දෙන් ලැබීම් රුපියල් දශලක්ෂ 2 ක වැඩිවීමක් පෙන්වූ අතර, පුද්ගල බද්දෙන් වැඩිවූ රුපියල් දශලක්ෂ 9 ක වැඩි ලැබීමට හේතු වූයේ, ධන හා ත්‍යාගිබදු වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම නිසාය. නව බදු ගෙවන්නන් වෙත නිකුත් කරන ලද තක්සේරු කිරීම්ද මෙම වැඩිවීමට හේතු විය. 1971/72 වර්ෂයේදී මෙම මූලයෙන් ලැබෙන ආදයම රුපියල් දශලක්ෂ 6 කින් අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

---

1. සංශෝධිත ගාස්තු පිළිබඳ විස්තර සඳහා 1970 වාර්ෂික වාර්තාවේ 177 පිටුව බලන්න.
2. මෙම ගාස්තු සංශෝධනයන් පිළිබඳ විස්තර සඳහා 1971/72 අයවැය ලේඛනය පිළිබඳ කොටස බලන්න.

(ආ) වෙනත් ප්‍රාග්ධන ලැබීම්

ඒකාබද්ධ අරමුදලින් කරන ලද ණය ආපසු ගෙවීම් ඇතුළත් වන යථෝක්ත ශීර්ෂය 1970/71 දී රුපියල් දශලක්ෂ 11 කින් පහත වැටුණු අතර, දේශීය අංශයේ ප්‍රාග්ධන ගිණුම වැඩිවීම සම්පූර්ණයෙන් සමහන් විය. වෙනත් ප්‍රාග්ධන ලැබීම්ද මූලික ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 17 කින් අඩු විය. 1971/72 දී වෙනත් ප්‍රාග්ධන ලැබීම් රුපියල් දශලක්ෂ 21 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්,ලංකා විදුලි බල මණ්ඩලයෙන් අත්තිකාරම් ආපසු ගෙවීම මෙම වර්ෂය තුළදී වැඩි වෙතැයි අපේක්ෂා කරනු ලැබීය.

3. වියදම

1970/71 මුදල් වසරේදී රජයේ මුළු වියදම රුපියල් දශලක්ෂ 4,143 ක් වන අතර එය රුපියල් දශලක්ෂ 4,035 ක් වන සම්මත වියදමෙන් හා රුපියල් දශලක්ෂ 108 ක් වන "අත්තිකාරම් ගිණුම්" ගෙවුම්වලින්ද සමන්විත වේ. මෙය ඉකුත් වසරේ මුළු වියදමට වඩා සියයට 7 ක නැතහොත් රුපියල් දශලක්ෂ 257 ක වැඩිවීමක් නිරූපනය කරයි. ප්‍රාග්ධන සම්මතයන් යටතේ, වියදමේ වූ රුපියල් දශලක්ෂ 2 ක සුළු පහළයාමක් මගින් සහ අත්ති-කාරම් ගිණුම් යටතේ වියදමේ වූ රුපියල් දශලක්ෂ 93 ක තියුණු පහළ බැසීමක් මගින් තරමක් සමහන් කළ පුනරාවර්තන සම්මතයන් යටතේ වූ රුපියල් දශලක්ෂ 352 ක වියදමේ ඉහළයාමක් මෙම වැඩිවීමට හේතු විය. නියම (තාවකාලික) වියදම්ද සියයට 2 කින් නැතහොත් රුපියල් දශලක්ෂ 85 කින් අය වැය ඇස්තමේන්තු ඉක්මවා යයි. ප්‍රාග්ධන-සම්මතයන් යටතේ වියදමේ සිදුවූ රුපියල් දශලක්ෂ 159 ක පහළයාමක් මගින් තරමක් සමහන් කරන ලද, අය-වැය වාර්තාවෙන් වෙන් කිරීමක් නොකළ, අත්තිකාරම් ගිණුම් යටතේ වූ රුපියල් දශලක්ෂ 108 ක ශුද්ධ ගෙවීමක් සහ පුනරාවර්තන සම්මතයන් යටතේ රුපියල් දශලක්ෂ 136 ක වියදමේ ඉහලයාමක් මෙම වැඩිවීමට හේතුවේ.

1969/70 සිට 1971/72 දක්වා වන මුදල් වර්ෂයන් සඳහා වියදම් පිළිබඳ විස්තර II (ඊ) 5 සංඛ්‍යා සටහනින් නිරූපණය කරයි.

II (ඊ) 5 වැනි සංඛ්‍යා සටහන

රජයේ වියදම 1969/70 සිට 1970/71 දක්වා

රුපියල් දශලක්ෂ

ශීර්ෂ	1969–70	1970–71		1971–72 මුල් ඇස්තමේන්තු	
		මුල් ඇස්ත මේන්තු	තාවකාලික	12 මසක කාලච්ඡේදය සඳහා*	15 මසක කාලච්ඡේදය සඳහා
1. සම්මත වියදම	3,685	4,058	4,035	4,494	5,618
1. 1. පුනරාවර්තන වියදම[1] ..	2,873	3,089	3,225	3,546	4,432
1. 2. ප්‍රාග්ධන වියදම[1] ..	812	969	810	949	1,186
2. අත්තිකාරම් ගිණුම් කටයුතු ..	201	—	108	100	125
3. මුළු වියදම	3,386	4,058	4,143	4,594	5,743

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* අනුපාත පදනමක් යටතේ.

1. II (ඊ) 1 සංඛ්‍යා සටහනේ (ආ) පාද සටහන බලන්න.

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහන පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් උදෙසා අය-වැය වාර්තා වෙන් කරන ලද වෙන්කිරීම් පෙන්නුම් කරයි. 1970/71 මුදල් වර්ෂය තුළදී සම්මත කරගත් අතිරේක ඇස්තමේන්තු පුනරාවර්තන සම්මතයන් යටතේ රුපියල් දශලක්ෂ 209 කින්ද, ප්‍රාග්ධන සම්මතයන් යටතේ රුපියල් දශලක්ෂ 124 කින්ද සමන්විත වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1970/71 දී පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් මුළු වෙන්කිරීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 3298 ක් හා රුපියල් දශලක්ෂ 1093 ක් ද වේ.

1971/72 වසරේ මූලික ඇස්තමේන්තු රුපියල් දශලක්ෂ 4594 ක මුළු වියදමක් (අනුපාත පදනම අනුව) මාස 12 ක් සඳහා වෙන් කරයි. මාස 15 ක කාලපරිච්ඡේදයක් සඳහා ඇස්ත-මේන්තු ගත මුළු වියදම් රුපියල් දශලක්ෂ 5743 කි. 1971/72 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද අනුපාතගත මුළු වියදම 1970/71 වසරේ නියම (තාවකාලික) වියදමට වඩා රුපියල් දශලක්ෂ 451 කින් වැඩිය. තවද මූලික ඇස්තමේන්තු මගින් පුනරාවර්තන සම්මතයන් යටතේ වියදමේ රුපියල් දශලක්ෂ 321 කද, ප්‍රාග්ධන සම්මතයන් යටතේ වියදමේ රුපියල් දශලක්ෂ 139 කද, 1970/71 ඒ ඒ සම්මතයන් යටතේම දක්වෙන නියම (තාවකාලික) ඇස්ත-මේන්තු සමඟ සසඳන විට වැඩිවීමක් පෙන්වයි. මීට පෙර මෙන්, නොව අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳව අපේක්ෂිත ශුද්ධ ගෙවුම් සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 100 ක ප්‍රමාණයක්ද මූලික ඇස්තමේන්තු මගින් සැපයේ.

11 උපලේඛනයේ 36 වෙනි සංඛ්‍යා සටහනේ රජයේ වියදම පිළිබඳ වූ ආර්ථික හා කාර්‍යාත්මක වර්ගීකරණයක් දක්වේ. යථෝක්ත වර්ගීකරණයට අනුව වර්තන වියදම රුපියල් දශලක්ෂ 3,084 ක් වන අතර, ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 800 කි. රුපියල් දශලක්ෂ 109ක් වන අත්තිකාරම් ගිණුම්වල ගෙවීමද එකට ගත් කල මුළු වියදම රුපියල් දශලක්ෂ 3992 කට ගැනේ. ඉකුත් මුදල් වසරේදී මුළු වියදම රුපියල් දශලක්ෂ 3917 ක් විය. මෙයින් රුපියල් දශලක්ෂ 2825 ක් වර්තන වියදම් වූ අතර, රුපියල් දශලක්ෂ 883 ක් ප්‍රාග්ධන වියදම් වේ. ඉතිරි රුපියල් 208 ක ප්‍රමාණය අත්තිකාරම් ගිණුම් පිළිබඳ වූ ශුද්ධ ගෙවීමකි. ඉකුත් වසරේදී රුපියල් දශලක්ෂ 339 හෝ සියයට 9 ක වැඩිවීම සැළකිල්ලට ගත්කල 1970/71 දී මුළු වියදම රුපියල් දශලක්ෂ 75 කින් නැතහොත් සියයට 2 කින් වර්ධනය විය.

(i) වර්තන වියදම

1969/70 දී රුපියල් දශලක්ෂ 208 ක හෝ සියයට 8 ක ඉහලයාමක් සටහන් වූ රජයේ වර්තන වියදම 1970/71 දී තවත් රුපියල් දශලක්ෂ 259 කින් හෝ සියයට 9 කින් ඉහල ගියේය. 1971/72 දී (මාස 12) වර්තන වියදම අනුපාතිකව රුපියල් දශලක්ෂ 244 කින් හෝ සියයට 8 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. පසුගිය වසර තුන සහ 1971/72 වර්ෂයේ වර්තන වියදම් පිළිබඳ විස්තර පහත II (ඊ) 6 වෙනි සංඛ්‍යා සටහනින් සම්පිණ්ඩනාත්මකව දක්වනු ලැබේ.

(අ) පරිපාලනය

සිවිල් පරිපාලන සහ ආරක්ෂක කටයුතු වෙනුවෙන් වර්තන වියදම 1970/71 දී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 11 කින් හා රුපියල් දශලක්ෂ 84 කින් ඉහළ ගියේය. 1970/71 දී දෙගුණ-යක් පමණ වූ ආරක්ෂක වියදමේ වූ වැඩිවීම ප්‍රධානවශයෙන්ම, ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් පැන නැගුණු වැඩිවූ වියදම්වල ප්‍රතිඵලයකි. මෙම වියදමෙන් වැඩි කොටසක් වාහන හා උපකරණ මිලදී ගැනීම සඳහා විය. සන්නද්ධ සේවා වලට අළුතින් බඳවා ගන්නවුන් සම්බන්ධයෙන් වූ, වැඩි වූ වැටුප් ගෙවීම් සඳහා ඉතිරි කොටස වැය විය. පොලීසියට හා බන්ධනාගාර සේවා උදෙසා වූ ඉහළ වියදම සිවිල් පරිපාලනය සඳහා වූ වියදමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවේ. 1970/71 වසරේ මුළු වර්තන වියදම්වලින් සියයට 16 ක් පරිපාලන වියදම් සඳහා විය. 1971/72 දී පරිපාලනය සඳහා වූ වර්තන වියදම තවත් රුපියල් දශලක්ෂ 56 කින් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙකී ඉහලයාමෙන් වැඩි කොටසක් පසුගිය වසර කිහිපය පුරාම මුළු වර්තන වියදම තුළ සිවිල් පරිපාලනය පිළිබඳ සංරචකයෙහි සිදුවූ ක්‍රමානුකූල වර්ධනයෙහි ප්‍රතිඵලයකි.

(ආ) සමාජසේවා

1968/69 දී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 46 ක හා රුපියල් දශලක්ෂ 90 ක වැඩිවීම් හා සසඳන විට 1970/71 දී රුපියල් දශලක්ෂ 14 කින් පමණක් (නැතහොත් සියයට දෙකකින්) සමාජසේවා සඳහා වූ වර්තන වියදම වැඩි වී තිබේ. 1970/71 දී සිදුවූ වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 11 ක හා සෞඛ්‍ය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 2 ක වැඩිවීම හේතු විය. සමාජසේවා වෙනුවෙන් වර්තන වියදම 1970/71 දී මුළු වර්තන වියදමෙන් $\frac{1}{4}$ ක් පමණ විය. 1971/12 දී සමාජ සේවා සඳහා වර්තන වියදම රුපියල් දශලක්ෂ 61 කින් නැතිනම් සියයට 8 කින් ඉහල යනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබේ.

II (ඒ) 6 වැනි සංඛ්‍යා සටහන
1968/69 සිට 1971/72 දක්වා රජයේ වර්තන වියදම් (අ)

ශීර්ෂය	1968/69		1969/70		1970/71				1971/72 (මුල්)		
					මුල්		තාවකාලික		මාස 12 ක් සඳහා*	මාස 15 ක් සඳහා	
	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ	ප්‍රතිශතය
1. පරිපාලනය	343·2	13·1	410·4	14·5	429·6	14·3	504·8	16·4	560·9	701·1	16·9
1·1 සිවිල්	260·5	10·0	318·4	11·3	332·6	11·1	329·2	10·7	411·2	514·0	12·4
1·2 ආරක්ෂක	82·7	3·1	92·0	3·3	97·0	3·2	175·6	5·7	149·7	187·1	4·5
2. සමාජසේවා කටයුතු	642·9	24·6	732·9	25·9	752·1	25·0	746·6	24·2	807·5	1009·4	24·3
2·1 අධ්‍යාපනය	410·6	15·7	472·4	16·7	484·6	16·1	483·4	15·7	526·3	657·9	15·8
2·2 සෞඛ්‍යය	210·0	8·0	235·7	8·3	240·1	8·0	238·1	7·7	252·2	315·2	7·6
2·3 වෙනත්	22·3	0·9	24·8	0·9	27·4	0·9	25·1	0·8	29·0	36·3	0·9
3. ආර්ථික සේවා කටයුතු	120·1	4·6	130·3	4·6	161·0	5·4	151·9	4·9	150·9	188·6	4·5
3·1 කෘෂිකර්මය සහ වාරිමාර්ග ..	57·0	2·2	66·5	2·4	78·4	2·6	75·0	2·4	76·0	95·0	2·3
3·2 ජණිවුඩ හුවමාරු	26·5	1·0	24·2	0·9	31·7	1·1	29·7	1·0	29·8	37·3	0·9
3·3 වෙනත්	36·6	1·4	39·6	1·4	50·9	1·7	47·2	1·5	45·1	56·3	1·4
4. වෙළෙඳ ව්‍යවසායයන්ගේ දළ ගෙවීම් ..	301·0	11·5	249·9	8·8	250·0	8·3	251·0	8·1	257·5	321·9	7·7
5. අන්තර් දෙපාර්තමේන්තුමය ගෙවීම් ..	4·0	0·2	4·3	0·2	4·5	0·2	4·7	0·2	4·0	5·0	0·1
6. සංක්‍රාම ගෙවීම්	1205·9	46·1	1257·1	44·5	1372·6	45·6	1409·0	45·7	1523·4	1904·2	45·8
6·1 පිහිටාධාර	673·6	25·7	622·8	22·0	665·6	22·1	652·2	21·1	728·6	910·7	21·9
ඉන්: ආහාර පිහිටාධාරය	(625·2)	(23·9)	(574·3)	(20·3)	(614·4)	(20·4)	(601·4)	(19·5)	(658·2)	(822·8)	(19·8)
6·2 රාජ්‍ය ණය පොළී	206·2	7·9	253·3	9·0	309·0	10·3	336·5	10·9	387·3	484·1	11·6
6·3 විශ්‍රාම් වැටුප්	161·1	6·1	182·9	6·5	186·5	6·2	224·8	7·3	227·8	284·8	6·8
6·4 ගෘහ්‍ය	40·4	1·5	63·1	2·2	59·3	2·0	50·8	1·6	54·3	67·9	1·6
6·5 ප්‍රාදේශීය බලමණ්ඩල	61·9	2·4	58·9	2·0	60·8	2·0	60·2	2·0	61·8	77·2	1·9
6·6 වෙනත්	62·7	2·4	76·1	2·7	91·4	3·0	84·5	2·7	63·6	79·5	1·9
7. මුළු ගණන	2617·1	100·0	2825·0(ආ)	100·0	3009·3(ආ)	100·0	3084·0(ආ)	100·0	3328·3	4160·4(ආ)	100·0

* අනුපාත පදනමක් යටතේ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) II පරිශිෂ්ටයෙහි 31 සහ 36 (අ) සටහනේවූ පා සටහන් බලන්න.

(ආ) 1969/70 යඳහා රුපියල් දශ ලක්ෂ 40·1, 1970/71 (මුල්) සඳහා රුපියල් දශලක්ෂ 39·5 ක්ද 1970/71 (තාවකාලික) සඳහා රුපියල් දශලක්ෂ 16·0 ක හා 1971/72 රුපියල් දශලක්ෂ 30·2 ක්ද වෙන් කල නොහැකි වූ වි·වි·හි·ස· වියදම ඇතුළත් වෙයි.

(ඇ) ආර්ථික සේවා

1970/71 දී ආර්ථික සේවා සඳහා වර්තන වියදම රුපියල් දශලක්ෂ 152 වූ අතර, එම ප්‍රමාණය ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 22 ක නැතහොත් සියයට 17 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එම ඉහළයාම ප්‍රධාන වශයෙන්ම, කෘෂිකර්මය හා වාරිමාර්ග වෙනුවෙන් රුපියල් දශලක්ෂ 9 කින්ද, ගමනාගමනය උදෙසා රුපියල් දශලක්ෂ 6 කින්ද වූ වැඩි වීම්වලින් සමන්විතය. 1970/71 දී මුළු වර්තන වියදමෙන් ආර්ථික සේවාවන් සඳහා කෙරෙන වියදම සියයට 5 කි. 1971/72 දී ආර්ථික සේවා සඳහා වර්තන වියදම සුළු වශයෙන් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) වෙළඳ ව්‍යවසායයන්ගේ දළ ගෙවීම්

දුම්රිය, තැපැල් සහ විදුලි සංදේශ සහ වරායවල් ඇතුළත් වන රජයේ වෙළඳ ව්‍යවසායයන් විසින් කරන ගෙවීම් ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 1 ක පමණක් වැඩිවීමක් සටහන් කෙරිණි. 1971/72 දීද රජයේ වෙළඳ ව්‍යවසායයන් විසින් කරන ගෙවුම් සමාලෝචිත වර්ෂයේ මට්ටමෙම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඉ) වර්තන සංක්‍රාම

1970/71 දී මුළු වර්තන වියදමෙන් සියයට 46 ක් වූ වර්තන සංක්‍රාම ඉකුත් වර්ෂයට යට වඩා රුපියල් දශලක්ෂ 152 කින් වැඩිවිය. 1969/70 දී එය රුපියල් දශලක්ෂ 51 කින් වැඩි වී තිබුණි. 1970/71 දී සිදුවූ මේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රාජ්‍ය ණය පොළී (රුපියල් දශලක්ෂ 83), විශ්‍රාම වැටුප් (රුපියල් දශලක්ෂ 42) සහ ආහාර සහනාධාර (රුපියල් දශලක්ෂ 27) යන්ය. යථෝක්ත ඉහලයාම් වලින් කොටසක් ගෘහ්‍ය අංශයට වූ සංක්‍රාමීය යන්ගේ රුපියල් දශලක්ෂ 12 ක පහළ යාමකින් සමහන් විය. රාජ්‍ය ණය සම්බන්ධයෙන් වූ රුපියල් දශලක්ෂ 83 ක පොළී ගෙවීම් අළුතින් ගත් ණය උදෙසා ගෙවිය යුතු ඉහළ ගිය පොළී අනුපාතිකය මගින් මෙන්ම බලාපොරොත්තු වූවාට වඩා ගත් ණය ප්‍රමාණයේ ප්‍රති ඵලයක් විය. වයස අවුරුදු 55 දී විශ්‍රාම ගැන්වීමේ නීතිය වලංගු බවට පත්වීම හේතු කොට ගෙන පාරිතෝෂික හා විශ්‍රාම ගෙවීම්, විශ්‍රාම වැටුප්වල ඇති වූ වැඩිවීම විස්තර කරයි. ආහාර සහනාධාර වැඩිවීමට හේතු වූ සාධක 'ශුද්ධ ආහාර පිඟිටාධාරය'යන කොටසේ විස්තරාත් මකව දක්වනු ලැබේ.

1971/72 දී වර්තන සංක්‍රාමයන් රුපියල් දශලක්ෂ 114 කින් නැතහොත් සියයට 8 කින් වැඩිවෙතැයි අපේක්ෂා කෙරෙන අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතුවනුයේ, පිඟිටාධාරවල රුපියල් දශලක්ෂ 76 ක වැඩිවීමක් (ආහාර සහනාධාරය මෙයින් රුපියල් දශලක්ෂ 57 වේ.) සහ රාජ්‍ය ණය පොළී වෙනුවෙන් රුපියල් දශලක්ෂ 51 ක වැඩිවීමකුත්ය. 'වෙනත් සංක්‍රාමයන්' යටතේ රුපියල් දශලක්ෂ 21 ක පහළ යාමක් මගින් ඉහත දක්වූ වැඩිවීම්වල බලපෑම තරමක් සමහන් විය. විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් වෙන්කළ රුපියල් දශලක්ෂ 3 ක වැඩිවීම පසුගිය වසරවල වැඩිවීම සමහ සසඳන විට පහත් මට්ටමක ඇති බව පෙනේ.

(ii) ප්‍රාග්ධන වියදම

පහත II (ඊ) 7 සංඛ්‍යා සටහනින් නිරූපණය කෙරෙන පරිදි, 1970/71 දී රජයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 800 ක් වේ. එය සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 84 කින් නැතිනම් සියයට 10 කින් පහත වැටුණි. 1969/70 දී ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 27 ක හෝ සියයට 3 ක පහළයාමක් සටහන් කෙරිණි. මීට ප්‍රති විරුද්ධව, 1969/70 වර්ෂයෙන් අවසන්වන පූර්ව පස් වසර තුළදී ප්‍රාග්ධන වියදම වාර්ෂිකව සියයට 14 ක (සංයුක්ත) අනුපාතිකයකින් වැඩිවී තිබේ.

1970/71 දී ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 437 ක් වන (නැතහොත් සියයට 55) රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමෙන්ද, රුපියල් දශලක්ෂ 320 ක් වන (නැතහොත් සියයට 40 ක්) ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන් සහ රුපියල් දශලක්ෂ 43 ක් (නැතහොත් සියයට 5 ක්)

II (ඊ) 7 වැනි සංඛ්‍යා සටහන

1968/69 - 1971/72 - රජයේ ප්‍රාග්ධන වියදම්(අ)

ශීර්ෂ	1968/69		1969/70		1970/71				1971/72 (මුල්)		
					මුල		තාවකාලික		මාස 12ක් සඳහා*	මාස 15 ක් සඳහා	
	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය
1· මූර්ත වත්කම් ලබාගැනීම සහ නඩත්තු කිරීම	526·2	57·8	518·0	58·7	784·5	65·7	436·5	54·6	773·4	966·7(ආ)	64·7
1·1 සිවිල් පාලන කටයුතු	16·7	1·8	19·4	2·2	18·8	1·6	21·6	2·7	45·9	57·3	3·8
1·2 සමාජ සේවා ..	112·9	12·4	120·6	13·7	202·6	17·0	103·1	12·9	196·8	246·0	16·5
1·2·1 අධ්‍යාපනය ..	31·6	3·5	40·1	4·5	68·2	5·7	43·6	5·4	64·1	80·1	5·4
1·2·2 සෞඛ්‍ය ..	37·5	4·1	38·0	4·3	47·3	4·0	27·7	3·5	38·8	48·5	3·2
1·2·3 නිවාස ..	35·8	3·9	34·1	3·9	50·0	4·2	14·0	1·8	60·3	75·4	5·0
1·2·4 අනෙකුත් ..	8·0	0·8	8·4	1·0	37·1	3·1	17·8	2·2	33·6	42·0	2·8
1·3 ආර්ථික සේවා ..	396·6	43·6	378·0	42·8	548·8	45·9	310·2	38 8	515·8	644·7	43·1
1·3·1 කෘෂිකර්මය සහ වාරිමාර්ග ..	168·1	18·5	172·8	19·6	250·8	21·0	131·5	16·4	185·4	321·7	15·5
1·3·2 ධීවර කර්මාන්තය .	0·1	...	1·0	0·1	18·3	1·5	3·3	0·4	8·2	10·2	0·7
1·3·3 නිෂ්පාදනය සහ පතල් කටයුතු .	5·0	0·5	8·8	1·0	16·6	1·4	5·0	0·6	23·4	29·3	2·0
1·3·4 වෙළඳාම ..	13·9	1·5	7·0	0·8	34·2	2·9	19·5	2·4	23·6	29·5	2·0
1·3·5 පණිවුඩ හුවමාරුව ..	170·0	18·7	185·1	21·0	228·9	19·2	150·9	18·9	275·2	344·0	23·0
1·3·6 බලය ..	39·5	4·3	3·3	0·4	—	—	—	—	—	—	—
2· ප්‍රාග්ධන සංක්‍රාම ..	332·4	36·5	319·5	36·2	357·7	29·9	320·3	40·1	375·3	469·1	31·4
2·1 පලාත් පාලන ආයතන	14·0	1·5	15·5	1·8	15·5	1·3	15·5	1·9	15·3	19·1	1·3
2·2 පොදු සමායතන ..	285·6	31·4	282·8	32·0	317·0	26·5	281·4	35·2	325·4	406·8	27·2
2·2·1 කෘෂිකර්මය සහ වාරිමාර්ග ..	70·0	7·7	77·2	8·7	161·1	13·5	118·1	14·8	161·8	202·3	13·5
2·2·2 ධීවර ..	16·7	1·8	14·1	1·6	11·0	0·9	11·0	1·4	17·6	22·0	1·5
2·2·3 නිෂ්පාදනය සහ පතල් කටයුතු .	182·8	20·1	175·5	19·9	116·9	9·8	118·2	14·8	109·0	136·3	9·1
2·2·4 අනෙකුත් ..	16·2	1·8	16·0	1·8	28·0	2·3	34·2	4·3	37·0	46·3	3·1
2·3 අනෙකුත් ..	32·8	3·6	21 2	2·4	25·2	2·1	23·4	2·9	34·6	43·2	2·9
3· මූල්‍ය වත්කම් ලබාගැනීම	51·2	5·6	45·6	5·2	52·3	4·4	42·8	5·4	46·8	58·5	3·7
4· එකතුව	909·8	100·0	883·1	100·0	1194.5	100·0	799·6	100·0	1195·4	1494·3	100·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* අනුපාත පදනමක් යටතේ

(අ) II පරිශිෂ්ඨයේ 31 සහ 36 වෙනි සංඛ්‍යා සටහන්හි පා සටහන් බලන්න.

(ආ) 1970/71 (තාවකාලික) සඳහා රුපියල් දශලක්ෂ 1·6 ක් සහ 1971/72 සඳහා රුපියල් දශලක්ෂ 18·7 ක් වූ බෙදා නොහරින ලද වී.වී.හි.ස. වියදම් ඇතුලත්ය.

මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීමෙන්ද සමන්විත වේ. ඉකුත් වර්ෂයේදී මීට අදළ දත්තයන් පිළිවෙළින් රුපියල් දශලක්ෂ 518 ක් (නැතහොත් සියයට 59) රුපියල් දශලක්ෂ 320 ක් (නැතහොත් සියයට 36ක්) සහ රුපියල් දශලක්ෂ 46 ක් (නැතහොත් සියයට 5 ක්) වේ. 1970/71 දී වූ රුපියල් දශලක්ෂ 84 ක ප්‍රාග්ධන වියදමේ පහත බැසීම රජයේ දෙපාතිමේන්තු වල ප්‍රාග්ධන වියදමේ වූ රුපියල් දශලක්ෂ 82 ක සහ මූල්‍ය වත්කම් අත්පත් කරගැනීමේ රුපියල් දශලක්ෂ 3 ක පහළ යාම් නිසා සිදුවිය. ඉකුත් මුදල් වර්ෂයේදී මෙන්ම ප්‍රාග්ධන සංක්‍රාම එම මට්ටමේම තිබුණි. ඉකුත් මුදල් වර්ෂයේදී ප්‍රාග්ධන වියදමේ වූ රුපියල් දශලක්ෂ 27 ක පහළයාම රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමේ රුපියල් දශලක්ෂ 8 පහළයාම කින්ද ප්‍රාග්ධන සංක්‍රාමයෙන්ගේ රුපියල් දශලක්ෂ 13 ක පහළ යාමකින් හා මූල්‍ය වත්කම් අත්කර ගැනීමේදී වූ රුපියල් දශලක්ෂ 6 ක පහළ යාමකින් සමන්විත වේ

1971/72 දී ඇස්තමේන්තු ගත දළ ප්‍රාග්ධන වියදම (මාස 12 ක) රුපියල් දශලක්ෂ 1195 ක් වෙතැයි අපේක්ෂා කෙරේ. මෙය, ආසන්න වශයෙන් 1970/71 සංඛ්‍යාවට වඩා රුපියල් දශලක්ෂ 396 ක නැතහොත් සියයට 50 කආසන්න ඉහළයාමකි. ඇස්තමේන්තු කරනලද ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 773 ක් වන රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමෙන්ද, රුපියල් දශලක්ෂ 375 ක් වන ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන්ද රුපියල් දශලක්ෂ 47 ක් වන මූල්‍ය වත්කම් අත්පත් කරගැනීමෙන්ද සමන්විතය. එම වැඩිවීමෙන් වැඩි කොටස රුපියල් දශලක්ෂ 337 ක් රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් පිළිබඳව වන අතර, ප්‍රාග්ධන සංක්‍රාමයන් සහ මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම්ද පිළිවෙලින් රුපියල් දශලක්ෂ 55 කින් සහ රුපියල් දශලක්ෂ 4 කින් වැඩිවෙතැයි අපේක්ෂා කෙරේ.

(අ) රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම

1970/71 දී රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 82 කින් නැතහොත් සියයට 16 කින් අඩුවී රුපියල් දශලක්ෂ 437 විය. මෙම පහළ යාමට ප්‍රධාන හේතුව වූයේ, ආර්ථික සේවා වෙනුවෙන් කරන වියදමේ රුපියල් දශලක්ෂ 68 ක හා සමාජසේවා සඳහා කරන වියදමේ රුපියල් දශලක්ෂ 18 ක පහළ යාමය. යථොක්ත පහළයාම සිවිල් පරිපාලනය සඳහා වූ වියදමේ රුපියල් දශලක්ෂ 2 ක වැඩිවීමක් මගින් සමහන් විය. ආර්ථික සේවා සඳහා වූ පහත වැටුණු වියදමට කෘෂිකර්මය හා වාරිමාර්ග සඳහා වියදමේ රුපියල් දශලක්ෂ 41 ක ගමනාගමනය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 34 ක සහ නිෂ්පාදනය හා පතල් කර්මාන්තය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 4 ක පහළයාමක් ප්‍රධාන වශයෙන් හේතුවේ. මෙම පහළයාමෙන් කොටසක් වෙළඳාමේ වූ රුපියල් දශලක්ෂ 13ක වැඩිවීමකින් සමහන් විය. නිවාස සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 20 ක හා සෞඛ්‍යය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 10 ක පහළ යාමක්ද අඩංගු වන සමාජසේවා වෙනුවෙන් වූ රුපියල් දශලක්ෂ 18 ක පහළයාම, අධ්‍යාපනය වෙනුවෙන් වූ රුපියල් දශලක්ෂ 4 ක සහ 'වෙනත්' සේවාවන් යටතේ වූ රුපියල් දශලක්ෂ 9 ක ඉහළ යාමක් මගින් තරමක් සමහන් විය.

1971/72 දී රජයේ දෙපාර්තමේන්තුවල ඇස්තමේන්තු කර ඇති රුපියල් දශලක්ෂ 773 ක්වූ ප්‍රාග්ධන වියදම (මාස 12 ක්) රුපියල් දශලක්ෂ 46 ක් සිවිල් පරිපාලන සඳහාද, රුපියල් දශලක්ෂ 197 ක් සමාජ සේවා සඳහාද, රුපියල් දශලක්ෂ 516 ක් ආර්ථික සේවා සඳහාද වූ වියදම්වලින් සමන්විතවෙයි. 1971/72 දී රුපියල් දශලක්ෂ 337 කින් වැඩි වෙතැයි අපේක්ෂිත රජයේ දෙපාර්තමේන්තු වල ප්‍රාග්ධන වියදම, රුපියල් දශලක්ෂ 206 ක් ආර්ථික සේවා සඳහාද, රුපියල් දශලක්ෂ 94 ක් සමාජසේවා සඳහාද, රුපියල් දශලක්ෂ 24 ක් සිවිල් පරිපාලනය සඳහාද වූ වැඩි වූ වියදම්වලින් සමන්විත වෙයි. සිවිල් පරිපාලන ප්‍රාග්ධන වියදම වැඩිවීමට හේතුවී ඇත්තේ, වාහන හා ගුවන් විදුලි උපකරණ මිළදී ගැනීමට රුපියල් දශලක්ෂ 15 ක ප්‍රමාණයක් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් වෙන්කර ඇති නිසාය. රුපියල් දශලක්ෂ 94 කින් වැඩි වුන සමාජසේවා පිළිබඳ ප්‍රාග්ධන වියදම අධ්‍යාපනය සඳහා රුපියල් දශලක්ෂ 21 කින්ද සෞඛ්‍යය සඳහා රුපියල් දශලක්ෂ 11 කින්ද, නිවාස සඳහා රුපියල් දශලක්ෂ 46 කින්ද, සහ වෙනත් සේවා සඳහා රුපියල් දශලක්ෂ 16 කින්ද, වැඩිවන

වියදම්වලින් සමන්විත වෙයි. ආර්ථික සේවා සඳහා ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 206 කින් වැඩි වන්නේ ගමනාගමනය සඳහා රුපියල් දශලක්ෂ 124 කින්ද, කෘෂිකර්මය හා වාරි මාර්ග සඳහා රුපියල් දශලක්ෂ 54 කින්ද, නිෂ්පාදනය හා පතල් කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 18 කින්ද වැඩිවන වියදම් නිසාය.

(ආ) ප්‍රාග්ධන සංක්‍රාම

1970/71 දී, රජයේ ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශලක්ෂ 320 ක් විය. ඒවා ඉකුත් වර්ෂයේ පැවති මට්ටමෙහිම පැවතිණ. ඉකුත් වර්ෂවලදී මෙන්ම, මුළු ප්‍රාග්ධන සංක්‍රාම වලින් (රුපියල් දශලක්ෂ 281 ක් නැතහොත් සියයට 88) වැඩි කොටසක් පොදු සමායතන වලට ලැබුණ අතර, පළාත්පාලන ආයතන සහ 'අනෙකුත්' යන ශීර්ෂයන් සඳහා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 16 ක් හා රුපියල් දශලක්ෂ 23 ක් ලැබුණි. 1971/72 දී ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන්, රුපියල් දශලක්ෂ 375 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් පොදු සමායතන සඳහා පැවරිය යුතු කොටස රුපියල් දශලක්ෂ 325 ක් නැතහොත් සියයට 87 කි.

1970/71 දී කෘෂිකාර්මික අංශයේ හා කර්මාන්ත අංශයේ පොදු සමායතන වලට ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශලක්ෂ 118 ක් විය. කෘෂිකාර්මික අංශයෙහි වූ සමායතන වලට ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශලක්ෂ 41 ක වැඩිවීමක් පෙන්වූ අතර කර්මාන්ත අංශයේ එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 57 කින් පහත බැසිණි. කෘෂිකාර්මික අංශයේ වැඩි වූ සංක්‍රාමයන්ට ප්‍රධාන හේතුව වූයේ, මහවැලි සංවර්ධන මණ්ඩලයට දෙන ලද රුපියල් දශලක්ෂ 48 ක මූලික දීමනාවයි. කර්මාන්ත අංශයෙහි සමායතන වල සංක්‍රාම අඩුවීමට හේතුවූයේ ජාතික පේෂකර්ම සංස්ථාව, (රුපියල් දශලක්ෂ 34) නැගෙනහිර කඩදසි සංයුක්ත මණ්ඩලය, (රුපියල් දශලක්ෂ 12) ලංකා තුනීලැලි සංයුක්ත මණ්ඩලය, (රුපියල් දශලක්ෂ 8) හා රාජ්‍ය පොහොර සංස්ථාව. (රුපියල් දශලක්ෂ 11) යන සමායතනවලින් අඩුවූ දයක දීමනාවන්ය. රාජ්‍ය මැණික් සංස්ථාවට ගෙවන ලද රුපියල් දශලක්ෂ 15 ක මූලික දීමනාව නිසා මෙම අඩුවීම තරමක් දුරට සමඟන් විය. ධීවර අංශයට ප්‍රාග්ධන සංක්‍රාමයන් රුපියල් දශලක්ෂ 11 කින් වැඩි විය.

කෘෂිකාර්මික අංශයේ සමායතනයන්ට 1971/72 දී ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශලක්ෂ 44 කින් වැඩි වෙතැයි අපේක්ෂා කරන අතර, කර්මාන්ත අංශයේ ඒවායේ රුපියල් දශලක්ෂ 9 ක අඩුවීමක් අපේක්ෂා කෙරේ; කෘෂිකාර්මික අංශයේ රුපියල් දශලක්ෂ 44 ක වැඩිවීමකට ප්‍රධාන හේතුව වූයේ, මහවැලි සංවර්ධන මණ්ඩලයට ප්‍රදානය කරන ලද රුපියල් දශලක්ෂ 38 ක අමතර වෙන් කිරීමයි. කෘෂිකාර්මික අංශයේ පොදු සමායතනයන් පසුගිය මුදල් වර්ෂය තුළ මුළු ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන් වැඩි අනුපාතයක් ලැබීමේ උපනතියක් ඇත.

(ඇ) මූල්‍ය වත්කම් ලබාගැනීම

1970/71 දී මූල්‍ය වත්කම් ලබාගැනීම සඳහා රජය දැරූ වියදම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 3 ක අඩුවීමක් පෙන්වමින්, රුපියල් දශලක්ෂ 43 ක් විය. රජය පවරාගත් ප්‍රධාන මූල්‍ය වත්කම් වූයේ, ජාතික නිවාස අරමුදලට දුන් රුපියල් දශලක්ෂ 20 ක ණය හා 'දේශීය ණය හා සංවර්ධන අරමුදලින්'' දුන් රුපියල් දශලක්ෂ 10 ක ණයෙහි ප්‍රතිඵලයකි. 1971/72 දී රුපියල් දශලක්ෂ 47 ක් වන අපේක්ෂිත මූල්‍ය වත්කම් අත්කරගැනීම ජාතික නිවාස අරමුදලට හා දේශීය ණය හා සංවර්ධන අරමුදලට බලාපොරොත්තු වන රුපියල් දශලක්ෂ 20 සහ රුපියල් දශලක්ෂ 10 ක ණය ඇතුලත්වේ.

4. ශුද්ධ ආහාර පිහිටාධාරය

පසුගිය කාලයේදී සලාක බෙදීමේ ක්‍රමය හා සහල් සහ වෙනත් ඇතැම් භාණ්ඩ පිළිබඳව ආහාර පිහිටාධාරයෙන් රජයට වන වියදම රජයේ ගිණුමේ ශුද්ධ පදනමක් යටතේ වියදම් ශීර්ෂයක් ලෙස ඉදිරිපත් කර ඇත. මෙලෙස පෙන්වා ඇති ශුද්ධ ආහාර පිහිටාධාරය ගණනය කරන ලද්දේ ප්‍රධාන වශයෙන්, සීනි හා පිටි ආනයන වලින් හා අලෙවියෙන් ලැබුණු ලාභය මුළු ආහාර පිහිටාධාරයේ වියදමින් අඩු කිරීමෙනි. 1971/72 වර්ෂය සඳහා ආදයම් හා

වියදම් ඇස්තමේන්තු වල ආහාර පිහිටාධාරයේ නියම පිරිවැය (එනම් ආහාර පිහිටාධාරය) වියදම් ශීර්ෂයක් ලෙසද දක්වා ඇත. 1971/72 ආදයම් ඇස්තමේන්තු දක්වා ඇති නව ආර්ථික හා කාර්ය පදනම් මත පිහිටමින් අතීත පිළිවෙලින් වෙනස් වී ඇත.

රජයේ දළ ආහාර පිහිටාධාරයට සළාක ක්‍රමය යටතේ ආහාර නිකුත් කිරීමට කරනු ලබන ශුද්ධ ගෙවීම් සහ සහල් හා රතුළූනු නිෂ්පාදකයින්ට ගෙවනු ලබන නිෂ්පාදන පිහිටාධාරයන්ද, අන්තර් ගතවී ඇත. දළ ආහාර පිහිටාධාරය[1] ගණනය කිරීමේදී සහල් බෙදාහැරීමේ හා අනෙකුත් වියදම්ද සැළකිල්ලට ගෙන ඇත. ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලැබෙන ලාභ ප්‍රධාන වශයෙන්,සීනි ආනයනය කිරීමෙන් හා අළෙවියෙන් ලැබෙන ලාභයෙන් සමන්විත වේ.[2]

පිටි, උම්බලකඩ, පරිප්පු හා රතුළූනු වැනි සෙසු ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමෙන් හා අලෙවියෙන් ලැබෙන ලාභ හෝ පාඩු ඕනෑම වර්ෂයක දළ ආහාර පිහිටාධාරයේ කොටසක් ලෙස හෝ ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලැබෙන ලාභ වල කොටසක් ලෙස වෙන් කොට පෙන්වා ඇත.

පහත පෙනෙන II (ඊ) 8 සංඛ්‍යා සටහනෙහි දළ ආහාර පිහිටාධාරය පිළිබඳ විස්තර හා ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ලාභ 1970/71 හා 1971/72[3] මුල් ඇස්තමේන්තු සමඟ ඉදිරිපත් කොට ඇත. ඉකුත් වර්ෂ වලදී මෙන්ම ශුද්ධ ආහාර පිහිටාධාරයද මෙම සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

(i) දළ ආහාර පිහිටාධාරය

1970/71දී දළ ආහාර පිහිටාධාරය (තාවකාලික) ඉකුත් වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 51 ක නැතහොත් සියයට 8 ක අඩුවීමට පරස්පරව රුපියල් දශලක්ෂ 27 කින් නැතහොත් සියයට 5 කින් වැඩි විය. 1969/70 දී මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ, රුපියල් දශලක්ෂ 39 කින් නැතහොත් සියයට 7 කින් සහල් පිහිටාධාරය අඩුවීමය. සමුපකාර සමිති මගින් දෙන ලද ණය ආපසු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් භාර දෙන ලද සලාක කූපන් පත් නිසාවූ රුපියල් දශලක්ෂ 8 කින්ද, බෙද හැරීමේ හා අනෙකුත් වියදම් රුපියල් දශලක්ෂ 3 කින්ද, මෙරටෙහි නිපදවන ලද රතුළූනු සඳහා දුන් සහනාධාරය රුපියල් දශලක්ෂ 2 කින් වූ අඩුවීම නිසා පහත වැටුණු දළ ආහාර පිහිටාධාරය, අමතර ආහාර ද්‍රව්‍ය සඳහා දුන් සහනාධාරය රුපියල් දශලක්ෂ 2 කින් වැඩිවීම මගින් තරමක් දුරට සමහන් වූයේය. සහල් සඳහා දුන් පිහිටාධාරය අඩුවීමට හේතු වූයේ, ආනයනය කරන ලද සහල් දිගු ටොන් එකක් ගොඩබාන අවස්ථාව වන විට පිරිවැය රුපියල් 921 සිට 780 දක්වා පහත වැටීම නිසාය. ආයාත කරන ලද සහල් නිකුත් කිරීම දිගු ටොන් 15,290 කින් වැඩි වීමද, දේශීය සහල් නිකුත් කිරීම දිගු ටොන් 19,276 කින් අඩුවීමද ආයාත කරන ලද සහල් වල මිළෙහි පහත වැටීමේ ප්‍රතිඵලය තවත් ත්‍රීව කෙරිණ. මෙරට සහල් ඒකකයක පිහිටාධාරය ආයාත කරන ලද සහල් ඒකකයකට වඩා වැඩි බව සැලකිල්ලට ගතයුතුය

---

1. සමුපකාර සමිති මගින් දෙන ලද ණය ගෙවීම් වෙනුවට යටත් කොට ඇති සහල් සලාක කූපන් පත්වල වටිනාකම 1968/69 හා 1969/70 දී අතිරේක ශීර්ෂයක් ලෙස පෙන්වා ඇත. II (ඊ) 8 වැනි සංඛ්‍යා සටහනෙහි 2 වැනි පාද සටහන බලන්න.

2. 1969/70 වන තෙක් ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ලාභවල බෙද හැරීමේ වියදම් ඇතුළත් නොවූ, පිටි විකිණීමෙන් ලැබූ ලාභ වැඩි කොටසක් විය.

3. 1971/72 වර්ෂය සඳහා (මාස 15 ක) ආහාර කොමසාරිස් වරයාගේ මුල් ඇස්තමේන්තු අවසන් ඇස්ත මේන්තු එනම්, පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති ආහාර සහනාධාරය පිළිබඳ මුල් ඇස්තමේන්තු සමග වෙනස් වේ. ආහාර කොමසාරිස් වරයාගේ මුල් ඇස්තමේන්තු සහල් පිළිබඳ සහනාධාරය රුපියල් දශලක්ෂ 40 ක අඩුවීමක් පෙන්වන අතර අවසන් ඇස්තමේන්තුවල එලෙස අඩුවීමක් නොපෙන්වයි. මෙම වර්ෂය සඳහා සීනි හා උම්බලකඩ විකිණීමෙන් ලැබෙන ලාභ වලද සුළු වෙනස්කම් මෙම ඇස්ත මේන්තු දෙකෙහි ඇත එනිසා 1971/72 වර්ෂය සඳහා වන II (ඊ) 8 සංඛ්‍යා සටහනෙහි ආහාර කොම සාරිස් වරයාගේ ඇස්තමේන්තු අනුව ශුද්ධ ආහාර පිහිටාධාරය මෙන්ම පාර්ලිමේන්තුව විසින් අනුමත අනුමත කර ඇති ඇස්තමේන්තු අනුව ශුද්ධ ආහාර පිහිටාධාරය ද වෙන් වශයෙන් දක්වයි.

II (ඊ) 8 වැනි සංඛ්‍යා සටහන

1968/69 සිට 1971/72 දක්වා ශුද්ධ ආහාර පිහිටාධාරය

රුපියල් දශලක්ෂ

ශීර්ෂ	1968/69	1969/70	1970/71		1971/72			
					මාස 12 කට*		මාස 15 කට	
			මුල් ඇස්තමේන්තු	තාවකාලික	අනුමත කරන ලද ඇස්තමේන්තු අනුව මුල් ඇස්තමේන්තු	ආහාර කොමසාරිස්ට අනුව මුල් ඇස්තමේන්තු	අනුමත කරන ලද ඇස්තමේන්තු අනුව මුල් ඇස්තමේන්තු	ආහාර කොමසාරිස්ට අනුව මුල් ඇස්තමේන්තු
I දළ ආහාර පිහිටාධාරය								
1. ආනයනය කළ සහල් වෙනුවෙන් පාරිභෝගිකයාට දෙන ලද පිහිටාධාරය[1]	276·1	254·1	524·8	515·0	597·6	564·4	747·1	705·7
2. මෙරට නිපදවූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට දුන් සහනාධාරය[1]	269·2	252·0						
එකතුව බෙදාහැරීමේ වියදම් සහ අනිකුත් ගාස්තු[2]	51·8	48·5	79·9	73·2	48·5	45·2	60·6	56·5
3. මෙරට නිපදවූ රතුළූණු වෙනුවෙන් සහනාධාර	6·8	4·6	8·5	7·2	7·2	—	9·0	—
4. අලෙවියෙන්වූ පාඩු –								
(අ) පරිප්පු	11·0	12·0	4·8	6·3	5·2	6·4	6·5	8·0
(ආ) රතුළූනු	0·6	2·0	1·0	0·2	0·1	—	0·1	—
(ඇ) පිටි බෙදා හැරීමේ වියදම් යනාදිය අඩංගුව	—	—	—	—	—	11·0	—	13·7
5. ණය ගෙවීම් වෙනුවට සමූපකාර සමිති විසින් ආපසු ලබාගත් සහල් සලාක කූපන් වල වටිනාකම	11·1	3·1	—	—	—	—	—	—
6. විවිධ ලැබීම් අඩුකළ විට	1·4	2·0	0·5	0·5	0·4	0·4	0·5	0·5
7. දළ ආහාර පිහිටාධාරය	625·2	574·3	618·5	601·4	658·2	626·6	822·8	783·4
II ආහාර ද්‍රව්‍ය අලෙවියෙන් ලාභ								
1. සීනි (බෙදා හැරීමේ වියදමේ ශුද්ධ යනාදිය)[3]	254·6	220·9	120·1	78·7	102·7	100·3	128·4	125·4
2. පිටි (බෙදා හැරීමේ වියදමේ ශුද්ධ යනාදිය)	33·9	20·3	32·2	10·8	0·4	—	0·5	—
3. උම්බලකඩ	4·4	4·1	4·1	4·1	4·1	6·7	5·1	8·4
එකතුව: සහල් සහනාධාර බදු	3·5	2·7	3·0	2·7	—	—	—	—
4. ලාභ	296·4	248·0	159·4	96·3	107·2	107·0	134·0	133·8
III ශුද්ධ ආහාර පිහිටාධාරය (1–11)	328·8	326·3	459·1	505·1	551·0	519·6	688·8	649·6

මූලය: ආහාර කොමසාරිස්

1. 1970/71 හා 1971/72 වර්ෂය සඳහා පළමු හා දෙවන සේරුව යටතේ නිකුත් කළ ප්‍රමාණයන්හි (ආයාත කළ හා මෙරට සහල්) විශ්වාසදායක ඇස්තමේන්තුවක් ලබා ගැනීමට නොහැකි විය. එහෙයින් මෙම වර්ෂ 2 සඳහා 1 හා 2 වන ශීර්ෂයන් සකස් නොකළ ඒවාය.
2. 1970/71 ට පෙර වර්ෂය සඳහා සහල්, සීනි හා තිරිඟු පිටි යන භාණ්ඩ තුන සම්බන්ධයෙන් සංඛ්‍යා ඛණ්ඩනය කොට දක්වා නොමැති හෙයින් මෙම සටහනෙහි දක්වා ඇත්තේ බෙදා හැරීමේ වියදම් පිළිබඳ මුළු වියදමය. භාණ්ඩ තුන සම්බන්ධ වියදම් 1971/72 වර්ෂය සඳහා වෙන වෙනම ඇතුලත් කොට ඇත.
3. සීනි ආනයනය කිරීම පිළිබඳ වි·වි·හි·ස· ගෙවීමේ ප්‍රතිඵලය ඇතුළත්ව ඇත.
   1970/71 මූලික ඇස්තමේන්තු (රුපියල් දශලක්ෂ 85·1) ; රුපියල් දශලක්ෂ 135·0 (තාවකාලික)
   1971/72 (මාස 15) ආහාර කොමසාරිස් අනුව මුල් ඇස්තමේන්තු (රුපියල් දශලක්ෂ 121·5) : රුපියල් දශලක්ෂ 49·6 අනුමත කරන ලද ඇස්තමේන්තු වලට අනුව මුල් ඇස්තමේන්තු

* අනුපාත පදනමක් යටතේ.

1970/71 දී දළ ආහාර පිහිටාධාරය වැඩි වූයේ, ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 27 කින් නැතහොත් සියයට 5 කින් ආයාත කරන ලද සහ මෙරට හාල් වැඩිපුර නිකුත් කිරීමට සිදු වූවද සහල් සඳහා දුන් පිහිටාධාරය වැඩි වූයේ, රුපියල් දශලක්ෂ 9 කින් හෝ සියයට 2 කින් පමණි. සලාක යටතේ නිකුත් කොට ඇති සහල් මුළු ප්‍රමාණය දිගු ටොන් 368,051 කින් වැඩි විය. කෙසේ වුවද, නිකුත් කොට ඇති මුළු ප්‍රමාණයෙන් ආයාත කරන ලද සහල් සහ මෙරට සහල් වල ප්‍රමාණය කොපමණදැයි වෙන් වශයෙන් ලබා ගැනීමට නොමැත. සහල් පිහිටාධාරයේ සුළු සාපේක්ෂ වැඩිවීමට හේතුව, නැවතත් මූලිකව ගොඩ බෑ අවස්ථාව වන විට දිගු ටොන් එකක පිරිවැය රුපියල් 780 සිට 668 දක්වා පහත වැටීමය. මෙම මිළ පහත වැටීමෙහි ප්‍රතිඵලය, සලාක යටතේ මුළු සහල් නිකුතුවේ වැඩිවීමේ ප්‍රතිවිපාකය විසින් වුවමනාවටත් වඩා සමහන් කළේය. මුළු නිකුත් කිරීමේ වැඩිවීම ප්‍රධාන වශයෙන්ම 1970 සැප්තැම්බර් 26 දින සිට අතිරේක සේරුව ශත 75 ට නිකුත් කිරීමට ගත් තීරණය නිසා වූවකි. දෙවෙනි සහල් සේරුව නිකුත් කිරීමට ගත් තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් සහල් නිකුත් කිරීම වැඩිවීම නිසා 1970/71 වර්ෂයේදී බෙද හැරීමේ වියදම් සහ වෙනත් වියදම්ද රුපියල් දශලක්ෂ 25 කින් වැඩි විය. මෙරට නිපදවනු ලබන රතුළූනු සඳහා දුන් පිහිටාධාරය රුපියල් දශලක්ෂ 3 ක වැඩිවීමක් පෙන්වූ අතර පරිප්පු සඳහා දුන් පිහිටාධාරය රුපියල් දශලක්ෂ 6 කින් අඩු විය.

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1971/72 වර්ෂයේ දළ ආහාර පිහිටාධාරය සම්බන්ධ අවසන් ඇස්තමේන්තු ආහාර කොමසාරිස් වරයා විසින් සපයා ඇති ඇස්තමේන්තු වලට වඩා වෙනස් බව සඳහන් කළ යුතුයි. එමනිසා 11 (ඊ) සංඛ්‍යා 8 සටහන ඇස්තමේන්තු දෙකෙහිම විස්තර ඉදිරිපත් කරයි.

1971/72 වර්ෂය සඳහා (මාස 12) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මූලික ඇස්තමේන්තු ඉකුත් වර්ෂයට වඩා දළ ආහාර පිහිටාධාරයේ රුපියල් දශලක්ෂ 57 ක හෝ සියයට 9 ක වැඩිවීමක් අපේක්ෂා කරයි. මෙම ඇස්තමේන්තුවට අනුව සහල් පිහිටාධාරයේ රුපියල් දශලක්ෂ 83 ක හෝ සියයට 16 ක වැඩිවීමක් අපේක්ෂා කරයි. කෙසේ වුවද, මෙම වැඩිවීම බෙදහැරීමේ වියදම රුපියල් දශලක්ෂ 25 ක අඩුවීම නිසා තරමක් දුරට සමහන් වී යයි. ඇස්තමේන්තු කර ඇති සහල් පිහිටාධාරයේ වැඩිවීමට මූලික හේතුව නම් මෙරට සහල් මිළයට ගැනීමහි අපේක්ෂිත වැඩිවීමයි. මෙම මිළයට ගැනීම 1970/71 වර්ෂයේ දිගු ටොන් 400,000 සිට 1971/72 වර්ෂයේදී දිගු ටොන් 600,000 දක්වා වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. 1971/72 වර්ෂයේදී ආයාත සහල් මිළෙහි වෙනසක් අපේක්ෂා නොකරයි. බෙද හැරීමේ වියදම්හි රුපියල් දශලක්ෂ 25 ක අඩුවීම ආහාර කොමසාරිස් වරයා විසින් ගෙන්වනු ලැබූ සියළු භාණ්ඩ සම්බන්ධ බෙද හැරීමේ ගාස්තු එක් එක් භාණ්ඩය වෙනුවෙන් වෙන වෙනම වෙන් කිරීමේ ප්‍රතිඵලයකි. සහල් සහ පිටි සම්බන්ධව වූ වියදම්ද ඇතුළුව, ආහාර කොමසාරිස් වරයා විසින් ගෙන්වනු ලැබූ සියළු භාණ්ඩ සම්බන්ධව වූ මුළු බෙද හැරීමේ වියදම්, දළ ආහාර පිහිටාධාරයේ කොටසක් ලෙස දැක්වීම පසුගිය කාලයේදී පුරුද්දක්ව තිබුණි.

ආහාර කොමසාරිස් විසින් සපයන ලද 1971/72 (මාස 12) සඳහා මුල් ඇස්තමේන්තු' 1970/71 වර්ෂයට වඩා දළ ආහාර පිහිටාධාරයේ රුපියල් දශලක්ෂ 25 හෝ සියයට 4 ක වඩා අඩු ඉහළ යාමක් දක්වයි. සහල් පිහිටාධාරය රුපියල් දශලක්ෂ 49 කින් හෝ සියයට 10 කින් වැඩි වෙතැයි බලාපොරොත්තු වේ. අනුමත කළ ඇස්තමේන්තු හා සසඳන විට මෙම අඩු ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ සලාකය යටතේ දෙනු ලබන දෙවැනි සහල් සේරුවේ මිළ ශත 25 කින් වැඩි කිරීමට ගත් තීරණයයි. මෑත කාලයෙදී ප්‍රථම වරට, පිටි විකිණීමෙන් රුපියල් දශලක්ෂ 11 ක අලාභයක් බලාපොරොත්තු වන බැවින් එයද දළ ආහාර පිහිටාධාරයේ කොටසක් වේ. පිටි රාත්තලක මිළ අවසාන වරට ශත 5 කින් වැඩි කරන ලද 1967/68 වර්ෂයේ සිට පිටි විකිණීමෙන් ලද ලාභය ක්‍රමයෙන් අඩුවී ඇත. පිරිහෙන ලාභවලින් මෙම භාණ්ඩයෙහි බෙදහැරීමේ වියදම් අඩුකරලීම 1971/72 දී පිටි විකිණීමෙන් අපේක්ෂිත අලාභවලට මූලික හේතුව වේ. 1971/72 වර්ෂය තුළදී තිරිගු පිටි දිගු ටොන් එකක ආනයන මිල රුපියල් 671 සිට රුපියල් 703 දක්වා වැඩිවෙතැයි බලාපොරොත්තුවීමද ලාභ, අලාභයන් බවට හැරීමට

හේතුවී ඇත. 1971/72 වර්ෂය සඳහා ආහාර කොමසාරිස්ගේ ඇස්තමේන්තුවෙහි මෙරට නිෂ්පාදිත රතුළූනු සඳහා පිහිටාධාරයක් ඇතුළත් කර නොමැත. රතුළූනු ආනයනය තහනම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වූ මිල වැඩිවීම මෙයට සමහර විට හේතු වන්ට ඇත.

(ii) ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලාභ

1970/71 වර්ෂයේදී ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලැබීම්හි රුපියල් දශලක්ෂ 152 ක හෝ සියයට 61 ක තියුණු අඩුවීමක් වාර්තා විය. 1969/70 දී එය රුපියල් දශලක්ෂ 48 කින් හෝ සියයට 16 කින් අඩුවිය.

1969/70 දී ලැබීම් අඩුවීමට මූලික වශයෙන් හේතු වූයේ, ආයාත කළ සීනි දිගු ටොන් 1 ක් ගොඩබාන අවස්ථාවේදී සාමාන්‍ය පිරිවැය රුපියල් 673 සිට රුපියල් 727 දක්වා වැඩි වීමයි. මේ හේතුවෙන්, සීනි විකිණීමෙන් ලද ලැබීම් රුපියල් දශලක්ෂ 34 කින් හෝ සියයට 13 කින් අඩු විය. සීනි ආනයන මිළ 1967/68 සිට සියයට 30 කින් පමණ වැඩිවී ඇති අතර එය සීනි විකිණීමෙන් ලද ලාභයේ ක්‍රමික අඩුවීමට එක් හේතුවක් විය. පිටි විකිණීමෙන් ලද ලාභයද රුපියල් දශලක්ෂ 14 කින් අඩුවූ අතර මෙයට බොහෝ සෙයින් හේතු වූයේ පිට පළාත්වලට[1] වඩා කොළඹ විකිණීම් ප්‍රමාණය වැඩිවීමයි.

මීට අමතරව ආරම්භක සහ අවසන් තොග වැඩි වීමකට අගැයීමත්, පිටි විකිණීමෙන් ලද ලාභයේ මෙම අඩුවීමට බලපෑවේය. 1970/71 දී ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලැබීම් රුපියල්' දශලක්ෂ 152 ක තියුණු පහත වැටීමට මූලික හේතුව වූයේ, සීනි පිරිවැය රුපියල් දශලක්ෂ 135 කින් ඉහළ නැංවීමට බලපෑ සීනි ආනයනය විවිහිස යටතට ගැනීමයි. සීනිවලින් ලද ලාභය අඩුවීමට තවත් වැදගත් හේතුවක් වූයේ, සීනි දිගු ටොන් එකක ආනයන මිළ රුපියල් 727 සිට රුපියල් 887 දක්වා වැඩිවීමයි. පිටි විකිණීමෙන් ලද ලැබීම් රුපියල් දශලක්ෂ 10 කින් පහළ යාමට ප්‍රධාන ලෙස හේතු වූයේ, ගොඩබෑමේදී පිටි දිගු ටොන් එකක මිළ රුපියල් 685 සිට 713 දක්වා වැඩි වීමයි. පිටි පරිභෝජනය ටොන් 66,000 කින් (තේ සියයට 15 කින්) අඩුවීම අඩු ලැබීම්වලට තවත් හේතුවක් විය.

11 (ඊ) 8 සංඛ්‍යා සටහනින් පෙනී යන පරිදි 1971/72 දී, සුළු වෙනස්කම් කිපයක් හැර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුල් ඇස්තමේන්තු ආහාර කොමසාරිස් විසින් සපයන ලද ඇස්තමේන්තු සමඟ මූලික වශයෙන් සමාන වේ.

පසුගිය මුදල් වර්ෂ 3 තුළ දක්නට ලැබුණු ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලාභයේ අඩුවීමේ උපනතිය ආපසු හැරීමක් 1971/72 වර්ෂයේදී අපේක්ෂා කෙරේ. සීනි ටොන් 1 ක ගොඩබෑමේදී මිළ රුපියල් 50 කින් වැඩිවේයයි අපේක්ෂා කරතත්, ප්‍රධාන වශයෙන් සීනිවලින් ලැබෙන ලාභය ඉහළ යාම නිසා 1971/72 වර්ෂයේදී ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලබන ආදයම රුපියල් දශලක්ෂ 11 කින් වැඩිවේයයි අපේක්ෂා කෙරේ. මුල් ඇස්තමේන්තු අනුව පිටි විකිණීමෙන් ලබන ලාභය ඉතා සුළුවේයයි අපේක්ෂා කරනු ලබන අතර ඇත්ත වශයෙන්ම ආහාර කොමසාරිස්වරයාගේ ඇස්තමේන්තු අනුව එය රුපියල් දශලක්ෂ 11 ක අලාභයකට හැරෙනු ඇත. එනිසා සීනි සලාකයක් ඇති කොට, සතියකට එක් අයෙකුට රාත්තල ශත 72 බැගින් රාත්තල් $\frac{1}{2}$ ක් දීමත්, සලාක නොමැතිව සීනි රාත්තලක මිල රුපියල් 1·50[2] ට විකිණීමත්, වශයෙන් ද්වි මිළ ක්‍රමයක් හඳුන්වා දීමට රජය ගත් තීරණය මෙම අපේක්ෂිත වැඩි ආදයමට ප්‍රධාන හේතුවක් වේ. උම්බලකඩ විකිණීමෙන් ලබන ලාභයෙහිද සුළු වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

1· පිට පළාත්වල, පිටි රාත්තලක සිල්ලර මිළ කොළඹ සිල්ලර මිළට වඩා ශත 2 කින් වැඩි බව සැලකිය යුතුයි මෙම මිළ විවිධත්වය පවත්වනුයේ, පිට පළාත්වල බෙදාහැරීමේ වියදම් වඩා අධික වීමේ හේතු වෙනි. වෙනත් තැනක සඳහන් කළ අයුරු 1969/70 දී පිටි සඳහා බෙදා හැරීමේ වියදම් ආහාර කොමසාරිස්වරයා භාරයේ ඇති සෑම ද්‍රව්‍යයන්ගේම මුළු බෙදා හැරීමේ වියදම්වලට ඇතුළත් කොට දළ ආහාර පිහිටාධාරයේ කොටසක් වශයෙන් දක්වා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු විකුණුම් ප්‍රමාණය ටොන් 25,000 කින් වැඩිවූ මුත් ඉන් ලද ලාභ වැඩිවූයේ, විකුණුම්වල වැඩිවීමේ අනුපාතයට වඩා අඩු ප්‍රමාණයකිනි.

2· 1972 මාර්තු සිට එක් අයෙකුගේ මාසික සලාකය රාත්තල් 2 ක් බවට පත්කොට තිබේ.

(iii) ශුද්ධ ආහාර පිඹිටාධාරය

ශුද්ධ ආහාර පිඹිටාධාරය, එනම් දළ ආහාර පිඹිටාධාරයෙන් ආහාර ද්‍රව්‍ය විකිණීම්වලින් ලද ලාභය අඩු කළ විට ශේෂය 1970/71 දී රුපියල් දශලක්ෂ 179 කින් (හෝ සියයට 55 කින්) සැළකිය යුතු වැඩිවීමක් පෙන්විය. මෙය ප්‍රධාන වශයෙන්ම, ආහාර ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලාභය රුපියල් දශලක්ෂ 152 කින් තියුණු ලෙස පහත වැටීමේ ප්‍රතිඵලයකි. 1969/70 වර්ෂයේදී ශුද්ධ ආහාර පිඹිටාධාරය ඉකුත් මුදල් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 3 ක වැඩිවීමක් සටහන් කොට තිබිණි. පසුගිය මුදල් වර්ෂ දෙක තුළ ශුද්ධ ආහාර පිඹිටාධාරයේ වෙනස්වීමට හේතූන් ඉහත කොටස්වලදී විස්තරාත්මකව විග්‍රහ කොට ඇත.

5. අමාත්‍යාංශයන්හි ඌන වියදම්

1968/69 සිට 1970/71 දක්වා වූ මුදල් වර්ෂ තුනෙහි ප්‍රාග්ධන සම්මතයන් යටතේ එන වියදම් පිළිබඳ මුළු වෙන් කිරීම (පරිපූරක ඇස්තමේන්තු ඇතුළුව) හා නියම වියදම එක් එක් අමාත්‍යාංශයන් අනුව බෙදී යන අයුරු පහත II (ඊ) 9 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

1970/71 මුදල් වර්ෂයේදී ප්‍රාග්ධන සම්මතයන් යටතේ නියම වියදම රුපියල් දශලක්ෂ 810 ක්වූ අතර, මුළු වෙන් කිරීම රුපියල් දශලක්ෂ 1265 ක් විය. ඒ අනුව ඌන වියදම රුපියල් දශලක්ෂ 455 ක් හෝ සියයට 36 ක් විය. 1969/70 මුදල් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 964 ක් වූ මුළු වෙන් කිරීමෙන් ඌන වියදම රුපියල් දශලක්ෂ 152 ක් හෝ සියයට 15 ක් විය. 1968/69 දී රුපියල් දශලක්ෂ 995 ක්වූ මුළු වෙන් කිරීමෙන්, ඌන වියදම රුපියල් දශලක්ෂ 143 ක් හෝ සියයට 14 ක් විය. 1970/71 දී සියයට 36 ක්වූ ඌන වියදම මෑත වර්ෂවල වාර්තාගතවූ ඉහළම ප්‍රමාණය විය.

1970/71 දී බොහෝ අමාත්‍යාංශයන්හි ඉහළ ඌන වියදම්වලට මූලික හේතුව වූයේ ත්‍රස්තවාදී ක්‍රියාවන් නිසා ඒවායේ වැඩ පිළිවෙලයන් අතපසු වීමයි. 1970/71 ඌන වියදමෙන් වැඩි කොටසක් (සියයට 69 ක්) ක්‍රම සම්පාදන රැකීරක්ෂා අමාත්‍යාංශය සහ වාරිමාර්ග විදුලිබල සහ මහා මාර්ග අමාත්‍යාංශයේ සම්මතයන් පිළිබඳව වූ බව පෙනී යනු ඇත. මේ අතර, කර්මාන්ත හා විද්‍යා කටයුත්ත, කෘෂිකර්ම සහ ඉඩම්, නිවාස සහ ගොඩනැගිලි, තැපැල් සහ විදුලි සංදේශ, ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි යන අමාත්‍යාංශයන්වල සැළකිය යුතු ඌන වියදම් ප්‍රමාණයන් වාර්තා විය. ක්‍රම සම්පාදන සහ රැකීරක්ෂා අමාත්‍යාංශයේ මුළු වෙන් කිරීම වූ රුපියල් දශලක්ෂ 210 න් වැය කරනු ලැබුයේ, රුපියල් දශලක්ෂ 18 ක් පමණි. මෙසේ, මෙම අමාත්‍යාංශයේ වෙන් කිරීමෙන් 90% ක් පමණ මුදල් වර්ෂය අග වන විට වැය නොකෙරී තිබිණ. 1969/70 වර්ෂයේදී මෙම අමාත්‍යාංශයේ ඌන වියදම සියයට 31 ක් විය. 1970/71 වර්ෂයේදී මෙම ඉතා අධික ඌන වියදමට හේතු වූයේ "කෙටි කාලීන රැකීරක්ෂා වැඩ පිළිවෙල" පිළිබඳ වියදම පහත මට්ටමක පැවතීමයි. මෙම වැඩ පිළිවෙල සඳහා මුළු වෙන් කිරීම රුපියල් දශලක්ෂ 208 ක්වූ නමුත් නියම වියදම වූයේ, රුපියල් දශලක්ෂ 16 ක් පමණි. රැකීරක්ෂා වැඩ පිළිවෙල බොහෝ දුරට ක්‍රියාත්මක නොවීමට මූලික හේතුව වූයේ, මෙම වර්ෂය තුළ රටේ පැවති නොසන්සුන් තත්ත්වයයි. වාරි මාර්ග, විදුලිය සහ මහා මාර්ග අමාත්‍යාංශය විසින් වාර්තා කෙරුන ඌන වියදම්වූ රුපියල් දශලක්ෂ 119 (හෝ සියයට 35) 1968/69 සහ 1969/70 වර්ෂය පිළිවෙලින් සියයට 23 ක් සහ සියයට 12 ක්වූ ඌන වියදමට වඩා සැළකිය යුතු වැඩි වීමක් පෙන්විය. මෙම අමාත්‍යාංශයේ විවිධ දෙපාර්තමේන්තුවල 7 වැනි සම්මතය යටතේ ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කිරීමහි අඩු වියදම් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රාදේශීය ඉංජිනේරු සේවයක් පිහිටුවීමෙන් වාරි මාර්ග, විදුලිය සහ මහා මාර්ග අමාත්‍යාංශයේ කාර්මික සේවාවන් ප්‍රතිසංවිධානය කිරීමත්, ත්‍රස්තවාදී කටයුතු නිසාවූ පසු බැස්මත් මෙම අධික ඌන වියදම් වලට පුළුල් ලෙස ඉවහල් විය. කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ සහ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ඌන වියදම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 33 ක් (හෝ සියයට 25) සහ රුපියල් දශලක්ෂ 32 (හෝ සියයට 23) ක් විය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස, 1969/70 දී කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ නියම වියදම මුල් වෙන් කිරීම්වලට වඩා සියයට 12 කින් වැඩිවිය. නමුත් එම වර්ෂයේදී කෘෂිකර්ම හා ඉඩම්

II (ඊ) 9 වැනි සංඛ්‍යා සටහන

1968/69 සිට 1970/71 දක්වා අමාත්‍යාංශ අනුව ප්‍රාග්ධන වියදම්(අ)

රුපියල් දශ ලක්ෂ

අමාත්‍යාංශය	1968/69			1969/70			1970/71		
	මුළු ප්‍රතිපාදන	නියම වියදම	ඌන වියදම	මුළු ප්‍රතිපාදන	නියම වියදම	ඌන වියදම	මුළු ප්‍රතිපාදන	නියම වියදම	ඌන වියදම
1. අමාත්‍යාංශ යටතේ නොගැනෙන අග්‍රාණ්ඩුකාරවරයා, අගමැති, ශ්‍රේෂ්ඨාධිකරණය ආදිය ..	0·1	0·1	—	0·1	0·1	—	0·2	0·1	0·1
2. රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය ..	11·1	8·8	2·3	9·1	8·8	0·3	62·9	70·7	−7·8
3. ක්‍රමසම්පාදන සහ රැකී රක්ෂා අමාත්‍යාංශය ..	11·1	11·1	—	15·7	10·8	4·9	209·5	17·9	191·6
4. වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය (ආ) ·	334·1	295·0	39·1	335·5	217·1	118·4	344,6	225·2	119·4
5. විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය ..	13·6	10·7	2·9	4·9	4·2	0·7	4·1	2·0	2·1
6. අධ්‍යාපන අමාත්‍යාංශය ..	36·9	26·6	10·3	40·0	34·4	6·0	47·6	37·3	10·3
7. නාවික හා සංචාරක කටයුතු අමාත්‍යාංශය ..	40·4	30·8	9·6	24·3	23·8	0·5	27·5	23·3	4·3
8 කම්කරු අමාත්‍යාංශය ..	6·1	5·6	0·5	4·6	3·5	1·1	4·2	2·4	1·8
9. රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ..	43·1	34·6	8·5	48·1	45·5	2·6	21·6	19·9	1·7
10. කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය ..	214·7	189·1	25·6	147·6	164·7	−17·1	132·2	99·5	32·7
11. මුදල් අමාත්‍යාංශය ..	28·2	26·8	1·4	37·7	38·6	−0·5	52·8	49·3	3·5
12. ගමනාගමන අමාත්‍යාංශය ..	46·8	33·7	13·1	39·1	47·1	−8·0	54·5	50·4	4·1
13. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	36·8	36·8	—	28·9	28·9	—	36·4	32·7	3·7
14. අධිකරණ අමාත්‍යාංශය ..	0·1	0·2	−0·1	0·3	0·3	—	0·4	0·4	...
15. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය ..	96·9	88·0	8·9	121·9	102·3	19·6	137·8	106·1	31·7
16. ධීවර අමාත්‍යාංශය ..	20·6	18·8	1·8	19·2	16·6	2·6	14·6	13·6	1·0
17. නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය ..	7·0	7·0	—	42·3	33·5	8·8	58·6	34·4	24·1
18. තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය ..	17·5	9·2	8·3	16·9	9·4	7·5	20·9	6·9	14·0
19. සෞඛ්‍ය අමාත්‍යාංශය ..	17·0	11·6	5·4	13·9	12·3	1·6	12·2	7·6	4·6
20. ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශය ..	9·7	5·4	4·3	10·1	7·8	2·3	19·2	7·9	11·3
21. සමාජ සේවා අමාත්‍යාංශය ..	0·5	0·3	0·2	0·7	0·2	0·5	0·5	0·2	0·3
22. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ..	2·3	1·8	0·5	2·2	1·6	0·6	2·0	1·6	0·4
23. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ..	—	—	—	0·5	0·4	0·1	0·5	0·4	0·1
24. ව්‍යවස්ථා කටයුතු අමාත්‍යාංශය ..	—	—	—	0·1	—	0·1	—	—	—
එකතුව	994·5	852·0	142·5	964·2	812·0	152·2	1264·8	809·8 (ඇ)	455·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1970/71 මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුවල දක්වෙන පරිදි දෙපාර්තමේන්තු හා කාර්යාලයන් විවිධ අමාත්‍යාංශ යටතේ වෙන් කිරීමට හැකිතරම් අනුකූල වන පරිදි, 1968/69 හා 1969/70 සඳහා වූ සංඛ්‍යාවන් සංසන්දනය කිරීමේ කාර්යය සඳහා නැවත වර්ග කර ඇත, "මුළු ප්‍රතිපාදනය" පිළිබඳ සංඛ්‍යාවන්ට අතිරේක ඇස්තමේන්තු ඇතුළත් වන අතර, "නියම වියදම" පිළිබඳ සංඛ්‍යාවන්ට සම්මතයන්ගෙන් සිදු කිරීමට අපේක්ෂා කරන විදේශීය ණය වියදම ඇතුළත්ය. නිදන් අරමුදල් දයක දීමනා, රාජ්‍ය ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර සංවිධානයන්ට විශේෂ ගෙවීම් මේ සංඛ්‍යාවන්ගෙන් අත්හැර ඇත. ඌණ වියදම් තීරුව යටතේ එන සෘණ ලකුණත් මුළු ප්‍රතිපාදනයට වඩා නියම වියදමෙහි අතිරික්තය පෙන්වයි.

(ආ) 1968/69 මුදල් වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තු වියදම වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ වර්ග කොට ඇත. 1969/70 වර්ෂයේදී මේම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා මහා මාර්ග දෙපාර්තමේන්තුව යනුවෙන් බෙදන ලද අතර, පූර්වයේ ගොඩනැගිලි හා නිවාස අමාත්‍යාංශය යටතේ දක්වා ඇත. එහෙයින් 1969/70 වර්ෂයේදී අමාත්‍යාංශ දෙක සඳහා වූ සංඛ්‍යාවන් පසුගිය වර්ෂය සඳහා එවැනි සංඛ්‍යාවන් සමග සැසඳිය නොහැක.

(ඇ) රජයේ ගිණුම්වල ආවර්තන සම්මතයන් යටතේ දක්වා ඇති ඇතැම් සංස්ථාවලට ආපසු දෙන ලද වි.වි.කි.ස. රුපියල් දශලක්ෂ 30·9 ක මුදලද ඇතුලත්ය.

අමාත්‍යාංශයේ සියයට 16 ක ඌන වියදම් ප්‍රමාණයක් වාර්තා කර තිබුණි. 1970/71 දී නිවාස හා ගොඩනැගිලි, තැපැල් හා විදුලි සංදේශ, ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයන්ගේ ඌන වියදම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 24 ක් හෝ සියයට 41 ක්, රුපියල් දශලක්ෂ 14 ක් හෝ සියයට 67 ක් සහ රුපියල් දශලක්ෂ 11 ක් හෝ සියයට 58 ක්වූ නමුත් 1969/70 දී ඒවා පිළිවෙලින් සියයට 21 ක්, සියයට 44 ක් සහ සියයට 23 ක් විය. 1968/69 දී තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යාංශයෙහි ඌන වියදම සියයට 47 ක්ද, ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශ යෙහි ඌන වියදම සියයට 44 ක්ද වූ අතර, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයට වෙන් කරන ලද මුදල මුළුමනින්ම වැය කිරීමට හැකි විය.

වෙන් කිරීමට වඩා නියම වියදම ඉක්මවූ එකම අමාත්‍යාංශය රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය බව පෙනී යයි. මෙම අමාත්‍යාංශයේ නියම ප්‍රාග්ධන වියදම, මුළු වෙන් කිරීම වූ රුපියල් දශලක්ෂ 63 ට වඩා රුපියල් දශලක්ෂ 8 කින් වැඩි විය. එකී අමාත්‍යාංශය ත්‍රස්තවාදී ක්‍රියා වියදම් කෙරෙහි සංජුව බලපෑ එක් අමාත්‍යාංශයක් වූ නිසා මෙය පුදුමයට කරුණක් නොවේ.

6. අත්තිකාරම් ගිණුම්

1970/71 මුදල් වර්ෂයේදී රජයේ "අත්තිකාරම් ගිණුම්"[1] කටයුතුවලින් රුපියල් දශලක්ෂ 108 ක මුළු ශුද්ධ ගෙවීමක් විය. මෙය, ලංකා/චීන වෙළෙඳ ගිණුම යටතේ රුපියල් දශලක්ෂ 73 ක්ද, රජයේ දෙපාර්තමේන්තු, සමායතන සහ රජයේ සේවකයන් සඳහා රුපියල් දශලක්ෂ 26 ක්ද, භාණ්ඩ තොග සඳහා රුපියල් දශලක්ෂ 9 ක්ද, විවිධ ගෙවීම් සඳහා රුපියල් දශලක්ෂ 2 ක්ද යන ශුද්ධ ගෙවීම්වලින් සමන්විත විය. 1969/70 දී රුපියල් දශලක්ෂ 201 ශුද්ධ ගෙවීම, ප්‍රධාන වශයෙන් රජයේ දෙපාර්තමේන්තු සමායතන සහ රජයේ සේවකයන් සඳහා රුපියල් දශලක්ෂ 125 කද ලංකා-චීන වෙළඳ ගිණුම යටතේ රුපියල් දශලක්ෂ 56 ක සහ භාණ්ඩ සඳහා රුපියල් දශලක්ෂ 22 කද ගෙවීම් රුපියල් දශලක්ෂ 2 විවිධ ලැබීමකින් තරමක් දුරට සමහන් වීමෙන් සෑදුනකි. 1969/70 ට වඩා 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 93 ක අඩුගෙවීම් රජයේ දෙපාර්තමේන්තු ආදියට කරන ලද ගෙවීම්වල රුපියල් දශලක්ෂ 99 ක අඩුවීමක්ද භාණ්ඩ සඳහා ගෙවීම්වල රුපියල් දශලක්ෂ 13 ක අඩුවීමක්ද තරමක් දුරට සමහන් කළ ලංකා-චීන වෙළඳ ගිණුම යටතේ රුපියල් දශලක්ෂ 17 ක වැඩිවීමකද විවිධ ගෙවීම්වල රුපියල් දශලක්ෂ 2 ක වැඩිවීමකද ප්‍රතිඵලයක් විය. චීන-ලංකා වෙළඳ ගිණුම යටතේ චීන මහජන සමූහාණ්ඩුවට හිතකර රුපියල් දශලක්ෂ 54 ක ශේෂයක් තිබූ නමුත් එම ගිවිසුම යටතේ කරන ලද රුපියල් දශලක්ෂ 73 ක ගෙවීමක් හේතුකොටගෙන 1971 සැප්තැම්බර් මාසය අවසානවන විට රුපියල් දශලක්ෂ 19 ක ලංකාවට හිතකර ශේෂයක් ඇතිවී තිබුණ. රජයේ දෙපාර්තමේන්තු ආදියට කරන ලද රුපියල් දශලක්ෂ 26 ක ගෙවීම, සමන්විත වූයේ, ලංකා ගමනා ගමන මණ්ඩලයට රුපියල් දශලක්ෂ 38 කද ලංකා රාජ්‍ය කාර්මික (නීතිගත) සංස්ථාවට රුපියල් දශලක්ෂ 18 කද දුම්රිය දෙපාර්තමේන්තුවට රුපියල් දශලක්ෂ 15 කද බැහැර ගෙවීම්, ආහාර සැපයීම් වලින් රුපියල් දශලක්ෂ 45 ලැබීමකින් තරමක් දුරට සමහන් වීමෙනි.

---

1. වැඩි වශයෙන් වාණිජ ස්වභාවයකින් යුතු, මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ස්වයං මූල්‍ය කාරක රජයේ කටයුතු "අත්තිකාරම් ගිණුම්" නමින් හැඳින්වේ. එවැනි ගිණුම් ප්‍රධාන වර්ග 3 කි. එනම් භාණ්ඩ ගිණුම්, වෙළඳ ගිණුම් සහ විශේෂ ගිණුම්ය. මෙම කටයුතුවල ලැබීම් හා ගෙවීම් පහසුවෙන් නිශ්චිතව කලින් දැන ගැනීමට නොහැකි බැවින් රජයේ ඇස්තමේන්තුවල සංකේත ප්‍රතිපාදනයක් පමණක් දක්වීම ප්‍රයෝජන වත්ය. එම අත්තිකාරම් ගිණුම්වල ලැබීම් රජයේ ඇස්තමේන්තුවල ii කොටසෙහි දක්වා ඇති සීමාවන්ට යටත්ව ඒවායේ වියදම් සියවා ගැනීම සඳහා උපයෝජනය කිරීමට අවසර දී ඇත. කෙසේ වුවද, මෙම අත්තිකාරම් ගිණුමක ශුද්ධ ප්‍රතිඵලය පූර්ව කථනය කළ හැකිවූ විට එහි අතිරික්තය හෝ හිඟය ඇස්තමේන්තු යටතේ සම්මත කරනු ලැබේ. උදා: ශුද්ධ ආහාර පිහිටාධාරය.

7. අය-වැය හිඟය සහ එය පියවූ ආකාරය

1970/71 වර්ෂය සඳහා වූ මුලික අය-වැය ඇස්තමේන්තු අනුව, රුපියල් දශලක්ෂ 932 ශුද්ධ මූල්‍ය හිඟයක් අපේක්ෂා කරණු ලැබීය. ඉකුත් මුදල් වර්ෂයේ හිඟය වූ රුපියල් දශලක්ෂ 936 සමඟ සැසඳීමේදී අය-වැය කටයුතු වල අවසානයේදී රුපියල් දශලක්ෂ 1083 ක් වූ (තාවකාලික) එම හිඟය අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි විය. මෑත වර්ෂ වලදී ශුද්ධ මුදල් හිඟයක් අනුක්‍රමයෙන් ඉහළ නැගීම දෙසට උපනතියක් තිබුණි. මෙයට හේතූන් මීට ඉහත කොටස්වලදී විග්‍රහකොට දක්වා තිබේ. 1969/70 වර්ෂයේදී සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී ශුද්ධ මූල්‍ය හිඟයේ වැඩිවීම විශේෂයෙන්ම ඉහළමට්ටමක තිබුණි.

ඉකුත් මුදල් වර්ෂයට වඩා 1970/71 වර්ෂයේදී ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 147 කින් ඉහළ ගොස් තිබෙන බව පෙනේ. මෙය ආදයම් ලැබීම්හි ඇතිවූ රුපියල් දශලක්ෂ 79 ක වැඩිවීමෙහිද, අත්තිකාරම් ගිණුම් කටයුතු සහ ප්‍රාග්ධන වියදමහි පිළිවෙලින් ඇතිවූ, රුපියල් දශලක්ෂ 93 ක සහ රුපියල් දශලක්ෂ 2 අඩුවීම් මගින්ද තරමක් දුරට සමනය වූ පුනරාවර්තන වියදමේ ඇතිවූ රුපියල් දශලක්ෂ 322 වැඩිවීම යන කරුණුවල සංයුක්ත ප්‍රතිඵලයක් වේ.

1970/71 වර්ෂයේ ශුද්ධ මූල්‍ය හිඟය, රුපියල් දශලක්ෂ 153 කින් එම වර්ෂය සඳහා වූ මුල් ඇස්තමේන්තු ඉක්මවීය. මේය, ප්‍රාග්ධන වියදමේ ඇතිවූ රුපියල් දශලක්ෂ 159 ක අඩුවීම මගින් තරමක් සමනය වුණු, ආදයම් ලැබීම්හි ඇතිවූ රුපියල් දශලක්ෂ 63 ක අඩුවීමද, අය—වැයෙන් මුලින් බලාපොරොත්තු නොවූ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා කළ රුපියල් දශලක්ෂ 108 ක ශුද්ධ ගෙවීම සහ පුනරාවර්තන වියදමහි ඇති වූ රුපියල් දශලක්ෂ 141 ක වැඩිවීමද යන කරුණුවල සංයුක්ත ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය.

1971/72 මෙම මුදල් වර්ෂය සඳහා ශුද්ධ මූල්‍ය හිඟය මාස 12 කාලයක් සඳහා රුපියල් දශලක්ෂ 1131 ක් ලෙස(මාස 15 සඳහා රුපියල් දශලක්ෂ 1414) ඇස්තමේන්තු කර ඇත. මෙය 1970/71 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 48 ක වැඩිවීමකි. 1971/72 මාස 12 ක කාලච්ඡේදය සඳහා ආදයම රුපියල් දශලක්ෂ 341 කින් ඉහළ යනු ඇතැයිද, අත්තිකාරම් ගිණුම් කටයුතු නිසා රුපියල් දශලක්ෂ 8 ක අඩුවීමක් සිදුවනු ඇතැයිද අපේක්ෂා කරනු ලැබ ඇතත්, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 258 කින් සහ රුපියල් දශලක්ෂ 139 කින් ඉහළ නගිනු ඇතැයිද, ඒ අනුව ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 48 කින් ඉහළ යනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

හිඟය පියවීම

II (ඊ) 10 සංඛ්‍යා සටහන 1971/72 පවත්නා මුදල් වර්ෂයට අදළ මුල් ඇස්තමේන්තුද සමඟ, 1967/68 වර්ෂයේ සිට 1970/71 වර්ෂය දක්වා හිඟය පියවීමට මුදල් ලබාගත් මාර්ගයන් සහ ශුද්ධ මූල්‍ය හිඟයේ ප්‍රසාරණාත්මක ප්‍රතිවිපාකයද සම්බන්ධ දත්තයන් ඉදිරිපත් කරයි.

II (ඊ) 10 වැනි සංඛ්‍යා සටහන

නිගය පියවූ ආකාරය – 1967/68 සිට 1971/72 දක්වා(අ)

(රුපියල් දශලක්ෂ)

මූලය	1967/68(ආ)			1968/69(ආ)			1969/70			1970/71 නියම (තාවකාලික)			1971/72 මුල් ඇස්තමේන්තු මාස 12 ක කාලච්ඡේදයන්	1971/72 මුල් ඇස්තමේන්තු මාස 12 ක කාලච්ඡේදයන්
1. විදෙශීය මුදල්														
(අ) සංවර්ධන යෝජනා ක්‍රම ණය (දළ)	38·8			93·9			53·3			141·1(ඇ)				
නිදන් අරමුදල් දායක දීමනා සහ ආපසු ගෙවීම් අඩුකොට	47·8	−9·0		47·0	46·9		71·5	−19·2		82·8	58·3			
(ආ) සංවර්ධන ක්‍රම නොවන (භාණ්ඩ) ණය (දළ)	178·9			312·2			229·1			169·0				
ආපසු ගෙවීම් හැර	8·7	170·2		25·0	287·2		46·5	182·6		52·8	116·2			
		29·0	190·2		19·5	353·6		62·8	226·2		59·9	234·4	395·8	493·6
(ඇ) දීමනා			9·8			52·2			15·5			140 5	—	—
2. වෙළඳ පොලින් නොවන දේශීය ණය ගැනීම්														
3. දේශීය වෙළඳ පොලේ බැංකු ක්‍රමයෙන් ගත් ණය (ඇ)														
(අ) මහ බැංකුව		302·1			114·9			376·4			−160·9			
(ආ) වෙළඳ බැංකු		1·4	303·5		−46·8	68·1		77·1	453·5		267·7	106·8	356·8	446·0
4. බැංකු නොවන මාර්ගයන්ගෙන් වෙළඳ පොළින් ණය ගැනුම්														
ණයට ගත් ප්‍රමාණය දළ වශයෙන්		324·0			287·8			359·2			585·9			
නිදන් අරමුදල් දායක දීමනා හැර		75·7	248·3		85·3	202·5		93·2	266·0		107·4	478·5	379·6	474·4
5. මුදල් ශේෂ හා විදේශාධාර ප්‍රතිපාර්ශ්වය අරමුදල් හැර														
(අ) මුදල් ශේෂ		−48·4			62·9			−30·6			−3·3			
(ආ) විදේශාධාර ප්‍රතිපාර්ශ්වය අරමුදල් (දළ බැර)	−187·7(ඉ)			−318·7(ඉ)			−268·4(ඉ)			−245·6				
අයවැය කටයුතු සඳහා උපයෝගී-කොට ගත් ප්‍රමාණය හැර	200·0	12·3	−36·1	367·0	48·3	111·2	273·4	5·0	−25·6	372·1	126·4	123·1(ඊ)	—	—
			715·7			787·6			935·6			1083·3	1131·2	1414·0
6. ශුද්ධ මූල්‍ය නිගය			—			−0·3			...			1·4	—	—
7. එ. ජා. ආධාර ප්‍රතිපාර්ශ්වය අරමුදල අඩුවීම													356·8	446·0
8. රජයේ මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම (3+5+7)			267·4			179·0			427·9			231·3(ඊ)		

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සාණ ලකුණින් දන්වෙනුයේ 1 සිට 4 දක්වා සහ 8 වෙනි ශීර්ෂයන් සම්බන්ධයෙන් ආපසු ගෙවීමක් හා 5 හා 7 වෙනි ශීර්ෂයන් සම්බන්ධයෙන් වැඩිවීමක්ය.

(ආ) 1967/68 මුදල් වර්ෂයේ ජණ නීති 480 ණය යටතේ ලැබුණු රුපියල් දශලක්ෂ 28·9 1968/69 භාණ්ඩාගාර ලැබීම් වශයෙන් රජයේ ගිණුම්වලට හර කරනු ලැබිය. ප්‍රස්තුත ගැලපීම් කළහොත්, මුදල් වර්ෂ දෙකේ රාජ්‍ය මූල්‍ය කටයුතු වල ප්‍රසාරණාත්මක බලපෑම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 238·5 සහ රුපියල් දශලක්ෂ 207·9 වේ.

(ඇ) මෙම සංඛ්‍යාවන්හි බැංකු ක්‍රමය විසින් දරනු ලැබූ රජයේ ආනයන (ආහාර) බිල්පත්වල වටිනාකම් ගණන් නොගන්නා ලදී. මෙම නිගව තිබෙන ආහාර බිල්පත්වල වටිනාකම සැප්තැම්බර් අවසානයට 1967,1968 සහ 1969 යන වර්ෂන්හිදී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 122·3 100·7 සහ 92·4 ක් විය.

(ඈ) මෙහෙයුම් විත සමුහාණ්ඩුවෙන් ලද රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණයද අඩංගුය.

(ඉ) 1967/68 සිට 1969/70 දක්වා මුදල් වර්ෂයන්හි දීමනා භාණ්ඩ වශයෙන් ලැබීම් නිසා ඒවා ද ප්‍රතිපාර්ශ්වය අරමුදලට බැර කිරීමේ හේතුවෙන් (භාණ්ඩ) ණය ලැබීම්වලට වඩා ප්‍රතිපාර්ශ්වය අරමුදලේ බැර සංඛ්‍යාව වැඩිවී ඇත.

(ඊ) 164 පිටේ පාද සටහන බලන්න.

* අනුපාතික පදනමක් මත

1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 1083 ක් වූ ශුද්ධ මූල්‍ය හිඟයෙන් දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් ලද රුපියල් දශලක්ෂ 479 ක ණයගැනීම් මගින්ද, දේශීය වෙළෙඳපොල නොවන මාර්ගයන්ගෙන් ලද රුපියල් දශලක්ෂ 141 කින්ද, දේශීය බැංකු මගින් ලද රුපියල් දශලක්ෂ 107 කින්ද විදේශාධාර රුපියල් දශලක්ෂ 234 ක් ලබාගැනීමෙන්ද පියවනු ලැබූ බව පෙනීයයි. මෙම සම්පත් සැපයීමට ආධාරකාරී වීම සඳහා මුදල් ශේෂයන් (විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල්ද ඇතුළුව) රුපියල් දශලක්ෂ 123 කින් අඩුකරනු ලැබීය.[1]

1971/72 වර්ෂයේ (මාස 15) ඇස්තමේන්තු කළ ශුද්ධ මූල්‍ය හිඟය වූ රුපියල් දශලක්ෂ 1414 ක් විදේශීය මූල්‍ය මගින් රුපියල් දශලක්ෂ 494 ක් සහ දේශීය බැංකු නොවන වෙළඳපොල මාර්ගයන්ගෙන් රුපියල් දශලක්ෂ 474 ක්ද ලබාගැනීම මගින් පියවනු ඇත. රුපියල් දශලක්ෂ 446 ක් වන නොපිය වූ පරතරය, 1971/72 වර්ෂය තුළදී අතිරේක සම්පත් ලබාගැනීමට තවත් යෝජනා ක්‍රියාත්මක කරනු නොලැබුවහොත් එම ප්‍රමාණයටම බැංකු ක්‍රමයෙන් ණය ගැනීමට (අය-වැය ලේඛනයේදී අපේක්ෂා කළ එවැනි ණය ගැනීම් රුපියල් දශලක්ෂ 161 ඇතුළත්ව) හේතුවනු ඇත.

1970/71 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක ප්‍රතිවිපාකය රුපියල් දශලක්ෂ 231 ක් විය.කෙසේ වුවද, යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ආධාර ලැබීම් වාර්තා-ගත කිරීමේ ප්‍රමාදයන් සඳහා ඉඩ සැලසූ විට නියම ප්‍රසාරණාත්මක බලපෑම උපරිම වශයෙන් වුවත්, වන්නේ දශලක්ෂ 118 ක් පමණි. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ශුද්ධ මූල්‍ය හිඟය ප්‍රමාණයෙන් වැඩි වුවද, එය 1969/70 වර්ෂයේ ශුද්ධ ප්‍රසාරණාත්මක ප්‍රතිවිපාකයට (රුපියල් දශලක්ෂ 197 කින්) වඩා අඩුය. 1970/71 වර්ෂයේදී විදේශීය ආධාර මගින් ශුද්ධ ලැබීම් 1969/70 වර්ෂයට වඩා සුළු වශයෙන් වැඩිවීමක් පෙන්වූ අතර, දේශීය බැංකු නොවන වෙළෙඳපොල මාර්ගයන්ගෙන් ලබාගත් සම්පත් රුපියල් දශලක්ෂ 213 කින් සැළකිය යුතු පරිදි වැඩිවිය. රුපියල් දශලක්ෂ 141 ක් වූ පරිපාලන ණය ගැනීම් 1969/70 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 125 ක වැඩිවීමක් පෙන්විය. මුදල් ශේෂයන්හි තියුණු අඩුවීමට (විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල ඇතුළුව) ඉඩ හැරි කළ, 1970/71 වර්ෂයේදී බැංකු ක්‍රමයෙන් ණය ගැනීම් රුපියල් 106 ක සුළු ප්‍රමාණයකට සීමා කිරීමට, දේශීය බැංකු නොවන වෙළෙඳපොළ ණය ගැනීම් සහ පරිපාලන ණය ගැනීම් උදව් වූ බව පැහැදිලිය.

---

1 රජයේ තාවකාලික ශේෂ පත්‍රයට අනුව (වත්කම් සහ වගකීම් ප්‍රකාශණය බලන්න.) මුදල් වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී රජයේ මුදල් ශේෂයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 29·4 ක් සහ 32·7 ක් විය. මෙසේ වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 3 කින් වැඩිවී තිබේ. අනෙක් අතට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලේ (භාණ්ඩ) ආරම්භක ශේෂය රුපියල් දශලක්ෂ 13.6 ක් වූ අතර අවසාන ශේෂය රුපියල් දශලක්ෂ 112.8 ක අයිරා තත්ත්වයක් පෙන්නුම් කළේය. මේ අනුව මෙම මුදල් වර්ෂය තුළ, රුපියල් දශලක්ෂ 126.4 කින් පහළ ගිය බව පෙන්නුම් කළේය. එම නිසා යරෝක්ත ක්‍රියාවලියන් දෙකෙහිම ඒකාබද්ධ ප්‍රතිඵලය වූයේ රුපියල් දශලක්ෂ 123·1 ක ප්‍රමාණයකින් මුදල් ශේෂ පහළ වැටීමය. ආරම්භක ශේෂය සහ මුදල් වර්ෂය තුළදී සිදුවූ රුපියල් දශලක්ෂ 245·6 ක ලැබීම් අයවැය කටයුතු සඳහා අරමුදලින් ඇපසු ගත් රුපියල් දශලක්ෂ 372·1 ක ප්‍රමාණය සපුරා ගැනීමට නොසෑහුනු බැවින් ශේෂ පත්‍රයේ පෙන්නුම් කරන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලේ අයිරා තත්ත්වය ඉහළ ගොස් තිබේ.

රජයේ ශේෂ පත්‍රයේ පෙන්නුම් කෙරෙන රුපියල් දශලක්ෂ 112.8 ක අයිරා තත්ත්වයට ප්‍රතිවිරුද්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමට අනුව නියම මුදල් තත්වය නොසැලකිය යුතු ප්‍රමාණයක වාසිසහගත තත්වයක් පෙන්නුම් කෙරේ. මෙම සංඛ්‍යාත්මක වෙනස පැන නැගී ඇත්තේ රජයේ ශේෂ පත්‍රයෙහි විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුම්වල භාණ්ඩ පිළිබඳ වාර්තා තැබීමේ ඇතිවන කාලපරිච්ඡේදයන් හේතුකොට ගෙනය. මෙම අරමුදලේ එබඳු ලැබීම්, රාජ්‍ය ණය ලේඛකාධිකාරී විසින් පවත්වාගෙන යන සටහන් පදනම්කොට ගෙන රජයේ ගිණුම්හි දක්වා ඇති අතර එම ද්‍රව්‍යාධාරයන්ගේ නියම මූල්‍ය ලැබීම් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන මෙම අරමුදලේ ගිණුමෙහි නියම ආකාරයටම සටහන් කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ආධාර පිළිබඳ ලැබීම් වාර්තාගත කිරීමේදී කාලපරිච්ඡේදයක් ඇති වනුයේ ණය ප්‍රදායනකරන රජයන්ගෙන් එබඳු ලැබීම් සම්බන්ධව අනුමැතිය ලැබුනාට පසුව එම ලැබීම් සටහන් කරනු ලබන නිසාය.

එම නිසා සමාලෝචිත කාලච්ඡේදය සඳහා රුපියල් දශලක්ෂ 112.8 ක් වූ අයිරා ප්‍රමාණය වාර්තාගත නොවූ යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ආධාර ලෙස සලකනු ලැබුවහොත් මුදල් ශේෂයන් සහ මහ බැංකු ප්‍රතිපාර්ශ්වීය අරමුදල කෙරෙහි එම කටයුතු වලින් ඇතිවන බලපෑම වනුයේ රුපියල් දශලක්ෂ 10·2 දක්වා පමණක් එවැනි අරමුදල් පහත බැසීම වේ (මුදල් ශේෂයේ ඉහළයාම රුපියල් දශලක්ෂ 3·4 ක් වන අතර ප්‍රතිපාර්ශ්වීය අරමුදලේ පහළ බැසීම රුපියල් දශලක්ෂ 13·6 කි.)

ශුද්ධ මූල්‍ය හිඟයට ප්‍රසාරණාත්මක සංවරකයේ අනුපාතය 1968/69 වර්ෂයේදී සියයට 22·7 සිට 1969/70 වර්ෂයේදී සියයට 45·7 දක්වා වැඩිවූ අතර, 1970/71 වර්ෂයේදී එය සියයට 21·4 දක්වා අඩුවිය.[1]

1970/71 වර්ෂයේදී, රජය මහබැංකුවට ඇති ණයගැතිකම රුපියල් දශලක්ෂ 161 කින් අඩු කළේය. මෙය භාණ්ඩාගාර බිල්පත් සඳහා රුපියල් දශලක්ෂ 163 ක් සහ රුපියල් ණය සඳහා රුපියල් දශලක්ෂ 2 ක් නැවත ගෙවීමෙන්ද සමන්විත විය. මෙය රුපියල් දශලක්ෂ 4 කින් අත්තිකාරම් වැඩිවීම නිසා තරමක් දුරට සමනය විය. මේ අතර, රජය වාණිජ බැංකු සඳහා ඇති ණයගැතිකම රුපියල් දශලක්ෂ 268 කින් ඉහළ නැංවිය. රුපියල් දශලක්ෂ 251 ක් වූ භාණ්ඩාගාර බිල්පත් වලින්ද, රුපියල් දශලක්ෂ 13 ක් වූ බදු සංචිත සහතික පත්‍ර වලින් සහ රුපියල් දශලක්ෂ 4 ක් වූ රුපියල් ණය වලින් මෙම ණය සමන්විත විය. මෙම කටයුතුවල ශුද්ධ ප්‍රතිඵලය වූයේ, 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 454 ක වැඩිවීමට ප්‍රතිවිරුද්ධව බැංකු ක්‍රමය වෙත රජයේ වගකීම රුපියල් දශලක්ෂ 107 කින් ඉහළ යාමය.

මෙම වර්ෂයේදී, දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් රජය විසින් ලබාගත් ශුද්ධ සම්පත් ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 479 මෑත වර්ෂවලදී වාර්තා වූ ඉහළම ප්‍රමාණය වේ. 1968/69 වර්ෂයට වඩා 1969/70 දී රුපියල් දශලක්ෂ 63 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළ මෙම මූලයෙන් ණය ගැනීම්, ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 213 ක සැළකිය යුතු වැඩිවීම් 1970/71 වර්ෂයේදී වාර්තා කළේය. දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් රජයේ ණය වැඩ පිළිවෙලට වැඩිවූ සහයෝගයට හේතුවූ කරුණු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් මෙම වාර්තාවේ පසු කොටසේ දක්වා ඇත.

පහත දැක්වෙන II (ඊ) 11 සංඛ්‍යා සටහන පසුගිය මුදල් වර්ෂ හතර සඳහා බැංකු නොවන ආයෝජක කාණ්ඩයන්හි ශුද්ධ දායකවීම් (එනම් රජයේ සුරැකුම්පත් දැරීමහි වෙනස්වීම) දක්වයි.

සංඛ්‍යා සටහන II (ඊ) 11

රජයේ සුරැකුම්පත්වලට (අ) බැංකු නොවන ආයෝජක කාණ්ඩයන් වල දායකත්වයන්

රුපි. දශලක්ෂ

දායකයන්	1967/68	1968/69	1969/70	1970/71	වැඩිවීම් 1968/69 හා සසඳන කළ 1969/70	වැඩිවීම් 1969/70 හා සසඳන කළ 1970/71
1. ඉතුරුම් ආයතන ..	41·5	0·6	11·0	180·7	10·4	169·7
2. සේවක අර්ථසාධක අරමුදල ..	92·1	101·6	98·0	143·0	– 3·6	45·0
3. වෙනත් අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම වැටුප් ..	30·2	28·6	46·1	44·5	17·5	– 1·6
4. දෙපාර්තමේන්තු සහ වෙනත් නිල අරමුදල් ..	7·0	3·7	5·4	6·9	1·7	1·5
5. රක්ෂණ සංස්ථාව ..	52·8	42·4	45·5	60·7	3·1	15·2
6. වෙනත් රක්ෂණ අරමුදල් ..	4·2	3·5	8·8	– 1·8	5·3	- 10·6
7. අනෙකුත් රාජ්‍ය සමායතන ..	—	—	– 0 7	—	– 0·7	0·7
8. සමාගම්, සමාජ සහ ආයතන ..	– 1·6	5·6	5·6	5·6	—	—
9. පුද්ගලයන් ..	0·1	– 3·2	10·5	2·5	13·7	– 8·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සටහන ඉහත දැක්වූ ආයතනයන්ට අයිති රුපියල් සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් හා බදු සංචිත සහතික පත්වල ශුද්ධ වෙනස්වීම් පෙන්වයි.

1· ඉහත දක්වා ඇති, වැඩියෙන් ලබාගෙන ඇති මුදල් ශේෂ තත්ත්වය සඳහා ගැලපීමක් කරනු ලබයි නම්, 1970—71 වර්ෂයේදී ශුද්ධ මූල්‍ය හිඟයේ ප්‍රසාරණාත්මක සංවරකය සියයට 10.9 ක් පමණක් වනු ඇත.

පෞද්ගලික විශ්‍රාම අරමුදල් සහ රක්ෂණ සමාගම් හැර 1970/71 වර්ෂයේදී රජයේ ණය වැඩ පිළිවෙලට බැංකු නොවන ආයෝජක කාණ්ඩයන්ගේ ශුද්ධ දයකවීම් හි සාමාන්‍ය වැඩිවීමක් ඇතිවී තිබේ. රජයේ ඉතුරුම් ආයතන වලින්, විශේෂයෙන්ම තැපැල් කන්තෝරු ඉතිරිකිරීමේ බැංකුවෙන්, දයකවීම් 1970/71 වර්ෂයේදී සැළකිය යුතු පරිදි වැඩි විය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී, සේවක අර්ථසාධක අරමුදලද එහි දයකවීම් සියයට 50 කින් ඉහළ නැංවිය.

දේශීය වෙළෙඳපොල නොවන ණය ගැනීම් 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 141 ක් වූ අතර, එය මෑත වර්ෂවලදීට වඩා අය—වැය හිඟය පියවීමට වැඩි ප්‍රමාණය කින් (සියයට 13) ආධාර කරනු ලැබිය. මෙය බෙහෙවින්ම රුපියල් දශලක්ෂ 29 ක පරිපාලන ණය නැවත ගෙවීම් මගින් මඳක් සමනය වූ තැන්පතු හි රුපියල් දශලක්ෂ 153 ක වැඩිවීම නිසා සිදුවිය.

මූල්‍ය කටයුතු සපුරා ගැනීමට මේ වර්ෂයේදී රජයට ලබාගත හැකිවූ මුළු විදේශීය මූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 370 ක් වූ අතර, එම ප්‍රමාණය යෝජනා ක්‍රම ණය රුපියල් දශලක්ෂ 141 කින්, යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය රුපියල් දශලක්ෂ 169 කින් සහ දීමනා රුපියල් දශලක්ෂ 60 කින්ද සමන්විත විය. නිදන් අරමුදල් සහ ණය නැවත ගෙවීම් වලට දයකවීම් වෙනුවෙන් ගලපා ගත්විට ශුද්ධ විදේශීය මූල්‍ය ප්‍රමාණය ඉකුත් මුදල් වර්ෂයේ රුපියල් දශලක්ෂ 226 හා සසඳන විට රුපියල් දශලක්ෂ 234 ක් විය. සමාලෝචනයට භාජනය වන මුදල් වර්ෂය තුළදී, නැවත ගෙවීම් ප්‍රමාණය අඩුකළ විට ශුද්ධ යෝජනා ක්‍රම ණය සහ යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 58 සහ රුපියල් දශලක්ෂ 116 ක් විය. යෝජනා ක්‍රම ණයක් ලෙස වර්ග කරනු ලැබ තිබෙන මහජන චීන සමූහාණ්ඩුවෙන් ලද රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණය අත්හරිනු ලැබුවේ නම්, ඇත්ත වශයෙන්ම, යෝජනා ක්‍රම ණය වෙනුවෙන් ශුද්ධ ගෙවීම් රුපියල් දශලක්ෂ 42 ක් වීමට තිබුණි. ඉකුත් වර්ෂයේදී යෝජනා ක්‍රම ණය වෙනුවෙන් ශුද්ධ ගෙවීම් රුපියල් දශලක්ෂ 19 ක් විය.

ඉකුත් වර්ෂයේදී මෙන්ම, විදේශීය මූල්‍යයෙන් වැඩි කොටසක් ණය මුදල් මගින් විය. කෙසේ වෙතත්, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී දීමනා ප්‍රමාණය 1969/70 වර්ෂයේ ප්‍රමාණයට සමානවම වාගේ පැවති අතර, එය මුළු විදේශීය මූල්‍ය ප්‍රමාණයෙන් සියයට 16 ක් විය. 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 105 කින් අඩුව තිබූ යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය ශුද්ධ ලැබීම් නැවත රුපියල් දශලක්ෂ 66 ක අඩුවීමක් වාර්තා කරනු ලැබිය. 1969/70 වර්ෂයේදී ශුද්ධ මූල්‍ය හිඟයෙන් සියයට 24 ක ප්‍රමාණයක් පියවනු ලැබූ මෙම ලැබීම්, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී එම හිඟයෙන් සියයට 11 ක් පමණක් පියැවීමට ආධාර විය.

II (ඊ) 12 වන සංඛ්‍යා සටහන පසුගිය වර්ෂ හත තුළ මූල්‍ය හා වර්ගය අනුව වූ විදේශාධාර ශුද්ධ ලැබීම් පිළිබඳව විස්තර දක්වයි.

II (ඊ) 12 වෙනි සංඛ්‍යා සටහන

ශුද්ධ විදේශීය ආධාර ලැබීම්

රුපි. දශ ලක්ෂ

මූලය හා වර්ගය	1964/65	1965/66	1966/67	1967/68	1968/69	1969/70	1970/71 (තාවකාලික)
1. ණය ..	75·6	76 5	189 3	161·2	334·1	202·8	220·6 (අ)
1·01 ආසියානු සංවර්ධන බැංකුව ..	—	—	—	—	—	—	9·2
1·02 ජා.ප්‍ර.සං.බැ. ..	5·0	-1·2	- 0·3	-7·7	-8·4	-9·3	-7·7
1·03 ජාත්‍යන්තර සංවර්ධන සංගමය ..	—	—	—	—	—	4·7	20·1
1·04 කැනඩාව ..	11·4	2·5	8·1	8·6	8·5	6·0	7·5
1·05 චීන මහජන සමූහාණ්ඩුව.	18·9	9·7	- 4·9	-5·5	-5·5	4·8	137·7
1·06 එක්සත් රාජධානිය ..	-2·3	10·6	49·4	51·9	37·0	38·2	11·4
1·07 අමෙරිකා එක්සත් ජනපදය ..	-1·2	23·8	31·0	45·6	177·9	49·8	34·4
1·08 සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය ..	28·8	9·3	-10·0	-8·3	-9·6	-9·2	-7·1
1·09 බටහිර ජර්මන් ජනරජය.	7·4	6·7	66·2	25·0	17·4	29·0	1·5
1·10 යුගොස්ලේවියාව ..	-0·3	0·8	- 1·4	-0·7	-0·8	-0·4	-1·3
1·11 පෝලන්තය ..	2·4	0·1	0·1	1·4	-0·6	-0·9	-0·9
1·12 ප්‍රංශය ..	5·5	1·6	10·8	22·0	1·6	10·2	1·5
1·13 ජපානය ..	—	10·0	31·3	24·0	18·3	13·7	8·2
1·14 ඉන්දියාව ..	—	2·6	8·0	-3·4	16·9	23·6	4·7
1·15 ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය ..	—	—	1·1	8·3	79·6	28·3	-9·2
1·16 ඩෙන්මාර්කය ..	—	—	—	—	1·6	8·0	3·4
1·17 ඉතාලිය ..	—	—	—	—	—	6·3	7·2
2. දීමනා ..	24·1	41·5	19·2	29·0	19·5	62·8	59·9
2·01 කොළඹ ක්‍රමය ..	9·0	25·9	17·5	22·1	1·4	26·2	24·1
2·01·1 ඕස්ට්‍රේලියාව ..	3·9	0·3	4·6	—	0·1	4·8	6·0
2·01·2 කැනඩාව ..	5·1	25·6	12·8	22·1	—	18·7	18·1
2·01·3 ජපානය ..	—	—	—	—	—	2·7	—
2·01·4 නවසීලන්තය ..	—	—	0·1	...	1·3	—	—
2·02 වෙනත් ..	15·1	15·6	1·7	6·8	18·2	36·6	35·7
2·02·1 එක්සත් ජාතීන්ගේ සංවිධානය ..	—	1·0	1·5	6·3	3·1	2·0	5·0
2·02·2 චීන මහජන සමූහාණ්ඩුව ..	15·1	2·5	—	...	...	4·7	7·9
2·02·3 අමෙරිකා එක්සත් ජනපදය.	...	12·1	0·2	0·5	0·8	6·6	4·8
2·02·4 බටහිර ජර්මන් ජනරජය ..	...	—	—	—	—	9·7	5·7
2·02·5 වෙකෝස්ලෝ වෙකියාව ..	—	—	..	—	—	—	—
2·02·6 එක්සත් රාජධානිය ..	—	—	...	...	14·3	13·6	9·4
3. ණය සහ දීමනාවල එකතුව ..	99·7	118·0	208·6	190·2	353·6	265·6	280·5

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1969/70 සහ 1970/71 වන වර්ෂ සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 39·2 ක් සහ රුපියල් දශ ලක්ෂ 46·1 ක් වූ විදේශ ණය ආපසු ගෙවීම සඳහා වී. වී. හි. ස ගෙවීම මෙම සංඛ්‍යා සටහනෙහි ගණනය නොකරන ලද ඇති හෙයින් II සංඛ්‍යා ලේඛණ පරිශිෂ්ටයේ 31 වන සටහනෙහි මුළු ණය සංඛ්‍යාවන් සමග නො සැසඳේ.

8. රාජ්‍ය ණය

1970/71 මුදල් වර්ෂයේදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය[1] රුපියල් දශලක්ෂ 910 කින් වැඩිවී 1971 සැප්තැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 8783 ක් විය. (සැපයුම්කරුවන්ගේ ණය සම්බන්ධව රජයේ දෙපාර්තමේන්තුවල වගකීම එකතු කළ විට එය රුපියල් දශලක්ෂ 8848 ක් වේ) නොබෙරා ඉතිරිව තිබූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 80 ක් හෙවත් රුපියල් දශලක්ෂ 6983 ක් දේශීය ණය සම්බන්ධයෙන් වූ අතර ඉතිරි රුපියල් දශලක්ෂ 1800 විදේශීය ණයවලින් සමන්විත විය. නිදන් අරමුදල් (රුපියල් ණය සහ රන්පවුම් ණය සඳහාවූ) අඩු කළ පසු මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 871 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 8108ක් විය.

එක් එක් වර්ෂයන්හි සැප්තැම්බර් අවසානයේදී රාජ්‍ය ණයෙහි හිමිකම් හා සංයුතිය පිළිබඳ විස්තර දෙවැනි පරිශිෂ්ඨයේ 38 සහ 39 වැනි සංඛ්‍යා සටහන්වල දැක්වෙන අතර එහි සම්පිණ්ඩනයක් පහත දැක්වෙන II (ඊ) 13 වැනි සංඛ්‍යා සටහනේ අඩංගු වේ.

II (ඊ) 13 වැනි සංඛ්‍යා සටහන

1967 සිට 1971 දක්වා මුළු රාජ්‍ය ණය (අ)

සැප්තැම්බර් අවසානයට	1967		1968		1969		1970		1971	
	ප්‍රමාණය රුපියල් දශලක්ෂ	%	ප්‍රමාණය රුපියල් දශලක්ෂ	%	ප්‍රමාණය රුපියල් දශලක්ෂ	%	ප්‍රමාණය රුපියල් දශලක්ෂ	%	ප්‍රමාණය රුපියල් දශලක්ෂ	%
1. දළ ණය ..	**5,321·5**	**100·0**	**6,270·8**	**100·0**	**6,888·5**	**100·0**	**7,873·2**	**100·0**	**8,782·8**	**100·0**
I. විදේශීය ..	739·3	13·9	1,074·3	17·1	1,375·5	20·0	1,578·4	20·1	1,800·1	20·5
II. දේශීය ..	4,582·2	86·1	5,196·5	82·9	5,513·0	80·0	6,294·8	79·9	6,982·6	79·5
2. ශුද්ධ ණය (ආ) ..	**4,782·3**	**100·0**	**5,689·3**	**100·0**	**6,238·9**	**100·0**	**7,236·8**	**100·0**	**8,108·0**	**100·0**
I විදේශීය ..	708·0	14·8	1,038·3	18·3	1,337·3	21·4	1,550·9	21·4	1,767·6	21·8
II. දේශීය ..	4,074·3	85·2	4,651·0	81·7	4,901·6	78·6	5,685·9	78·6	6,340·4	78·2

මූලය. ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) (I) 1971 සැප්තැම්බර් අවසානයට, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 106·0 ක සහ රුපියල් දශ ලක්ෂ 32·3 ක ජාතික නිවාස සහ රාජ්‍ය උකස් බැංකු ණයකරයන් හැර; (II) සැපයුම් කරුවන්ගේ ණය යටතේ රජයේ දෙපාර්තමේන්තු විසින් කරන ලද ආනයනයන් සම්බන්ධයෙන් වූ රුපියල් දශ ලක්ෂ 64·8 ක ණය මුදල හැර; (III) ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන් වෙත නිතුත් කරන ලද පොරොන්දු පත්‍ර හැර.

(ආ) රන්පවුම් හා රුපියල් ණය වෙනුවෙන් වූ නිදන් අරමුදල් හැර දළ ණය.

1970/71 මුදල් වර්ෂයේදී දළ හා ශුද්ධ ණයෙහිවූ පිළිවෙලින් රුපියල් දශලක්ෂ 910 ක සහ රුපියල් දශලක්ෂ 871 ක වැඩිවීම්, ඉකුත් වසරේ වාර්තාගතවූ, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 985 ක සහ රුපියල් දශලක්ෂ 998 ක වැඩිවීම්වලට වඩා අඩු විය. දළ රාජ්‍ය ණයෙහි රුපියල් දශලක්ෂ 910 ක වැඩිවීම, විදේශීය ණය රුපියල් දශලක්ෂ 222 කින් (සියයට 24 ක්) සහ දේශීය ණය රුපියල් දශලක්ෂ 688 කින් (සියයට 76 ක්) සමන්විත විය. ඉකුත් මුදල් වර්ෂයේ දළ ණයට ඇතුළත් විදේශීය හා දේශීය ණයවල වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 203 ක් (සියයට 21) සහ රුපියල් දශලක්ෂ 782 ක් (සියයට 79) විය.

ඉකුත් වසරේ වාර්ෂික වාර්තාවේ[2] දක්වූන පරිදි 1969/70 වර්ෂයේදී දළ දේශීය ණය ප්‍රමාණය සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, (මෙම වැඩිවීම 1968/69 වර්ෂයේ වැඩිවීම මෙන් දෙගුණයකටත් වඩා ඉහළ විය) එම වර්ෂයේදී දළ විදේශීය ණය ප්‍රමාණයේ වැඩිවීම ඉකුත් වසරේ වැඩිවීම සමග සසඳන විට සැලකිය යුතු පහත මට්ටමක පැවතින. එනමුත්, දළ ණයෙහි විදේශීය ණය කොටස 1969/70 දී සුළු වශයෙන් (සියයට 20·0 සිට සියයට 20·1 දක්වා) වැඩිවිය.

1. මෙහි "රාජ්‍ය ණය" යන්නෙන් අදහස් කරනුයේ ලංකාණ්ඩුවේ දේශීය හා විදේශීය ණය ගැනීම පමණි. රාජ්‍ය සංස්ථා සහ පළාත් පාලන ආයතන වැනි අර්ධ–රාජ්‍ය ආයතනවල ණය මෙයින් බැහැර වේ. තවද, සැපයුම් කරුවන්ගේ ණය යටතේ රජයේ දෙපාර්තමේන්තු විසින් කරන ලද ආනයනයන් හා සම්බන්ධ, 1971 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 65 ක් වූ ණය ප්‍රමාණයද මෙයට ඇතුළත් කර නොමැත.

2. 1970 වාර්ෂික වාර්තාව – 160 වැනි පිටුව.

මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, 1970/71දී දේශීය ණයෙහි වැඩිවීම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 94 කින් පහළ ගිය අතර විදේශීය ණයෙහි වැඩිවීමෙහි රුපියල් දශලක්ෂ 19 ක ඉහළ යාමක් වාර්තා විය. දළ ණයෙහි විදේශීය ණය කොටස 1970/71 දී යලිත් සියයට 20·5 දක්වා ආන්තික ලෙස වැඩිවිය. මෙසේ, විසුමට භාජනය වන වර්ෂයේදී විදේශීය සම්පත් කෙරේ වැඩි රැඳියාවක් දක්නට ලැබුණි. තවද, 1966/67 සිට 1970/71 දක්වා කාලච්ඡේදය තුළ දළ ණයෙහි ඇතුළත් විදේශීය ණය ප්‍රමාණය සියයට 13·9 සිට සියයට 20·5 දක්වා අඛණ්ඩව වැඩිවූ බවද පෙනී යන්නකි.

1971/72 මුදල් වර්ෂය තුළදී[1] රජය දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 640[2] ක් සහ විදේශීය මාර්ගයන්ගෙන් රුපියල් දශලක්ෂ 662 ක් ලබා ගැනීමට බලා-පොරොත්තු වෙයි. මෙයින් රුපියල් දශලක්ෂ 662 ක මුදල් ප්‍රමාණය, යෝජනාක්‍රම ණය රුපියල් දශලක්ෂ 162 කින්ද, යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය රුපියල් දශලක්ෂ 500 කින් සහ මුදල් ණය රුපියල් දශලක්ෂ 50[3] කින් සමන්විතය.

(i) දේශීය ණය

1970/71 මුදල් වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 6983 ක්ව පැවති දළ දේශීය ණය ප්‍රමාණය ඉකුත් මුදල් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 688 ක (සියයට 11 ක) වැඩිවීමක් පෙන්විය. පසුගිය මුදල් වර්ෂ පහේ අවසානයේදී, දේශීය ණය සංයුතිය හා එහි වෙනස්වීම් පහත II (ඊ) 14 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

II (ඊ) 14 වැනි සංඛ්‍යා සටහන

දේශීය රාජ්‍ය ණය සංයුතිය සහ එහි වෙනස්වීම්—1966—1971

රුපියල් දශ ලක්ෂ

සැප්තැම්බර් අවසානයට	රුපියල් ණය			භාණ්ඩාගාර බිල්පත්	බැඳුම්කර සංයුතිය	බැංකු මහ බැංකු අත්තිකාරම් (ආ)	ජාතික සංවර්ධන බිල්පත් (ඇ)	එකතුව	
	දළ	නිදන් අරමුදල් (අ)	ශුද්ධ					දළ	ශුද්ධ
1966	2,474·6	448·0	2,026·6	1,425·0	32·2	262·6	0·1	4,194·5	3,746·5
1967	2,784·8	507·8	2,276·9	1,500·0	25·7	271·6	0·1	4,582·2	4,074·3
1968	3,117·9	545·5	2,572·4	1,750·0	24·0	304·5	0·1	5,196·5	4,651·0
1969	3,409·1	611·4	2,797·7	1,750·0	24·5	329·3	0·1	5,513·0	4,901·6
1970	3,924·9	608·9	3,316·0	1,950·0	45·4	374·4	0·1	6,294·8	5,685·9
1971	4,511·9	642·2	3,869·6	2,025·0	66·0	379·5	0·2	6,982·6	6,340·4
වෙනස 1967/66	+310·2	+59·8	+250·3	+ 75·0	−6·5	+ 9·0	—	+387·7	+327·8
වෙනස 1968/67	+333·1	+37·7	+295·5	+250·0	−1·7	+32·9	—	+614·3	+576·7
වෙනස 1969/68	+291·2	+65·9	+225·3	—	+0·5	+24·8	—	+316·5	+520·6
වෙනස 1970/69	+515·8	− 2·5	+518 3	+200·0	+20·9	+45·1	—	+781·8	+784·3
වෙනස 1971/70	+587·0	+33·3	+553·6	+ 75·0	+20·6	+ 5·1	+0·1	+687·8	+654·5

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) නිදන් අරමුදල් වෙනුවෙන් පැවති ආයෝජනයන්හි වෙළඳ වටිනාකම නියෝජනය කෙරේ. (අතිරේක නිදන් අරමුදල්ද ඇතුළත්ය.)

(ආ) ජා මු. අ., ජා. ප්‍ර සං බැ, ජා ස. සං, ආ. සං. බැ. ආදියෙහි සාමාජික මුදල් ගෙවීම සඳහා වූ විශේෂ ණයද ඇතුළත්ය. 1970 සහ 1971 සැප්තැම්බර් අගදී පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 92·0 ක් සහ රුපියල් දශ ලක්ෂ 93·2 ක් වූ මෙම ණය හැරුණු විට, 1970/71 දී මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 3·9 කින් වැඩි විය. ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන් වෙත නිකුත් කළ පොරොන්දු පත්‍ර මෙම විශේෂ ණයවලට ඇතුලත් නොවේ.

(ඇ) 1970 සැප්තැම්බර් අග වනවිට නිකුත් කරන ලද හා ගෙවීමට ඉතිරිව තිබූ ජාතික සංවර්ධන බිල්පත්හි වටිනාකම රුපියල් 58,828 ක් වූ අතර, 1971 සැප්තැම්බර් අගදී එය රුපියල් 216,894 දක්වා වැඩිවී තිබුණි.

1· 1971 ඔක්තෝබර් 1 වැනි දින සිට 1972 දෙසැම්බර් 31 වැනි දින දක්වා.

2· රුපියල් දශලක්ෂ 40 ක අනිවාර්‍ය ඉතිරි කිරීම් ඇතුළත්ය.

3· 1970/71 මුදල් වර්ෂයේදී ගිවිස ගත්, චීන මහජන සමූහාණ්ඩුවෙන් ලද රුපියල් දශලක්ෂ 150 ක ණය මුදලේ ඉතිරි කොටස වේ.

දළ දේශීය ණයෙහි රුපියල් දශලක්ෂ 688 ක වැඩිවීම, රුපියල් ණය මුදල්හි රුපියල් දශලක්ෂ 587 ක වැඩිවීමකින්ද, භාණ්ඩාගාර බිල්පත්හි රුපියල් දශලක්ෂ 75 ක වැඩිවීමකින්ද, බදු සංචිත සහතික පත්වලින් වූ රුපියල් දශලක්ෂ 21 ක වැඩිවීමකින්ද, මහ බැංකු අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 5 ක වැඩිවීමකින් සහ ජාතික සංවර්ධන පිළිනපත්හි ආන්තික වැඩිවීම කින්ද සමන්විත විය.

ඉකුත් මුදල් වර්ෂයේ දළ දේශීය ණයේ රුපියල් දශලක්ෂ 782 කින් වූ වැඩිවීම, රුපියල් ණයෙහි රුපියල් දශලක්ෂ 516 කද, භාණ්ඩාගාර බිල්පත්හි රුපියල් දශලක්ෂ 200 කද, බදු සංචිත සහතික පත්හි රුපියල් දශලක්ෂ 21 ක සහ මහ බැංකු අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 45 ක වැඩිවීම්වල සාමූහික ප්‍රතිඵලයක් විය.

සමාලෝචිත වර්ෂය තුළදී නොගෙවා ඉතිරිව තිබූ දළ දේශීය ණයෙහි රුපියල් සුරැකුම් පත් දැරූ කොටස සියයට 62 සිට සියයට 65 දක්වා ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බිල්පත් විසින් දරණ ලද කොටස සියයට 31 සිට සියයට 29 දක්වා පහළ ගියේය. මේ අතර මහ බැංකු අත්තිකාරම්, බදු සංචිත සහතික සහ ජාතික සංවර්ධන පිළිනපත්වල කොටස්හි සිදු වූයේ ආන්තික වෙනස්කම් පමණි.

මෑත වර්ෂවල රජයේ දේශීය ණය ගැනීමේහි සැලකිය යුතු ලක්ෂණයක් නම් රාජ්‍ය මූල්‍ය සම්බන්ධව දේශීය මාර්ගවලින් රුපියල් ණය කෙරේ රඳා සිටීම වැඩිවීමයි. 1965/66 සිට 1970/71 දක්වා කාලච්ඡේදය තුළදී නොගෙවා ඉතිරිව තිබූ දළ දේශීය ණයෙහි රුපියල් ණය කොටස සියයට 59 සිට සියයට 65 දක්වා අඛන්ඩව වැඩිවිය. තවද විමසුමට භාජනය වන වර්ෂය තුළදී දළ දේශීය ණයෙන් සියයට 85 ක් ලැබුනේද මේ මාර්ගයෙනි. භාණ්ඩාගාර බිල්පත් මගින් ලද මුදල් ප්‍රමාණය පසුගිය මුදල් වර්ෂයේ වාර්තාවූ වැඩිවීමට වඩා රුපියල් දශලක්ෂ 125 ක පහළ යාමක් පෙන්වීය. මෙය, ඉකුත් මුදල් වර්ෂය හා සැසඳීමේදී, 1970/71 වර්ෂයේ දළ දේශීය ණයෙහි ඌන වැඩිවීමට මූලික හේතුවක් විය. ඉකුත් වර්ෂයන් හා සසඳන විට 1969/70 වර්ෂයේදී අතිශය මුදල් ප්‍රමාණයක් (රුපියල් දශලක්ෂ 20·9 ක්) ලබා දුන් බදු සංචිත සහතික පත් මගින් 1970/71 මුදල් වර්ෂයේදී ද ඒ හා සමානම මුදල් ප්‍රමාණයක් ලැබුණි.

1971 සැප්තැම්බර් අවසානයට දළ දේශීය ණයෙහි කල්පිරීම් රටාව පදනම් කොට කරන ලද විශ්ලේෂණයක්, ඉකුත් මුදල් වර්ෂ සතර පිළිබඳ අනුරූප සංඛ්‍යා සමග II (ඊ) 15 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ.

1970/71 මුදල් වර්ෂයේදී මුළු දේශීය ණයෙහි අන්තර්ගත දේශීය අරමුදල්ගත ණය (මුළු-මනින්ම රුපියල් සුරැකුම්පත්වලින් සමන්විත) විසින් දරණ ලද කොටස ප්‍රතිශතාංක 3 කින් වැඩිවූ අතර අරමුදල්ගත නොවූ ණය (ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත) දැරූ කොටස එම ප්‍රමාණයෙන්ම අඩු විය. තවද අරමුදල්ගත නොවූ ණය දැරූ කොටසෙහි ක්‍රමික පිරිහීමක් තිබුණි. 1967 සැප්තැම්බර් අවසානයේදී සියයට 39 ක්වූ එය 1971 සැප්තැම්බර් අවසානයේදී සියයට 35 දක්වා අඩුවිය. දේශීය ණය සංයුතියෙහි වෙනස්වීම්වලට හේතු වූ කරුණු මීට ඉහතින් දක්වා ඇත. කෙසේ වුවද, ඉතා පුළුල් වශයෙන් බලන කළ අරමුදල් ගත ණයවලට අරමුදල්ගත නොවූ ණයවල අනුපාතය පූර්ව මුදල් වර්ෂ හතරේදී මෙන්ම ආසන්න වශයෙන් 2:3 ක්ව නොකඩවා පැවතුණි.

1970/71 වර්ෂයේදී නිකුත් කළ ණය සියල්ලම වාගේ අවුරුදු 10-12 කල් පිරෙන ඒවා විය.[1] පූර්ව මුදල් වර්ෂය අවසානයේදී සියයට 8·5 ක්ව පැවති අවුරුදු 10-15 කල් පිරීමකින් යුක්තවූ සුරැකුම්පත් කාණ්ඩයේ ප්‍රතිශතය, මෙසේ 1971 සැප්තැම්බර් අවසාන වන විට සියයට 19·4 දක්වා කැපී පෙනෙන පරිදි ඉහළ ගියේය. ඊළඟ අවුරුදු පහ තුළදී සහ අවුරුදු 20-25 තුළදී කල් පිරෙන සුරැකුම්පත්වල ප්‍රතිශතය පිළිවෙලින් 1970 සැප්තැම්බර් මස අගදී සියයට 8 සහ 23 සිට 1970/71 මුදල් වර්ෂය අවසානයේ දී පිළිවෙලින් සියයට 6 සහ 17 දක්වා අඩුවිය. 1970/71 වර්ෂය තුළදී දිගු කාලීන ණයවල සිට මධ්‍ය කාලීන ණය වෙත කල් පිරීමේ රටාවේ ඇතිවූ මෙම විතැන්වීම මෙම ණය වර්ග දෙක අතර අසම ව්‍යාප්තිය අඩු කරනු ලැබූ මුත් කෙටි කාලීන ණය නිකුත්කිරීම මගින්, ණය ආපසු ගෙවීමේ බර වඩා සමානව බෙදා හැරීමේ ඉඩ තවමත් පවතින බව පෙනේ.

---

1 අවුරුදු 5 සිට 7 දක්වා කල් පිරෙන සියයට 9 යේ හැරවුම් ණයක්ද 1970/71 දී නිකුත් කරන ලදි.

II (ඒ) 15 වැනි සංඛ්‍යා සටහන

කල්පිරීම අනුව දේශීය ණය විශ්ලේෂණය

(සැප්තැම්බර් අවසානයට)

	1967		1968		1969		1970		1971	
	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය	ප්‍රමාණය රු. දශලක්ෂ	ප්‍රතිශතය
1· අරමුදල්ගත නොවූ ණය (අ) ..	1,797·3	39·2	2,078·6	40·0	2,103·8	38·2	2,369·9	37·6	2,470·6	35·4
2· අරමුදල්ගත ණය (ආ) ..	2,784·8	60·8	3,117·9	60·0	3,408·6	61·8	3,924·9	62·4	4,511·9	64·6
2·1 මුල් පස් වස ..	330·6	7·2	452·1	8·7	534·9	9·7	491·1	7·8	397·4	5·7
2·2 වර්ෂ 5—10 ..	289·6	6·3	315·7	6·1	235·8	4·3	383·2	6·1	492·7	7·1
2·3 වර්ෂ 10—15 ..	386·0	8·4	249·1	4·8	247·0	4·5	534·6	8·5	1,352·4	19·4
2·4 වර්ෂ 15—20 ..	421·8	9·2	600·0	11·5	795·0	14·4	1,047·4	16·6	1,118·0	16·0
2·5 වර්ෂ 20—25 ..	1,356·8	29·6	1,501·0	28·9	1,595·9	29·0	1,468·5	23·3	1,151·4	16·5
3. එකතුව	4,582·1	100·0	5,196·5	100·0	5,512·4	100·0	6,294·8	100·0	6,982·5	100·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතිකපත්, මහ බැංකු අත්තිකාරම් සහ ජාතික සංවර්ධන පිළිණපත් ඇතුලත්ව.

(ආ) කල්පිරෙන අවසන් දිනට.

(අ) රුපියල් සුරැකුම්පත්

1970/71 වර්ෂයේදී රුපියල් ණය 13 ක් නිකුත් කරන ලදි. මෙවායින් 3 ක් හැරවුම් ණය විය. ණය නිකුතු 10 ක්ම වර්ෂ 10-12 කල් පිරීමකින් යුක්තවූ අතර ඒවායේ වාර්ෂික පොළිය සියයට 9 ක් විය. රුපියල් ණය මගින් ලබා ගත් මුළු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 681 ක්වූ අතර ඉන් හැරවුම් ණයවලින් ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 86 ක් විය. මෙය 1969/70 දී ලබා ගත් රුපියල් දශලක්ෂ 579 සමග සැසඳිය හැකිය. මෙයින් රුපියල් දශලක්ෂ 27 ක් හැරවුම් ණයවලින් ලැබුණි.

1970/71 වර්ෂයේදී නිකුත් කළ එක් එක් රුපියල් ණය සඳහා ගෙවීම් පිළිබඳ විස්තර දෙවෙනි පරිශිෂ්ඨයේ 40 වෙනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. II (ඊ) 16 වෙනි සංඛ්‍යා සටහන ඉකුත් මුදල් වර්ෂ හතර තුළදී නිකුත් කළ රුපියල් ණය සඳහා ගෙවීම් සාරාංශ කොට දක්වයි.

II (ඊ) 16 වැනි සංඛ්‍යා සටහන
රුපියල් සුරැකුම්පත් සඳහා ගෙවුම් වර්ග කිරීම (අ)

ගෙවුමය	1967/68		1968/69		1969/70		1970/71	
	මිලියන රු.	ප්‍රතිශතය	මිලියන රු.	ප්‍රතිශතය	මිලියන රු.	ප්‍රතිශතය	මිලියන රු.	ප්‍රතිශතය
1. බැංකු අංශය	0·8	0·2	0·6	0·2	117·5	20·3	12·7	1·9
1·1 වෙළඳ බැංකු ..	0·8	0·2	0·6	0·2	117·5	20·3	12·7	1·9
2. බැංකු නොවන අංශය ..	358·9	99·7	339·4	99·8	461·7	79·7	668·1	98·1
2·1 ඉතුරුම් ආයතනයන් ..	48·8	13·6	36·0	10·6	156·1	26·9	216·0	31·7
2·2 නිදන් අරමුදල් ..	114·1	31·7	111·8	32·9	83·0	14·3	161·8	23·8
2·3 දෙපාර්තමේන්තු හා වෙනත් නිල අරමුදල් ..	9·5	2·6	8·4	2·5	6·2	1·1	9·4	1·4
2·4 සේවක අර්ථසාධක අරමුදල්	92·4	25·7	101·3	29·8	97·9	16·9	143·0	21·0
2·5 රක්ෂණ සංස්ථාව ..	53·2	14·8	42·5	12·5	45·5	7·9	60·8	8·9
2·6 පෞද්ගලික අර්ථසාධක, විශ්‍රාම වැටුප් අරමුදල් ..	29·2	8·1	36·8	10·8	53·9	9·3	62·1	9·1
2·7 රක්ෂණ සමාගම් ..	4·4	1·2	0·6	0·2	16·1	2·8	6·3	0·9
2·8 වෙනත් සමාගම ..	0·8	0·2	0·2	0·1	0 6	0·1	0·8	0·1
2·9 පුද්ගලයන්, සමාජ හා ආයතනයන් ..	6·6	1·8	1·5	0·4	2·5	0·4	7·9	1·2
3. එකතුව	359·7	100·0	340·0	100·0	579·2	100·0	680·7	100·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) රුපියල් ණය පමණක් සඳහා වේ.

රුපියල් ණය මාර්ගයෙන් රජය විසින් රැස් කළ සම්පත් ප්‍රමාණයේ සැලකියයුතු වැඩිවීමක් 1968/69 සිට ඇතිවී තිබෙන බව පෙනේ. දේශීය මාර්ගයන්ගෙන් මුදල් ගලා ඒමේ මෙම අනුක්‍රමික වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බැංකු නොවන අංශයෙන්, විශේෂයෙන් ඉතිරි කිරීම් ආයතන,[1] නිදන් අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, පෞද්ගලික අර්ථසාධක සහ විශ්‍රාම අරමුදල් යන ඒවායින් ලද වැඩිවූ සහයෝගයයි. බැංකු නොවන පෞද්ගලික අංශයද,[2] රජයේ සුරැකුම් පත්වල මුදල් ආයෝජනය කිරීම අනුක්‍රමයෙන් වැඩිවී ඇති අතර, බැංකු අංශය රජයේ සුරැකුම්පත් මිළදී ගැනීම 1967/68 සිට කැපී පෙනෙන පරිදි අඩුවී තිබේ. 1967/68, 1968/69 වර්ෂයන්හි රුපියල් දශලක්ෂ 1 ටත් වඩා පහළ වැටුණු මෙම අංශයේ දයකවීම 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 118 දක්වා වැඩිවිය. කෙසේ වෙතත් 1969/70 වර්ෂයේදී බැංකු ක්‍රමයේ මෙම දයකවීම එම වර්ෂයේදීම රුපියල් දශලක්ෂ 125 ක්වූ නොබෙරා තිබූ ආහාර (ආයාත) බිල රජය විසින් පියවීමට සෘජුව සම්බන්ධ විය. 1970/71 වර්ෂයේදී රුපියල් ණයවල මුළු ගෙවීම්වලින් වාණිජ බැංකුවල දයකත්වයන් සියයට 2ක් පමණ විය.

1. තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේබැංකුව සහ ඉතිරි කිරීමේ සහතික පත්‍ර අරමුදල මීට අඩංගුය.
2. පෞද්ගලික අර්ථසාධක සහ විශ්‍රාම අරමුදල්, රක්ෂණ සහ අනෙකුත් සමාගම්, පුද්ගලයන්, සමාජ සහ ආයතන මීට අඩංගුය.

අතීතයේදී සුරැකුම්පත්වලට දායකවීම් පිළිබඳ ප්‍රධාන මාර්ග වූයේ ඉතුරුම් ආයතන, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, නිදන් අරමුදල්, නිල අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල යන ඒවායෙන් සමන්විතවූ රාජ්‍ය සහ අර්ධ-රාජ්‍ය මූලයන්ය. 1967/68 හා 1968/69 යන මුදල් වර්ෂවලදී රුපියල් ණය සඳහා දායකවීම්වලින් සියයට 88 ක් හිමිකර ගත් මෙම අංශය 1969/70 දී එය සියයට 66 දක්වා අඩු කළ අතර, 1970/71 වර්ෂයේදී නැවත සියයට 87 දක්වා ඉහළ නැංවීය. මෙම ප්‍රතිශතයන්ගේ විශාලත්වය රජයේ ණය වැඩ පිළිවෙලේ ක්‍රියාකාරිත්වය මෙම අංශය මත කෙතරම් විශාල ලෙස රඳා පවතීද යන්න පෙන්වයි.

1970/71 වර්ෂයේදී රුපියල් සුරැකුම්පත් සඳහා ප්‍රධාන දායකයන් වූයේ ඉතුරුම් ආයතන (රුපියල් දශලක්ෂ 216 ක් හෝ සියයට 32), නිදන් අරමුදල් (රුපියල් දශලක්ෂ 162 ක් හෝ සියයට 24),සේවක අර්ථසාධක අරමුදල (රුපියල් දශලක්ෂ 143 ක් හෝ සියයට 21),ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (රුපියල් දශලක්ෂ 61 ක් හෝ සියයට 9) සහ පෞද්ගලික විශ්‍රාම සහ අර්ථ සාධක අරමුදල් (රුපියල් දශලක්ෂ 61 ක් හෝ සියයට 9 ක්) ය. රාජ්‍ය සහ අර්ධ-රාජ්‍ය ආයතනවලින් 1970/71 වර්ෂයේදී රුපියල් සුරැකුම්පත්වලට ලද වැඩිවූ සහයෝගයට, ප්‍රධාන වශයෙන්ම 1970/71 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේදී යෝජනා කොට ඉන්පසු ක්‍රියාත්මක කරනු ලැබූ ඇතැම් ක්‍රියාමාර්ග සෘජුව හෝ වක්‍රව ඉවහල් විය. මේවා නම් රුපියල් 100 සහ 50 නෝට්ටු විමූල්‍යනය, රජයේ ණය සඳහා වූ පොළී අනුපාතිකය ඉහළ නැංවීමේ යෝජනාව සහ සේවක අර්ථසාධක අරමුදලේ දයකත්ව අනුපාතිකයන් ඉහළ නැංවීම සහ ඊට ඇතුළත් වන ක්ෂෙත්‍රය පුළුල් කිරීම යන ඒවාය.

1969/70 දී මුළු කාලච්ඡේදයම ඉහළ මට්ටමට ළඟාවූ ඉතුරුම් ආයතනයන්ගේ (තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව, ලංකා ඉතිරි කිරීම් බැංකුව සහ ඉතිරි කිරීමේ සහතික පත්‍ර මීට අඩංගු වේ.) දයකවීම් 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 216 ක නව වාර්තාගත මට්ටම-කට පැමුණුනි. මෙයින් රුපියල් දශලක්ෂ 128 ක් තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකු වෙන් වූ අතර, රුපියල් දශලක්ෂ 88 ක් ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතින් විය. 1970 ඔක්තෝබර්/නොවැම්බර් විමූල්‍යනයෙන් පසු තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සැලකියයුතු වැඩිවීමක් (ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයේදී රුපියල් දශලක්ෂ 81 ක පමණ) වාර්තා ගතවිය. මේ තැන්පතුවලින් වැඩි කොටස රජයේ ණය වැඩ පිළිවෙලට යොදවනු ලැබීය. තැන්පත්කරුවන්ට ඉදිරිපත් කළ නව පොළී අනුපාතිකයන් තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට හේතුවී තිබීමට පුළුවන. ලංකා ඉතිරි කිරීම් බැංකුවේ දයකවීම්වලින් රුපියල් දශලක්ෂ 33ක්, එම බැංකුව විසින් මහ බැංකුවට කළ අඩු ඵලදායි රුපියල් ණයපත් විකිණීම නිසා ඇතිවූ ප්‍රති-ආයෝජන විය. ඉතිරි ආයෝජනයන්ගෙන් වැඩි කොටස ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වූ තැන්පතු වැඩිවීම නිසාසිදුවූ ඒවා විය හැකිය. මේ තැන්පතු වැඩිවීමට විමූල්‍යනය හා ඉහළ පොළී අනුපාතිකයන් බෙහෙවින් ආධාර වන්නට ඇත.

1970/71 වර්ෂයේ දී රුපියල් සුරැකුම් පත් සඳහා ඊලඟ විශාලම දායකයා වූයේ නිදන් අරමුදල් ය. නිදන් අරමුදල්හි ආයෝජන හැකියාව සම්පූර්ණයෙන්ම වාගේ තීරණය වනුයේ ද්‍රවශීලතා සාධක මගින්ය. පවතින පොළී ප්‍රමාණයන් ඒවායේ ආයෝජන සැළසුම් කෙරේ කිසිදු බලපෑමක් නොමැත. 1965/70, සියයට 3 ජාතික සංවර්ධන ණය (මුහුණත වටිනාකම රුපියල් දශලක්ෂ 64·8) පරිවර්ත්‍ය කිරීම නිසා 1970/71 දී එහි ආයෝජන වලින් වැඩි කොට සක් භාණ්ඩාගාර බිල්පත් වල සිට රුපියල් ණය වෙත විතැන් කිරීමට නිදන් අරමුදලට හැකි විය. නිදන් අරමුදල් 1969/70 වර්ෂයේ අවසාන භාගය තුළදී මෙම කල්පිරෙන බිල්පත් තොගය සඳහා මුදල් ගෙවීම පහසු කරවීමට එහි භාණ්ඩාගාර බිල්පත් තොගය වැඩි කර ගෙන තිබුණි. එපමණක් නොව මේ ණයෙහි කාලවෙජදය අවුරුදු 21-25 සිට අවුරුදු 10-12 දක්ව කෙටි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිදල් අරමුදල් දයකවීම් අනුපාතිකයේ ඉහළ යාමක් (අවුරුදු 21-25 ණයපත් සඳහා සියයට 2½ වාර්ෂික දයකවීම් අනුපාතිකයේ සිට අවුරුදු 10 12 ණයපත් සඳහා සියයට 5 දක්වා) ඇති වුණි. මෙම කරුණුත් උපයන ලද ඉහළ පොළී අනුපාතිකයනුත් නිසා නිදන් අරමුදල් ආයෝජන හැකියාවේ පුළුල් වීමක් ඇතිවී තිබුණි.

සේවක අර්ථසාධක අරමුදලේ දයකවීමද 1970/71 දී සැළකිය යුතු පරිදි ඉහළ මට්ටමක වූයේය. (1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 98 සමඟ සැසඳීමේදී එය රුපියල් දශලක්ෂ 143 ක් විය). මෙම දයකත්වය වැඩිවීමට මූලික හේතුව වූයේ 1971 ජනවාරි මස සිට ක්‍රියාත්මක වූ සේවක පක්ෂයේ (සියයට 4 සිට සියයට 6 දක්වා) සහ ස්වාමි පක්ෂයේ (සියයට 6 සිට සියයට 9 දක්වා) දයක අනුපාතිකයන්හි ඇතිවූ වැඩිවීමය. පවතින පිළිනපත් අනුපාතිකය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දයකත්වයන්හි කැපී පෙනෙන වැඩිවීමට (1969/70 දී රුපියල් දශලක්ෂ 46 සිට 1970/71 දී රුපියල් දශලක්ෂ 61 දක්වා) හේතුවූ මූලික සාධකය සේ පෙනේ,

බැංකු නොවන පෞද්ගලික අංශයේ දයකත්වයන් 1968/69 දී රුපියල් දශලක්ෂ 39 සිට 1969/70 දී රුපියල් දශලක්ෂ 73 දක්වාද, 1970/71 දී රුපියල් දශලක්ෂ 77 දක්වාද ඉහළ ගියේය. පෞද්ගලික අංශයෙන් වූ ලැබීම්හි මෙම වර්ධනය (1968/69 සිට වූ රුපියල් දශලක්ෂ 38 ක වැඩිවීම) මූලික වශයෙන් අනෙකුත් ආයෝජන මාර්ගයන් සමග රජයේ පිළිනපත් හි තරඟකාරිත්වය නිසා සිදු වූවකි. අනෙක් අතින් තරඟකාරිත්වයේ මෙම දියුණුව මූලික වශයෙන් පොළී අනුපාතිකය ඉහළ යාම සහ කල් පිරීමේ කාලච්ඡේදය කෙටිකිරීම නිසා සිදු වූවකි. පෞද්ගලික කොටස් වෙළඳ පොලේ වූ අවිනිශ්චිත ස්වභාවය සමග සේවක-ස්වාමි පක්ෂයන්හි දායකත්ව අනුපාතිකයන් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අර්ථසාධක අරමුදල්හි ආයෝජන අරමුදල් වැඩිවීම පෞද්ගලික අංශයට රජයේ පිළිනපත් සම්බන්ධව තිබූ රුචිකත්වය ඉහළ නැංවීමට හේතු වන්නට ඇත. කෙසේ වෙතත් බැංකු නොවන අංශයේ රක්ෂණ සමාගම්හි දයකවීම් 1969/70 තුළදී රුපියල් දශලක්ෂ 10 ක පහළ බැසීමක් සටහන් කළේය. රක්ෂණ සමාගම් විසින් මුහුණ දුන්, මූලික වශයෙන් ද්‍රවශීලතා කරුණු මගින් මග පෙන්වනු ලැබූ ඒවායේ ආයෝජන අරමුදල්හි ඇතිවූ ක්‍රමික පහළ යාම සහ ඒවායේ ආයෝජන ප්‍රතිපත්තිය කෙරේ පවතින පොළී අනුපාතිකයන්හි එතරම් බලපෑමක් නොමැතිවීමත් යන කරුණු මගින් මෙය පැහැදිලි කළ යුතුව ඇත.

1970/71 මුදල් වර්ෂය අවසානයේදී රුපියල් සුරැකුම් පත්හි අයිතියේ වර්ග කිරීමක් මීට පෙර මුදල් වර්ෂ හතරක සංසන්දනාත්මක දත්තයන්ද සමග II (ඊ) 17 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

II (ඊ) 17 වෙනි සංඛ්‍යා සටහන.

රුපියල් සුරැකුම්පත්වල හිමිකම (අ) - වර්ෂයන් අවසානයට 1966/67 සිට 1970/71

(රුපියල් දශලක්ෂ)

හිමිකරුවන්	1966/67	1967/68	1968/69	1969/70	1970/71
1· බැංකු අංශය ..	**281·2**	**328·8**	**367·0**	**586·0**	**588·2**
1·1 මහ බැංකුව ..	7·4	70·0	111·8	249·0	247·5
1·2 වාණිජ බැංකු ..	273·7	258·8	255·3	337·0	340·7
2· බැංකු නොවන අංශය ..	**2,503·6**	**2,789·0**	**3,042·0**	**3,338·9**	**3,923·7**
2·1 ඉතුරුම් ආයතන ..	600·5	641·2	641·7	651·5	832·6
2·2 නිදන් අරමුදල් ..	474·2	532·3	614·1	696·2	846·9
2·3 දෙපාර්තමේන්තු හා වෙනත් නිල අරමුදල් .	140·0	147·1	150·8	156·2	163·2
2·4 සේවක අර්ථසාධක අරමුදල ..	519·8	612·1	713·5	811·4	954·4
2·5 වෙනත් අර්ථසාධක අරමුදල් ..	364·3	394·5	423·2	469·3	513·1
2·6 රක්ෂණ සංස්ථාව ..	181·6	234·5	276·9	322·4	383·1
2·7 රක්ෂණ සමාගම් ..	136·5	140·7	139·0	149·8	145·5
2·8 වෙනත් රාජ්‍ය සංස්ථා ..	2·9	2·9	2·9	2·2	2·2
2·9 වෙනත් (ආ) ..	83·8	83·7	79·8	79·8	82·7
3· එකතුව	2,784·8	3,117·9	3,409·1	3,924·9	4,511·9

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රුපියල් ණයවලට පමණක් සීමාවේ.

(ආ) සමූපකාර බැංකු, වෙනත් සමාගම්, සමාජ, ආයතන සහ පුද්ගලයන් ඇතුලත් වේ.

මහජනයා විසින් දරනු ලැබූ රජයේ සුරැකුම් පත්හි මුළු ප්‍රමාණය 1970/71 දී රුපියල් දශ ලක්ෂ 4512 දක්වා රුපියල් දශලක්ෂ 587 කින් (එනම් සියයට 15 කින්) වැඩි විය. මෙම වර්ධනය සම්පූර්ණයෙන්ම වාගේ බැංකු නොවන අංශයේ සුරැකුම් පත් දැරීම් ඉහළ යාම නිසා සිදුවූ අතර, බැංකු අංශයේ සුරැකුම් පත් දැරීම්හි ඉහළ යාම රුපියල් දශලක්ෂ 2 ක් පමණක් විය.

බැංකු අංශයේ මෙම වැඩිවීම වාණිජ බැංකුවල සුරැකුම් පත් දැරීම්හි ඇතිවූ රුපියල් දශ ලක්ෂ 4 ක ඉහළ යාම නිසා සිදුවූ අතර මෙයින් කොටසක් මහ බැංකුවේ සුරැකුම් පත් දැරීම්හි රුපියල් දශ ලක්ෂ 2 කින් අඩුවීම නිසා හිලව් විය. 1970/71 තුළදී මහ බැංකුව ලංකා ඉතිරි කිරීම් බැංකුවෙන් එයට රජයේ නව පිළිනපත්හි ආයෝජනයට ඉඩ සළසනු සඳහා රුපියල් දශලක්ෂ 33 ක සුරැකුම් පත් මිළදී ගනු ලැබීය. (වර්ෂය අවසාන කාලයේදී කල්පිරුණු ණය පත් වලින් මෙය වුවමනාවටත් වඩා හිලව් විය.) මෙසේ මහ බැංකුව රජයේ රුපියල් ණය වැඩිපිළිවෙලට සහාය දීමේ (වක්‍රව වුවද) ප්‍රතිපත්තිය සැළකිල්ලට භාජනය වන වර්ෂයේදී ද නොකඩවා ගෙන ගියේය.

බැංකු නොවන අංශය එහි සුරැකුම් පත් දැරීම් රුපියල් දශලක්ෂ 585 කින් ඉහළ නැංවිය. මෙම ඉහළ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පිළිවෙලින් රුපියල් දශලක්ෂ 181 ක, රුපියල් දශලක්ෂ 151 ක සහ රුපියල් දශලක්ෂ 143 ක වර්ධනයක් පෙන්නුම් කළ ඉතුරුම් ආයතනයන්, නිදන් අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදලත්ය. 1968/69 සිට සේවක අර්ථසාධක අරමුදල ඉහළම රුපියල් සුරැකුම් පත් ප්‍රමාණය ලබා ගෙන තිබෙන අතර, එය 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 954 ක් විය. ඊලඟට එයට ඉතා ආසන්න වන්නේ 1970/71 මුදල් වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රුපියල් දශලක්ෂ 833 ක් සහ රුපියල් දශ ලක්ෂ 847 ක් වටිනා සුරැකුම් පත් තිබූ ඉතුරුම් ආයතන සහ නිදන් අරමුදල්ය.

(ආ) භාණ්ඩාගාර බිල්පත්

1971 සැප්තැම්බර් මාසයේ අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 2025 ක්වූ නිකුත් කළ සහ නොබේරූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1970/71 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 75 කින් වැඩිවිය. 1970 සැප්තැම්බර් මස 25 වැනි දිනදී පාර්ලිමේන්තු සම්මුතියක් මගින් රුපියල් දශලක්ෂ 2050 දක්වා ඉහළ නංවනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ උපරිම සීමාව සලකා බලන වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි.

භාණ්ඩාගාර බිල්පත් නිකුතු පිළිබඳ විස්තර දෙවෙනි පරිශිෂ්ඨයේ 41 වෙනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1970/71 මුදල් වර්ෂය අවසානයේදී භාණ්ඩාගාර බිල්පත්හි අයිතියේ වර්ග කිරීමක්, ඉකුත් මුදල් වර්ෂ හතරක සංසන්දනාත්මක දත්තයන්ද සමග II (ඊ) 18 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

II (ඊ) 18 වෙනි සංඛ්‍යා සටහන

භාණ්ඩාගාර බිල්පත් අයිතිය - 1966/67-1970/71 වර්ෂ අවසානයේදී

රුපියල් දශලක්ෂ

හිමිකරුවන්	1966/67	1967/68	1968/69	1969/70	1970/71
1. බැංකු අංශය ..	1,456·7	1,682·2	1,691·4	1,880·3	1,969·6
1·1 මහ බැංකුව ..	1,377·2	1,586·3	1,637·3	1,833·8	1,670·5
1·2 වාණිජ බැංකු ..	79·5	95·9	54·1	46·5	299·1
2. බැංකු නොවන අංශය ..	43·3	67·8	58·6	69·7	55·4
2·1 නිදන් අරමුදල් ..	36·6	60·3	41·4	55·3	40·8
2·2 සේවක අර්ථසාධක අරමුදල ..	0·3	—	0·3	0·3	0·3
2·3 වෙනත් අර්ථසාධක අරමුදල් ..	0·1	0·1	...	...	0·8
2·4 ඉතුරුම් ආයතන ..	0·2	1·1	1·3	2·4	2·0
2·5 රක්ෂණ සමාගම් ..	6·0	6·0	11·2	8·9	11·4
2·6 අනෙකුත් (අ) ..	0·1	0·3	4·5	2·8	0·2
3. මුළු ගණන ..	1,500·0	1,750·0	1,750·0	1,950·0	2,025·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සමුපකාර බැංකු, අනෙකුත් සමාගම්, සමාජ, ආයතන හා පුද්ගලයන් ඇතුළත් වේ.

භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ රුපියල් දශලක්ෂ 75 කින් ඇතිවූ වැඩිවීම බැංකු අංශයේ බිල්පත් දැරීම් රුපියල් දශලක්ෂ 89 කින් වැඩිවීම සහ බැංකු නොවන අංශයේ බිල්පත් දැරීම් රුපියල් දශලක්ෂ 14 කින් අඩුවීම නිසා සිදු විය. බැංකු අංශය ඇතුළත වාණිජ බැංකු බිල්පත් අයිතිය රුපියල් දශලක්ෂ 253 කින් ඉහළ නැංවූ අතර, මහ බැංකුවේ බිල්පත් දැරීම් රුපියල් දශලක්ෂ 163 කින් අඩු කරනු ලැබීය. වාණිජ බැංකු විසින් මෙසේ විශාල වශයෙන් සුරැකුම් පත් මිලදී ගනු ලැබුයේ 1970 ඔක්තෝබර් මස ක්‍රියාත්මක කරනු ලැබූ විමුලාශනයෙන් ලද අරමුදල් වලිනි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පොළ ප්‍රධාන වශයෙන් මහ බැංකුව මතම රඳා පැවැත්ම දිගටම දක්නට ලැබුණි. භාණ්ඩාගාර බිල්පත් වලින් මහ බැංකුවේ දැරීම් හි ප්‍රමාණය 1971 සැප්තැම්බර් අග වන විට නොබෙරා තිබූ මුළු ප්‍රමාණයෙන් සියයට 83 ක් විය.

බැංකු නොවන අංශය මගින් හිමි කර ගත් ප්‍රමාණයේ පහත වැටීම සම්පූර්ණයෙන්ම වාගේ නිදන් අරමුදල් මගින් හිමි කර ගත් ප්‍රමාණයේ පහත වැටීම නිසා සිදු විය. එසේ වුවත් පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ රක්ෂණ සමාගම් මගින් සුළු වැඩිවීම් පෙන්විය.

සමාලෝචනයට භාජනය වන මුදල් වසර ආරම්භයේදී වාර්ෂිකව සියයට 4·76 ක්ව පැවති භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය 1971 ජුනි 15 ද සිට සියයට 4·798 කට වැඩි කළේය. පසුව 1971 ජුලි 1 වන දින භාණ්ඩාගාර බිල්පත් වල අනුපාතිකය සියයට 5 දක්වා වැඩි කළ අතර එය මුදල් වසර[1] අවසාන වන තුරුම නොවෙනස්ව පැවතුණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවට ගෙවූ පොළී අනුපාතිකය සමාලෝචනයට භාජනය වන මුදල් වසර පුරාම වාර්ෂිකව සියයට 3·24 ක්ව පැවතුණි.

(ඇ) බදු සංචිත සහතික පත්

රුපියල් දශලක්ෂ 450 ක් වන අනුදත් නිකුතුවෙන් 1971 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 413 ක බදු සංචිත සහතික පත් ප්‍රමාණයක් නිකුත් කොට තිබූ අතර, එම දිනයේදී පවාරනය කොට නොතිබූ සහතික පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 66 ක් විය. ඊට පෙර මුදල් වසර අවසානය වන විට පවරා නොතිබූ එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 45 ක්වූ බැවින් පෙර මුදල් වසරේ වූ වැඩිවීමට සමානව රුපියල් දශලක්ෂ 21 ක මේ ස්වරූපයේ ණය වල වැඩිවීමක් සිදුවී ඇත. 1970/71 අවසානයේදී පවරා නොතිබූ ප්‍රමාණය බදු සංචිත සහතික පත් නිකුතුවේ ආරම්භය වූ 1957 වසරේ පටන් මෙතෙක් වාර්තා වූ ඉහළම ප්‍රමාණයයි.

1970/71 වසර තුළදී බදු සංචිත සහතික පත් සඳහා සියයට 3 පොළී අනුපාතිකයේ වෙනසක් සිදු නොවීය. මෙම අනුපාතිකය 1970 මාර්තු 31 ද සිට ක්‍රියාත්මක විය.

(ඈ) මහ බැංකු අත්තිකාරම්

මෙම මුදල් වසර තුළදී ආණ්ඩුවට[2] දුන් මහ බැංකු අත්තිකාරම් 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 45 ක වැඩිවීමක් සමග සසඳන විට රුපියල් දශලක්ෂ 5 කින් වැඩි විය. 1970/71 තුළදී දුන් අත්තිකාරම්වලට, මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලංකාවේ සලාක දායකයන් ගෙවීම සඳහා දුන් රුපියල් දශලක්ෂ 1·2 ක විශේෂ ණයක් ද ඇතුළත් විය.

1971 සැප්තැම්බර් අවසානය වනවිට රජයට දුන් මහ බැංකු අත්තිකාරම්වල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 380 ක් වූ අතර, පෙර මුදල් වසර අවසානයේදී වූ රුපියල් දශලක්ෂ 374 සමග සැසඳේ. මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට ලංකාවේ සාමාජික මුදල් ගෙවීම සඳහා දුන් විශේෂ ණය 1970/71 අවසානය වන විට රුපියල් දශලක්ෂ 93 ක් වූ අතර ඉකුත් මුදල් වසර අගදී එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 92 ක් විය.

---

1. 1971 අගෝස්තු 25 වන දින අතුරු නිකුතුවක් සියයට 4·984 ට සිදු කරනු ලැබීය.
2. මුදල් නීති පණතේ 89 වෙනි ඡේදය ප්‍රකාර.

(ii) විදේශීය ණය

1971 සැප්තැම්බර් මස අවසානය වනවිට මුළු විදේශීය ණය (දළ)[1] රුපියල් දශලක්ෂ 1,800 ක්ව පැවතිණ. 1970/71 මුදල් වසරේදී දළ විදේශීය ණයවල වැඩිවීම රුපියල් දශලක්ෂ 222 ක් විය. සැසඳීමේදී පෙර වසරේ දළ[1] විදේශීය ණයවල වැඩිවීම රුපියල් දශලක්ෂ 188 ක් විය.[2]

1970/71 මුදල් වසරේදී උපයෝජනය කොටගත් විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 310 ක් වූ අතර, මෙයින් රුපියල් දශලක්ෂ 141 ක්[3] (46%) යෝජනා ක්‍රම ණය මගින් ද, රුපියල් දශලක්ෂ 169 ක් (54%) යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය මගින් ද ලැබිණි. චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබූ රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණය උදෙසා ඉඩ හළ විට උපයෝජනය කළ යෝජනා ක්‍රම ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 41 කට අඩු විය යුතුය. පෙර වසරේදී යෝජනා ක්‍රම ණය මගින් සහ යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය මගින් ලබාගත් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 61 ක් (හෝ 22%) සහ රුපියල් දශලක්ෂ 221 ක් (හෝ 78%) විය.

සමාලෝචනයට භාජනය වන වසරේදී වූ විදේශීය සම්පත්වල වැඩි වූ උපයෝජනයට චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබූ මුදල් ණය බෙහෙවින් හේතුවිය. යථෝක්ත මුදල් ණය ශුද්ධ ප්‍රමාණය, යෝජනා ක්‍රම සහ යෝජනා ක්‍රම නොවන ණය යන දෙවර්ගයේම උපයෝජනය පෙර මුදල් වසර සමග සැසඳූ විට, 1970/71 දී අඩුවිය යුතුව තිබුණි. රටේ නිරාකරණය නොවූ තත්ත්වයන්, සමාලෝචනයට භාජනය වන මුදල් වසර තුළ යෝජනා ක්‍රම ආධාරවල පහළ වැටුනු උපයෝජනය සඳහා එක් හේතුවක් විය හැකිය.

මෑත වසර වලදී අය-වැය මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් විදේශීය මූල්‍ය ඉතා වැදගත් මූලාශ්‍රයන් වී තිබේ. II (ඊ) 19 සංඛ්‍යා සටහන මූලික ඇස්තමේන්තු එනම් මුදල් වර්ෂය සඳහා අය-වැය ලේඛනයේ සඳහන් ඇස්තමේන්තු සහ 1965/66 සිට විදේශීය මූල්‍ය පිළිබඳ නියම ලැබීම් පෙන්නුම් කරයි.

II (ඊ) 19 වැනි සංඛ්‍යා සටහන

විදේශ සම්පත් පිළිබඳ මුල් ඇස්තමේන්තු හා නියම ලැබීම්

රුපියල් දශ ලක්ෂ

ආධාර වර්ග	1965/66		1966/67		1967/68		1968/69		1969/70		1970/71	
	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්	මුල් ඇස්ත මේන්තු	නියම ලැබීම්
1. යෝජනා ක්‍රම ආධාර (දීමනා ඇතුළුව)	175·0	118·7	125·0	61·7	125·0	67·0	213·6	113·4	176·8	116·1	111·3	201·0*
2. යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ආධාර	—	35·2	150·0	193·9	150·0	178·9	263·0	312·2	325·0	229·1	525·0	169·0

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබූ රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණය ඇතුළත්වය.

1. ආපසු ගෙවීම්වල ශුද්ධ ප්‍රමාණයයි. නමුත් රන්පවුම් ණය නිදන් අරමුදල් වලට කරන ලද දායක දීමණා අඩු කිරීමට පෙර.
2. 1969 ඔක්තෝබර් 26 වන දින සිදුවූ, රුපියල් දශලක්ෂ 15 කින් විදේශීය ණය වැඩිකළ ජර්මන් ඩොයිට්ෂ් මාර්කයේ අධි ප්‍රමාණයේ බලපෑම් සැලකිල්ලට නොගෙනය.
3. චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබූ රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණයත් ඇතුළත්වය. එය මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් යෝජනා ක්‍රම ණයක් වශයෙන් වර්ගීකරනය කළ අන්දමටය.

1965/66 දී රුපියල් දශලක්ෂ 154 සිට 1968/69 දී රුපියල් දශලක්ෂ 426 දක්වා වැය කටයුතු උදෙසා විදේශීය සම්පත් (දීමනා ඇතුළත්ව) උපයෝජනයේ වැඩිවීමක් දක්නට ලැබේ. පසුගිය වසර දෙකේදී යථොක්ත උපයෝජනය 1968/69 දී වූ ඉහළම ප්‍රමාණයට වඩා අඩුවන නමුදු, 1970/71 දී රුපියල් දශලක්ෂ 370 ක තවමත් පවතී. ඉහත සඳහන් කොට ඇති පරිදි යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ආධාර ලැබීම් අය-වැය හිඟය පියවීමට 1965/66 සිට වැඩි වැඩියෙන් උපකාරි වී තිබේ. අය වැය කටයුතුවල මූලාශ්‍රයක් වශයෙන් මෙය යොදගත් ප්‍රථම වසර 1965/66 යි. කෙසේ වුවද එබඳු ලැබීම් පසුගිය මුදල් වසර දෙක තුළ අය වැයෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට අඩුවී තිබේ. මෙම අඩුවීම 1970/71 දී කැපී පෙනේ. යෝජනා ක්‍රම ආධාරවල නියම යොද ගැනීම (දීමනා ඇතුළත්ව) අය වැය අපේක්ෂාවන්ට[1] වඩා පහළ වැටී ඇත. මෙකී යෝජනා ක්‍රම ආධාරවල නියත පහළයාම සැළසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සහ මූලික ක්‍රියා පිළිවෙල් ප්‍රමාදයන් යන හේතූන් නිසා විය හැක. සිදුවිය හැකිව තිබෙන විදේශීය මූල්‍ය ලැබීම් සහ ඒවා අය-වැය අරමුණු උදෙසා උපයෝජනය කිරීම පිළිබඳ වඩා නිවැරදි පුරෝකථනයන් අවශ්‍ය බව පෙනේ.

1970/71 දී විදේශීය ණයවලින් රුපියල් දශලක්ෂ 88 ක් ආපසු ගෙවා ඇත. මෙම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 53 ක් (හෝ 60%) යෝජනා ක්‍රම ණය වෙනුවෙන්ද, රුපියල් දශලක්ෂ 36 ක් (හෝ 40%) යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය වෙනුවෙන්ද විය. ආපසු ගෙවීම් රහිතව සලකන විට රුපියල් දශලක්ෂ 222 කින් දළ විදේශීය ණය වැඩිවී ඇත. රන්පවුම් ණය නිදන් අරමුදලේ රුපියල් දශලක්ෂ 5 ක වැඩිවීම ගණන් ගත්විට ශුද්ධ විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 217 කින් වැඩිවී ඇත. පෙර වසරේදී ආපසු ගෙවීම් අඩුකොට විදේශීය ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 188 ක් වේ. 1969/70 දී රන්පවුම් ණය නිදන් අරමුදල් වල රුපියල් දශලක්ෂ 11 ක ක්ෂයවීම සහ ජර්මන් මාර්කය අයි ප්‍රමාණය කිරීමේ ප්‍රතිඵලයද (එය රුපියල් දශලක්ෂ 15 කින් විදේශීය ණය ඉහළ නැංවිය) සැලකිල්ලට ගත්විට ශුද්ධ විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 214 ක වැඩිවීමක් වාර්තා කළේය.

රන්පවුම් ණය යෝජනා ක්‍රම සහ යෝජනා ක්‍රම නොවන ණය සම්බන්ධයෙන් වූ ණය ලැබීම්, ආපසු ගෙවීම් සහ වගකීම් පිළිබඳ විස්තර පහත II (ඊ) 20 සංඛ්‍යා සටහනේ දක්වේ.

(අ) රන්පවුම් ණය

1970/71 මුදල් වසර මුළුල්ලේම නොබෙරා තිබූ රන්පවුම් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 71 ක් වූ අතර, එම වසර තුළ ණය ගැනීමක් හෝ ආපසු ගෙවීමක් සිදු නොවීය. කෙසේ නමුත් රන්පවුම් ණය නිදන් අරමුදලේ රුපියල් දශලක්ෂ 5 ක වැඩිවීම නිසා ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 44 පටන් රුපියල් දශලක්ෂ 39 දක්වා පහත වැටුණි.

(ආ) යෝජනා ක්‍රම ණය

1970/71 වර්ෂයේදී උපයෝජනය කළ යෝජනා ක්‍රම ණය රුපියල් දශලක්ෂ 141[2] ක් විය. ශුද්ධ ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 53 ක් විය. එනිසා යෝජනා ක්‍රම ණය යටතේ ණයට ගැනීම් නිසා වූ වගකීම්වල වැඩිවීම රුපියල් දශලක්ෂ 88 කි. චීන මහජන සමූහාණ්ඩුවෙන් ගත් මුදල් ණය හැර 1970/71 දී උපයෝජනය කළ යෝජනා ක්‍රම ණය රුපියල් දශලක්ෂ 41 කි. එබඳු ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 53 ක් වූ බැවින් ඇත්තෙන්ම එබඳු ණය වගකීම් සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 12 කින් වගකීමේ අඩුවීමක් විය යුතුව තිබිණ. මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, පෙර වසරේදී රුපියල් දශලක්ෂ 61 ක ලැබීමක් රුපියල් දශලක්ෂ 46[3] ක ආපසු ගෙවීමක් මගින් හිලව් වූයෙන් රුපියල් දශලක්ෂ 15 කින් එම වගකීම් වැඩිවිය.

---

1. කෙසේ නමුත් 1970/71 දී සැලසුම් කළ ණයක් වශයෙන් රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණයක් ඇතුළත් වීමෙන් නියම ලැබීම් 1971 මූලික ඇස්තමේන්තුගත ලැබීම් ඉක්මවා යයි.
2. චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබූ රුපියල් දශලක්ෂ 100 ක මුදල් ණය ඇතුළත්වය.
3. විදේශීය ණය ආපසු ගෙවීමේදී ගෙවියයුතු වි.වි.හි.ස. මෙහිදී ගණන් නොගෙන ඇති බැවින් මෙම සංඛ්‍යාය 11 (ඊ) 9 සංඛ්‍යාව සටහනේ සහ 11 පරිශිෂ්ඨයේ 31 වැනි සංඛ්‍යා සටහනේ සංඛ්‍යාවන් සමග නොසැසඳේ

II (ඒ) 20 වෙනි සංඛ්‍යා සටහන

විදේශීය ණය

රුපියල් දශ ලක්ෂ

ස්වරූපය හා මූලය	1970/71 දී ණය ගැනීම	1970/71 දී ආපසු ගෙවීම	1970/71 දී වැඩිවීම	1971 සැප්තැම්බර් 30 දිනට වගකීම
1. රන් පවුම් ණය	—	—	—	71 4(අ)
2. සංවර්ධන ක්‍රම ණය	141·1	52·7	88·3	609·9
2·01 ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව	0·9	8·6	– 7·8	139·0
2·02 ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ..	2·4	11·6	– 9·2	108·5
2·03 සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය	2·7	9·8	– 7·1	68·6
2·04 ජර්මන්පෙඩරල් සමූහාණ්ඩුව (ආ) .	1·7	6·0	– 4·3	62·3
2·05 කැනඩාව (ඇ) ..	0·3	5·4	– 5·1	29·1
2·06 චීන මහජන සමූහාණ්ඩුව ..	100·0	5·5	94·5	123·2
2·07 ඇමෙරිකා එක්සත් ජනපදය (ඇ) ..	—	0·3	– 0·3	22·2
2·08 ඩෙන්මාර්කය	3·4	—	3·4	13·0
2·09 ජාත්‍යන්තර සංවර්ධන ආයතනය ..	20·1	—	20·1	24·8
2·10 එක්සත් රාජධානිය	0·4	1·8	– 1·4	2·6
2·11 නැෂනල් හා ග්‍රින්ඩ්ලේස් බැංකුව ..	—	—	—	3·9
2·12 පෝලන්ත මහජන සමූහාණ්ඩුව ..	—	0·9	– 0·9	2·1
2·13 යුගෝස්ලෝවියානු මහජන සමූහාණ්ඩුව.	—	1·3	– 1·3	1·3
2·14 ප්‍රංශය .. .	—	1·5	– 1·5	—
2·15 ආසියානු සංවර්ධන බැංකුව ..	9·2	—	9·2	9·2
3. යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය ..	169·0	35·6	133·4	1,118·9
3·01 ඇමෙරිකා එක්සත් ජනපදය (ඉ) ..	36·6	1·8	34·7	412·0
3·02 එක්සත් රාජධානිය	16·0	2·1	13·9	234·4
3·03 ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව (ආ) ..	5·7	—	5·7	141·5
3·04 ජපානය	20·1	11·9	8·2	116·0
3·05 ප්‍රංශය	17·4	14·4	3·1	53·6
3·06 ඉන්දියාව	9·2	4·5	4·7	55·0
3·07 කැනඩාව	12·6	—	12·6	39·4
3·08 චීන මහජන සමූහාණ්ඩුව ..	43·3	—	43·3	53·6
3·09 ඉතාලිය ..	8·1	0·9	7·2	13·5
4. මුළු එකතුව	310·1	88·3	221·7	1,800·1(අ)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 32·6 ක් රන් පවුම් ණය නිදන් අරමුදල් මගින් පියවා ගනු ලැබිය

(ආ) "ත්‍රෙඩිටන්ස්ටාලට් ෆූර් වීඩාරාප්බාවු" ආයතනයෙන් ලත් ණය ඇතුළත්ය

(ඇ) අපනයන ණය, රක්ෂණ සමායතන ණයද ඇතුළත්ය.

(ඈ) (i) ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය හා (ii) සංවර්ධන ණය අරමුදලින් ගත් ණයද ඇතුළත්ය.

(ඉ) ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතත්වය කෙරෙන් ගත් ණය හා මහජන නීති 480 යටතේ ගත් ණය ද අඩංගුය.

සමාලෝචනයට භාජනය වන වසර තුළ ලබන ලද යෝජනා ක්‍රම ආධාරවල ප්‍රධාන දායක යන් වූයේ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (රුපියල් දශලක්ෂ 20) සහ ආසියානු සංවර්ධන බැංකුවයි. (රුපියල් දශලක්ෂ 9)

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා යෝජනා ක්‍රම ණය වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලැබුණු මුදලින් රුපියල් දශලක්ෂ 13 නැතහොත් මුළු යෝජනා ක්‍රම ණය ප්‍රමාණයෙන් සියයට 33 ක ප්‍රමාණයක් උපයෝජනයට ගෙන ඇත. ජල ප්‍රවාහන හා ගොඩකිරීම් යෝජනා ක්‍රමය (රුපියල් දශලක්ෂ 3) හා ලංකා වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රමය (රුපියල් දශලක්ෂ 2) ආධාර ලැබූ අනෙක් යෝජනා ක්‍රම විය. ආසියානු සංවර්ධන බැංකුවෙන් යෝජනා ක්‍රම ආධාර ලැබූ ප්‍රධාන යෝජනා ක්‍රම නම්, නැව් තටාක යෝජනා ක්‍රමය (රුපියල් දශලක්ෂ 6) සහ උඩවලවේ යෝජනා ක්‍රමය (රුපියල් දශලක්ෂ 4) ත් වේ.

1970/71 මුදල් වර්ෂය අවසානය වන විට ප්‍රයොජනයට ගත් යෝජනා ක්‍රම ණය වලින් නොබෙරා ඉතිරිව ඇති වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 610 ක් විය. මෙය එදිනට නොබෙරා පැවති දළ විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 34 ක් විය. ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී, නොබෙරා පැවති මෙම ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 522 ක් හෝ එම වර්ෂය අවසානයේදී නොබෙරා පැවති දළ විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 33 ක් විය.

(ඇ) යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය

1970/71 වර්ෂයේදී 'භාණ්ඩ ආධාර වැඩ පිළිවෙල' යටතේ උපයෝජනය කර ඇති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 169 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 221 ක් විය. ආපසු ගෙවීම් අඩුකළ විට භාණ්ඩ ආධාර වැඩ පිළිවෙල යටතේ කරන ලද ණය ගැනීම් නිසා වගකීම් වැඩිවීම් රුපියල් දශලක්ෂ 133 ක් විය.[1]

1970/71 මුදල් වර්ෂයේදී 'භාණ්ඩ ආධාර ක්‍රමය' යටතේ කළ ප්‍රධාන ආනයනයන් වූයේ තිරිඟු පිටි, සහල්, පොහොර, කාර්මික අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ, රෙදිපිළි, වෙළඳ වාහන සහ මෝටර් රථ අමතර කොටස්ය. එලෙස ආධාර කරන ලද ප්‍රධාන රටවල් වූයේ මහජන චීන සමූහාණ්ඩුව (රුපියල් දශලක්ෂ 43), ඇමෙරිකා එක්සත් ජනපදය (රුපියල් දශලක්ෂ 37), ජපානය (රුපියල් දශලක්ෂ 20), ප්‍රංශය (රුපියල් දශලක්ෂ 17), එක්සත් රාජධානිය (රුපියල් දශලක්ෂ 16) සහ කැනඩාව (රුපියල් දශලක්ෂ 13) ය.

1970/71 මුදල් වර්ෂය අවසානයේදි සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය පිළිබඳ නොබෙරා ඉතිරිව ඇති විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,119 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 986 ක් විය.

සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී රුපියල් දශලක්ෂ 283 ක් විදේශ ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලට[2] බැර කර ඇති අතර, මුදල් වර්ෂය අවසානයේදී අරමුදලෙහි සුළු ප්‍රමාණයක් ඉතිරි කරමින් සමාන මුදලක් රජයේ අය-වැය කටයුතු සඳහා ආපසු ගෙන ඇත. ඉකුත් මුදල් වර්ෂයේදී බැර කළ සහ ආපසු ගත් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 269 ක් සහ රුපියල් දශලක්ෂ 271 ක් විය.

යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය යටතේ ආයතනයන් සඳහා රුපියල් අරමුදල් ජනනය කිරීම පිළිබඳ දත්තයන් සහ ඒවා රජයේ අය-වැය කටයුතු සඳහා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර දෙවෙනි පරිශිෂ්ඨයේ 43 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

---

1. දෙවෙනි පරිශිෂ්ඨයේ 31 වන සංඛ්‍යා සටහනේ සහ 11 (ඊ) 9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති අනුකූල සංඛ්‍යා සමග මෙම සංඛ්‍යාව විදේශ ණය ආපසු ගෙවීමේදී ගෙවනු ලබන වි. වි. හි. ස. සැළකිල්ලට ගෙන නොමැති හෙයින් නොසැසඳේ.
2. 11 පරිශිෂ්ඨයේ 43 වන සංඛ්‍යා සටහන බලන්න.

බාහිර සැපයුම්කරුවන්ගේ ණය[1]

1971 සැප්තැම්බර් මස අවසානයේදී සැපයුම්කරුවන්ගේ ණය යටතේ රජයේ දෙපාර්තමේන්තු මගින් කරන ලද ආනයන සම්බන්ධ විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 65 ක්ව පැවතින. එම වගකීම් ප්‍රමාණය 1970 සැප්තැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 59 ක් විය. මේ අනුව 1970/71 මුදල් වර්ෂය තුළදී මේ සම්බන්ධ විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6 කින් ඉහළ ගොස් ඇත. මුදල් වර්ෂය අවසානයේදී මුළු නොබෙරූ වගකීම් ප්‍රමාණයට ලංකාණ්ඩුවේ දුම්රිය සේවයේ සහ ධීවර දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් දශලක්ෂ 43 ක් (හෝ 66% ක්) සහ රුපියල් දශලක්ෂ 15 ක්(හෝ 23%) කට අයත් විය.

නිදන් අරමුදල්

1971 සැප්තැම්බර් මස අවසානයේදී රන්පවුම් ණය නිදන් අරමුදල සහ රුපියල් ණය, නිදන් අරමුදල්වල ආසන්න වෙළඳපල වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 33 ක් හා රුපියල් දශලක්ෂ 642 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී ඒවා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 28 ක් හා රුපියල් දශලක්ෂ 609 ක් විය.

1970/71 දී රන්පවුම් නිදන් අරමුදල්වල වෙළඳපල වටිනාකම, නව දයක මුදල් ආයෝජනයන් (රුපියල් දශලක්ෂ 1), අතීත ආයෝජනයන්ගෙන් උපයාගත් පොළිය (රුපියල් දශලක්ෂ 1) සහ ආයෝජනයන්හි වෙළඳපල වටිනාකම (රුපියල් දශලක්ෂ 3 කින්) ඉහළ යාම යන කරුණු නිසා රුපියල් දශලක්ෂ 5 කින් වැඩිවිය.

රුපියල් ණය නිදන් අරමුදල්හි වෙළඳ වටිනාකම රුපියල් දශලක්ෂ 33 කින් ඉහළ ගියේය. මෙම ඉහළයාමට හේතු වූයේ, නව දයක මුදල් ආයෝජනයන් (රුපියල් දශලක්ෂ 107) සහ අතීත ආයෝජනයන් ගෙන් ඉපයූ (රුපියල් දශලක්ෂ 37) පොළියත් ය. ණය ආපසු ගෙවීම්[2] (රුපියල් දශලක්ෂ 8) හා අතීත ආයෝජනයන්හි වෙළඳ වටිනාකම ක්ෂයවීම (රුපියල් දශලක්ෂ 103) යන කරුණු නිසා මෙම වැඩිවීමෙන් කොටසක් හිලව් විය.

9. අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය

(i) ජාතික නිවාස අරමුදල

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ජාතික නිවාස ණයකර නිකුතුවක් සිදු නොවීය. කෙසේ වුවද, රුපියල් දශලක්ෂ 10 ක ජාතික නිවාස ණයකර 1970 නොවැම්බර් 16 වෙනි දින ආපසු ගෙවනු ලැබීය. 1970/71 වර්ෂය අවසානයේදී නිකුත් කරන ලද සහ නොබෙරා ඉතිරිව ඇති ජාතික නිවාස ණයකර ප්‍රමාණය රුපියල් දශලක්ෂ 106 ක් වූ අතර, ණයකර නිකුත් කිරීම සඳහා බලය ලත් සීමාව වූ රුපියල් දශලක්ෂ 220 මූල්‍ය වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිණ. ජාතික නිවාස ණයකර බෙරුම් කිරීම සඳහා ඇතිකර තිබූ නිදන් අරමුදල්වල ආසන්න වෙළඳපල වටිනාකම මෙම වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 36ක්ව පැවතිණ.

මේ අතර, සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී ජාතික නිවාස දෙපාර්තමේන්තුවට සෘජු ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 20 ක් රජය විසින් අනුමත කෙරිණ. ඒ අනුව, වර්ෂය අවසානයේදී නොබෙරා ඇති එම මුළු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 201 ක් විය.

---

1. රජයේ දෙපාර්තමේන්තු විසින් බාහිර සැපයුම් කරුවන්ගේ ණය මගින් කරන ලද ආනයනයන් රාජ්‍ය ණයෙහි කොටසක් ලෙස ඇතුළත් කර නොමැත.
2. මෙහි දක්වා ඇති ණය නම්,
   (i) 1970/71 සියයට 3 1/2 ණය (රුපියල් දශලක්ෂ 3) සහ
   (ii) 1965/70 සියයට 3, ජාතික සංවර්ධන ණය (රුපියල් දශලක්ෂ 5) යන ඒවායේ නොහැරවූ ශේෂයන්ය.

(ii) රජයේ උකස් බැංකුව

1970/71 මුදල් වර්ෂ තුළදී රජයේ උකස් බැංකුව විසින් අවුරුදු 10–12 කල්පිරෙන සියයට 9 ක පොළී අනුපාතිකයක් සහිතව රුපියල් 1,750,000 ක එක් ණයකරයක් පමණක් නිකුත් කරනු ලැබිය. මෙය නිකුතු කරන ලද්දේ කල් පිරෙන සමාන ප්‍රමාණයක ණයකරයක් ආපසු ගෙවීම සඳහාය. එමනිසා 1970 සැප්තැම්බර් අවසානය වන විට නිකුත් කොට නොගෙවා තිබූ ණයකර රුපියල් 32,250,000 ක ප්‍රමාණය 1971 සැප්තැම්බර් අවසානය වන විට ද එම මට්ටමෙහිම පැවතිණ.

මුදල් වර්ෂය තුළදී[1] අයිරාවන්ගේ ස්වරූපයෙන් බැංකු ක්‍රමයෙන් ලබාගන්නා ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 31·3 සිට රුපියල් දශලක්ෂ 31·2 දක්වා මඳ වශයෙන් අඩුවිය. මෙසේ නොබෙරා ඉතිරිව පැවති ණයකර ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 32·3 සමඟ රජයේ උකස් බැංකුවේ මුළු ණය ගැති බව රුපියල් දශලක්ෂ 63 5 ක් විය. සමාලෝචනයට භාජනය වන වර්ෂය මුළුල්ලේම නොවෙනස්ව පැවති රුපියල් දශලක්ෂ 76 ක් වූ ණය ගැනීම සීමාවෙන්, උපයෝජනය නොකළ රුපියල් දශලක්ෂ 12·5 ක ශේෂයක් මේ අනුව දක්නට ඇත.

10. 1971/72 අයවැය ලේඛනය

1971/72 මුදල් වර්ෂය සඳහා අයවැය ලේඛනය 1971 නොවැම්බර් 10 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ අතර 1971 දෙසැම්බර් 23 වෙනි දින අනුමත කරන ලදී. 1973 ජනවාරි 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ලිත් වර්ෂය මුදල් වර්ෂය ලෙස ගණන් ගැනීමට රජය ගත් තීරණය අනුව, මෙම අයවැය ලේඛනය 1971 ඔක්තෝබර් 1 වැනි දින සිට 1972 දෙසැම්බර් 31 දක්වා මාස 15 ක කාලපරිච්ඡේදයක් සඳහාවේ.

ඉකුත් මුදල් වර්ෂයේදී මෙන්ම මෙවරද, අයවැය ලේඛනය ඉදිරිපත් කරන ලද්දේ මුදල් වර්ෂය ආරම්භ වීමෙන් පසුවය. මෙම ප්‍රමාදය හේතුකොට ගෙන 1971 ඔක්තෝබර් සිට දෙසැම්බර් මස දක්වා කාලච්ඡේදය සඳහා වූ වියදම් වලට පාර්ලිමේන්තුව විසින් ගිණුම් සම්මතයක් මගින් අවසර දෙන ලදී.

නව ආදයම් මාර්ගයන්ගෙන් සහ පරිභෝජන වියදම් අඩු කිරීමෙන් දේශීය සම්පත් උපයෝගී කර ගැනීම සඳහා යෝජනා කිහිපයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ අයවැය ලේඛනයට ඇතුළත් විය අයවැය බර සැහැල්ලු කරනු සඳහා ආහාර සහනාධාර වියදම අඩු කිරීමට ඉන් අදහස් කෙරිණ. මෙම යෝජනාවන්ගෙන් දෙකක්, පසුවදා තරමක් දුරට වෙනස් හෝ ඉවත් කරන ලද්දේ විය.

වෙනස්කම් කිරීමට පෙර හා පසුව, අයවැය ලේඛනයේ වැදගත් ලක්ෂණයන්ගේ සම්පිණ්ඩනයක් II (ඊ) 21 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ.

අයවැය කථාවට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් ඇස්තමේන්තු වෙහි අන්තර්ගත ආදයම් හා වියදම් සංඛ්‍යා, ඉහත සටහනේ 2 වැනි තීරුවෙහි 'පූර්ව අයවැය ඇස්තමේන්තු' යටතේ සම්පිණ්ඩනය කොට දක්වේ. පවතින බදු අනුපාතිකයන් යටතේ ලබාගත හැකි මුළු ආදයම් හා අනෙකුත් ලැබීම් ඉන් දක්වෙන අතර වියදම් පිළිබඳ සංඛ්‍යා වල මුළුමණින්ම පාහේ පිළිබිඹු වන්නේ නව මුදල් වර්ෂයේ අළුත් ප්‍රාග්ධන යෝජනා ක්‍රම ඇතුළත් රජයේ වියදම් වැඩපිළිවෙලය. අයවැය කථාවෙන් බලාපොරොත්තු වූ පරිදි, අපේක්ෂිත මුළු ආදයම, වියදම සහ අයවැය හිඟය පියවන ආකාරය වූ 3 වැනි තීරුවෙහි "අයවැය ඇස්තමේන්තු" යටතේ දැක්වේ. මෙම ආදයම් ඇස්තමේන්තු වලට නව යෝජනාවලින් මෙන්ම පවත්නා ක්‍රියා මාර්ගයන්ගෙන් අපේක්ෂිත ලැබීම්ද ඇතුළත් වනබව සැලකිය යුත්තකි. සලාක ක්‍රමය යටතේ දෙවැනි හාල් සේරුවේ මිල ශත 25 කින් වැඩි කිරීමේ ප්‍රතිඵල ලෙස අපේක්ෂා කරන වියදමේ පහළ වැටීමට ඉඩ තැබීම හේතුකොට ගෙන, මෙම වියදම් පිළිබඳ සංඛ්‍යා පූර්ව අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශ ලක්ෂ 100 ක අඩුවීමක් පෙන්වයි.

---

1 රුපියල් දශලක්ෂ 42.5 ක් වන අයිරාවන් ප්‍රමාණයක් රාජ්‍ය උකස් බැංකු ආඥාපණතේ 73 වගන්තිය යටතේ සහතික කරන ලදී.

II (ඒ) 21 වැනි සංඛ්‍යා සටහන

1971/72[1] මූලික අය - වැය ඇස්තමේන්තු

රුපියල් දශ ලක්ෂ

ශීර්ෂයන් (1)	අයවැය කථාවට පෙර ඇස්තමේන්තු (2)	අයවැය ඇස්තමේන්තු (3)	මුල් ඇස්තමේන්තු (4)
1. ප්‍රකෘතිවර්ධන වියදම් (1, 2, 4 සහ 6 වැය සමමත) ..	4,173	4,073[2]	4,173
3% ඌනෙ – වියදම් හැර ..	125	125	125
	4,048	3,948	4,048
2. ප්‍රාග්ධන වියදම් (3, 5 සහ 7 වැය සමමත) ..	1,866	1,866	1,866
20% ඌනෙ – වියදම් හැර[3] ..	296	296	296
	1,570	1,570	1,570
3. අත්තිකාරම් ගිණුම් ..		125	125
4. මුළු වියදම ..	5,618	5,643	5,743
5. මුළු ආදයම ..	3,819	4,130	3,945
6. අය වැය හිඟය ..	1,799	1,513	1,798
නිදන් අරමුදල් යනාදියට දායක දීමනා හැර ..	384	384	384
7. ශුද්ධ මූල්‍ය හිඟය ..	1,415	1,129	1,414
8. අය වැය හිඟය පියවීම			
8·1 බැංකු නොවන මූලයන් ගෙන් වෙළඳ පොලේ ණය ලබා ගැනීම ..		640[4]	640[4]
8·2 බාහිර මූල්‍ය			
8·2·1 යෝජනා ක්‍රම ණය සහ දීමනා ..		162	162
8·2·2 යෝජනා ක්‍රම නොවන (හාණ්ඩ) ණය ..		500	500
8·2·3 මුදල් ණය ..		50	50
8·3 නොපියවූ පරතරය ..		161	446
9. ශුද්ධ මූල්‍ය හිඟය පියවීම			
9·1 බැංකු නොවන මූලයන් ගෙන් දේශීය වෙළඳ පොලෙන් ණය ලබා ගැනීම ..		474	474
9·2 බාහිර මූල්‍ය			
9·2·1 යෝජනා ක්‍රම ණය සහ දීමනා ..		53	53
9·2·2 යෝජනා ක්‍රම නොවන (හාණ්ඩ) ණය ..		391	391
9·2·3 මුදල් ණය ..		50	50
9·3 නොපියවූ පරතරය ..		161	445

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1. 1971 ඔක්තෝබර් 1 වැනිද සිට 1972 දෙසැම්බර් 31 වැනිද දක්වා කාලච්ඡේදය සඳහා.
2. සහල් සලකයේ දෙවැනි සේරුවේ මිල වෙනස් වීමෙන් වියදමෙහි ඇතිවූ රුපියල් දශලක්ෂ 100 ක සහිත බැසීම මිධ අඩංගු නොවේ.
3. ප්‍රාග්ධන වියදම් 3 ත ඌණ වියදම ගණනය කොට ඇත්තේ නිදන් අරමුදල් සඳහා දායකයන් සහ රාජ්‍ය ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් අඩු කොටය.
4. රුපියල් දශ ලක්ෂ 40 ක් වූ අනිවාර්ය ඉතිරිකිරීම්ද අඩංගුය.

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ආදයම, වියදම සහ හිඟය පියැවීමේ යෝජනා 4 වැනි තීරුවේ "මූලික ඇස්තමේන්තු" වලින් දැක්වේ. වෙනස් කරන ලද මෙන්ම වෙනස් නොකරන ලද ආදයම් යෝජනා සියල්ලේම බලපෑම එහි අඩංගුය. නව ආදයම් යෝජනා අතුරින් එක් යෝජනාවක් ඉවත් කර ගන්නාලද අතර තවෙකක් සුළු වශයෙන් වෙනස් කරන ලදී. තිරිඟු පිටි රාත්තලක මිළ ශත 15 කින් වැඩි කිරීමේ යෝජනාව ඉවත් කෙරිණ. එක් අයෙකුට සතියකට, රාත්තල ශත 72 මිළට සීනි රාත්තල් ½ ක් නිකුත් කිරීමත්, සලාකයට අමතර සීනි රාත්තලක මිළ රුපියල් 1. 50 කිරීමත්, වශයෙන් සීනි සඳහා ද්වි මිළ ක්‍රමය හඳුන්වා දීමට කළ යෝජනාව, සතියකට සීනි රාත්තල් ¾ දක්වා සලාකය වැඩි කිරීම සඳහා සංශෝධනය කරන ලදී. සලාකය යටතේ දෙවැනි සහල් සේරුවේ මිළ වැඩි කිරීමෙන් උද්ගතවූ වියදම් අංශයෙහි අපේක්ෂිත වියදමේ රුපියල් දශලක්ෂ 100 ක අඩුවීම, පාර්මේන්තුව විසින් අනුමත කළ අවසාන ඇස්තමේන්තු වල පිළිබිඹු නොවේ.[1] අයවැය යෝජනා වල මෙම වෙනස්වීම් වල ප්‍රතිඵලය වූයේ අයවැය හිඟයේ නොපියවූ පරතරය රුපියල් දශලක්ෂ 446 දක්වා ("අයවැය ඇස්තමේන්තු" අනුව බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ලද ණය මගින් පියැවීමට බලාපොරොත්තු වන රුපියල් දශලක්ෂ 161 ක්ද ඇතුළත්ව) වැඩිවීමයි.

නව යෝජනාද ඇතුළත්ව 1971/72 වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තු වලට අනුව අපේක්ෂා කෙරෙන ආදයම රුපියල් දශලක්ෂ 3945 කි. අනුපාත පදනමක් මත සැකසූ විට 12 මසකට ආදයම රුපියල් දශලක්ෂ 3156 කි. මෙය මූලික අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 278 ක වැඩිවීමක් පෙන්වන අතර ඉකුත් මුදල් වර්ෂයේ නියම ආදයමට වඩා රුපියල් දශලක්ෂ 341 ක වැඩිවීමක් පෙන්වයි. අනෙක් අතට, අපේක්ෂිත ඌන වියදමට ගලපා ගත් පසු මුළු වියදම රුපියල් දශලක්ෂ 5743 ක් වේ. මේ අනුව අනුපාතික පදනමක් යටතේ මාස 12 ක මුළු වියදම රුපියල් දශලක්ෂ 4594 කි. එය මූලික අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 536 ක වැඩිවීමක්ද, ඉකුත් මුදල් වර්ෂයේ නියම වියදමට වඩා රුපියල් දශලක්ෂ 695 ක වැඩිවීමක්ද පෙන්නුම් කෙරේ.

1971/72 සඳහා අයවැය හිඟය රුපියල් දශලක්ෂ 1798 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත. අනුපාත පදනමක් මත මාස 12 ක කාලපරිච්ඡේදයක් සඳහා ගණනය කළ විට මේ හිඟය රුපියල් දශලක්ෂ 1438 ක් වනු ඇත. එය ඉකුත් මුදල් වර්ෂයේ මුල් ඇස්තමේන්තුවේ තිබූ හිඟයට වඩා රුපියල් දශලක්ෂ 258 ක වැඩිවීමක් පෙන්වන මුත්, 1970/71 වර්ෂයේ නියම හිඟය හා සසඳන කල රුපියල් දශලක්ෂ 111 ක අඩුවීමක් පෙන්වයි.

1971/72 සඳහා රුපියල් දශලක්ෂ 1798 ක අයවැය හිඟය, රුපියල් දශලක්ෂ 640 ක බැංකු නොවන දේශීය වෙළඳපොලේ ණය ගැනීම් වලින්ද, රුපියල් දශලක්ෂ 712 ක විදේශීය ණයකින්ද (යෝජනා ක්‍රම ණය, දීමනා, සහ යෝජනා ක්‍රම නොවන ණය) පියැවීමට අදහස් කරන අතර නොපියවන ලද පරතරය රුපියල් දශලක්ෂ 446 ක් වනු ඇත. මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, මෙම හිඟයේ "අයවැය ඇස්තමේන්තු" අනුව රුපියල් දශලක්ෂ 1513 ක හිඟයක් වූ අතර එය ඉහත සඳහන් වූ ප්‍රමාණයකට බැංකු නොවන දේශීය වෙළඳ පොලේ ණය හා විදේශීය ණය මගින්ද පියවා ගැන්මටද ඉතිරි රුපියල් දශලක්ෂ 161 ක නොපියවන ලද පරතරය බැංකු ක්‍රමය වෙත නිකුත් කෙරෙන භාණ්ඩාගාර බිල් පත් මගින් පියැවීමට බලාපොරොත්තු විය. 12 මසකට අනුපාතික පදනමක් මත සැකසූ විට රුපියල් දශලක්ෂ 512 ක් වන බැංකු නොවන දේශීය වෙළඳ පොලේ මුළු ණය ගැනීම්හි (අනිවාර්‍ය ඉතිරි කිරීම් ඇතුළුව) ඇස්තමේන්තුව, මෙම මූල්‍ය මාර්ගයේ උපයෝජනයේ, මෙතෙක් ඕනෑම වර්ෂයක් සඳහා කළ ඇස්තමේන්තුවනට වඩා ඉහළම ප්‍රමාණය වෙයි.[2]

---

1. ආහාර කොමසාරිස් වරයාගේ සංශෝධිත ඇස්තමේන්තු අනුව වියදමෙහි දැන් බලාපොරොත්තු වන නියම අඩුවීම රුපියල් දශලක්ෂ 40 කි. "ශුද්ධ ආහාර සහනාධාර" පිළිබඳ 4 වන කොටස බලන්න.
2. බැංකු නොවන දේශීය වෙළඳපොලේ ණයගැනීම වලින් 1970/71 තුළදී රුපියල් දශලක්ෂ 445 ක් බලාපොරොත්තු වූ නමුත් ඇත්ත වශයෙන්ම එමගින් රුපියල් දශලක්ෂ 595 ක් ලබා ගැනීමට හැකි විය.

රජයේ ඇස්තමේන්තු ඉදිරිපත් කරන ආකරයේ සැලකිය යුතු වෙනස්කම් කීපයක් 1971/72 අයවැය ලේඛනය මගින් ඉදිරිපත් කෙරිණ.

පළමුවන වරට, එක්සත් ජාතීන් විසින් නිර්දේශ කරන ලද ප්‍රමිත වර්ගීකරණය ප්‍රයෝජනයට ගනිමින් ආර්ථික හා කාර්යමය පදනමක් මත ආදයම් ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලදී. මෙම ආදයම් ඇස්තමේන්තු ඉදිරිපත් කරනුයේ රජයේ ණය ගනුදෙනු වල ලැබීම් ඇතුළුව ඒකාබද්ධ අරමුදලේ මුළු ලැබීම්හි ප්‍රකාශනයක ස්වරූපයෙනි. එහෙයින් මෙය, ඉකුත් ආදයම් ප්‍රකාශන වලට වඩා විස්තරාත්මකවේ. ලැබීම් ප්‍රකාශනයේදී උපයෝගී කර ගත් වර්ගීකරණය, ආර්ථික ක්‍රම සම්පාදනයේ පදනම සපයන ජාතික ගිනුම් ක්‍රමයට සංඛ්‍යානමය සම්බන්ධයක් දක්වයි.

අධ්‍යාපන, මුදල් හා සෞඛ්‍යය යන අමාත්‍යාංශ තුන යටතේ ඇති දෙපාර්තමේන්තු 17 හි වියදම් ඇස්තමේන්තු ප්‍රථම වරට ''වැඩ සටහන් පදනම'' යටතේ සකස් කොට ඇත. පැහැදිළිව හඳුනාගත හැකි වැඩ සටහන් සහ ක්‍රියාකාරිත්වයන් අනුව පිළියෙල කරනු ලැබූ අයවැයක් වැඩ සටහන් අයවැය මගින් නිරූපනය වන අතර එය අයවැය සැලසුම පසුබිම් කොට ගෙන අයවැය හැඩගැස්ම අගැයීමට පදනමක් සපයනු ඇත. පරිපාලන උපකරණයක් ලෙස අයවැයෙහි මූලික කාර්යය මෙම නව ක්‍රමය මගින් අවධාරණය කරන්නේ මූල්‍ය ගණකාධිකරණමය වැදගත්කම කිසිසේත් අඩු නොකරමිනි. රජයේ වියදම් නිසි ලෙස යොමු කරවීමට සහ පාලනය කිරීමටද මින් ඉඩ සැලසේ. සෙසු අමාත්‍යාංශයන්ගේ ඇස්තමේන්තුද වැඩ සටහන් පදනමට නුදුරු වර්ෂවලදී අනුක්‍රමයෙන් පරිවර්තනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද ඇස්තමේන්තුවල අඩංගු ''අත්තිකාරම් ගිණුම් කටයුතු''[1] පිළිබඳ ශුද්ධ ගෙවීමක් සඳහා වෙන් කිරීමක් ප්‍රථම වරට ඇතුළත්වීම 1971/72 අයවැයෙහි තවත් විශේෂ ලක්ෂණයකි. මෙම කටයුතුවලින් අයවැයට ඇතිවන බලපෑම තුලනාත්මක බැව් මෙතෙක් සැලකුණ නමුත් ඇත්ත වශයෙන්ම මෑත බොහෝ වර්ෂවලදී මෙම ගිණුම්වලින් පිටතට කරන ගෙවීම් සැලකිය යුතු ලෙස තිබුණි. අත්තිකාරම් ගිණුම පිළිබඳ ශුද්ධ ගෙවීම 1969/70 දී රුපියල් දශලක්ෂ 201 ක වාර්තාගත මට්ටමක පැවති බව මෙහිදී නැවත දැක්විය හැක. අත්තිකාරම් ගිණුම්වල ශුද්ධ තත්ත්වය සඳහා මෙතෙක් අයවැයෙහි වෙන් නොකිරීමට හේතු වූයේ, මේවායේ ලැබීම් හා ගෙවීම් මුළුමනින්ම හෝ කොටසක් රජයේ ස්වයං-මූල්‍ය සම්පාදන කටයුතු වූ නිසා කල්වේලා ඇතිව එය පහසුවෙන් ගණනය කළ නොහැකි වීමයි. කෙසේ වුවද, රජයේ ගෙවීම් මෑත වර්ෂවලදී ලැබීම් ඉක්මවා යෑම හා මූලික ඇස්තමේන්තුවල ශුද්ධ තත්ත්වය සම්බන්ධයෙන් අමතර වෙන්කිරීමක් නොකිරීම නිසා භාණ්ඩාගාරයේ මූල්‍ය සම්පත් කෙරෙහි දැඩි ඉල්ලුම් පීඩනයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුදල් වර්ෂය ආරම්භයේදී අපේක්ෂිත හිඟයන් හා සසඳන විට නියම අයවැය හිඟයන් ඉතා විශාල විය. එහෙයින්, 1971/72 සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් කර ඇති රුපියල් දශලක්ෂ 125 ක් වෙන් කිරීම ඉහත දැක්වූ වගකීම්වලින් අයවැයට ඇතිවන බලපෑම අවම කරනු පිණිස එම වගකීම පිළිබඳ පූර්කථනයක් කිරීමට ගෙන ඇති ප්‍රයත්නයක් නිරූපනය කරයි.

---

1. 151 පිටුවෙහි පා සටහන බලන්න.

අයවැය කථාවෙහි අඩංගු නව ආදායම් හා වියදම් යෝජනා

1971/72 සඳහා වූ පූර්ව අය වැය ඇස්තමේන්තු මගින් පවත්නා බදු අනුපාතිකයන් යටතේ ආදයමෙහි ඊට පෙර වර්ෂයට වඩා ඇතිවන වැඩිවීම් කිහිපයක් සැළකිල්ලට යොමු කෙරේ[1] එම වැඩිවීම් හැර, අළුත් ආදයම් හා වියදම් යෝජනා කිහිපයක් අයවැය කථාවෙන් ප්‍රකාශයට පත් කෙරිණ. කෙසේ වුවද මෙම යෝජනාවන්ගෙන් වැඩි කොටසක් ක්‍රියාත්මක වන්නේ 1971/72 අය-වැයට හසුවන කාලච්ඡේදය වන මාස 15 කට වඩා අඩු කාලයකටය. මෙම ආදයම් හා වියදම් යෝජනා මගින් ආදයමෙහි රුපියල් දශලක්ෂ 312 ක වැඩිවීමක් හා වියදමෙහි රුපියල් දශලක්ෂ 100 ක අඩුවීමක් අපේක්ෂා කෙරිණ මෙම ආදයම් හා වියදම් යෝජනාවල බලපෑම පහත II (ඉ) 22 වැනි සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට ඇත.

II (ඊ) 22 සංඛ්‍යා සටහන
නව ආදයම් සහ වියදම් යෝජනා

රුපියල් දශ ලක්ෂ

II (ඊ)4 සංඛ්‍යා සටහනේ ශීර්ෂ අනුව	ශීර්ෂයන්	වැඩිවීම (+) හෝ අඩුවීම (−) ආදයම	වියදම
1·2·1	පිරිවැටුම් බදු වල අනුපාතිකයන් ගේ වෙනස්වීම් සහ එම බදු වලට යටත්වන කෝන්ද්‍රය පුළුල් වීම ..	+ 15	—
1·1·1 සහ 1·2·1	උකස් ව්‍යාපාරිකයන්ගෙන් අය කෙරෙන ආදයම් හා පිරිවැටුම් බදු පිළිබඳ අමතර එකතු කිරීම	+ 10	—
1·2·6	ගස් බදු ක්‍රමය දශෝසි කිරීම	+ 10	—
1·4·3	ත.පැල් ගාස්තු පිළිබඳ සංශෝධනය	+ 10	—
1·5·2	ආරෝග්‍යශාලා ගාස්තු	+ 10	—
1·2·6	උගස් ව්‍යාපාරිකයන්ගෙන් අයකෙරෙන බලපත්‍ර ගාස්තු පිළිබඳ අමතර එකතු කිරීම	+ 1	—
1·2·9	පිටි මිල වෙනස් වීම	+ 125	—
1·2·9	සීනි මිළ වෙනස් වීම	+ 131	—
—	සහල් සලාකයේ දෙවැනි සේරුවේ මිල වෙනස් වීම ..	—	− 100
	මුළු එකතුවේ වෙනස් වීම	+ 312	− 100

(i) නව ආදයම් යෝජනා:

(i) ව්‍යාපාර පිරිවැටුම් බද්ද

ව්‍යාපාර පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් යෝජනා කරනු ලැබීය.[2]

(අ) කරවල විකිණීම නිෂ්පාදන මට්ටමේදී ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීමට; (පවතින අනුපාතිකය සියයට 1)

(ආ) තොග සහ සිල්ලර වෙළඳ මට්ටම්වලදී[3] කටුකම්බි නිෂ්පාදනය ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීමට; (පවතින අනුපාතිකය සියයට 1)

(ඇ) වෙන්දේසි, කොමිස් ඒජන්ත සහ බ්‍රෝකර්, මූල්‍ය ආයතන, මුදල් ණයට දීම සහ උකස් ව්‍යාපාරය සහ ඒවායේ පිරිවැටුම මත සියයට 5 ක බදු අනුපාතිකයක් පැනවීමට.

(ඈ) පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහා සියයට 1 ක බද්දක් පැනවීමට.

මීට අතිරේකව, ව්‍යාපාර පිරිවැටුම් බද්දට අදාළවන නීතිය සම්බන්ධයෙන් සංශෝධන කීපයක් කිරීමටද යෝජනා කරන ලදී.

1. 1971 ඔක්තෝබර් 27 වෙනිද සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දුන් පහත සඳහන් ආදයම විධි විධානද මෙවාට අඩංගු විය.
   (1) සුපිරි හා සාමාන්‍ය පෙට්‍රල් නිෂ්පාදනය පිළිබඳ පිරිවැටුම් බද්ද සියයට 37 සිට සියයට 48.0 දක්වා වැඩි කිරීම.
   (2) ලුවිකොළ පිළිබඳ දේශීය භාණ්ඩ බද්ද රාත්තලකට රු. 5 කින් වැඩි කිරීමෙන් රාත්තලකට රු. 42.50 සිට රු: 47.50 දක්වා ඉහළ නැංවීම.
   විශේෂ ගෙවීමක් වශයෙන් රාජ්‍ය සමායතන වලින් 1971—72 තුළදී අපේක්ෂිත රුපියල් දශලක්ෂ සියයක දායකත්වයක්ද පූර්ව අය-වැය ඇස්තමේන්තුවලට ඇතුළත් විය.
2. ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය අංක: 14983/9—1971 නොවැම්බර් 10 දින.
3. ඒ සමගම කටුකම්බි ආයාත කිරීම සම්පූර්ණ විවිහිස පිරිවැයට යටත් කෙරිණ.

(අ) 1971 ඔක්තෝබර් මස 1 වෙනිද සිට ක්‍රියාත්මක වන පරිදි සම වර්ෂ පද නමක් අනුව පිරිවැටුම් බද්ද එකතු කිරීමට යෝජනා කරන ලදී. පවතින නීතිය අනුව තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාර පිරිවැටුම් බද්ද පිළිබඳ වග කීම රඳා පවතින්නේ පූර්ව ගිණුම් වර්ෂය සඳහා ඔහුගේ පිරිවැටුම රුපියල් 75, 000 ට අඩුද වැඩිද යන්න මතය. මෙම තක්සේරු කිරීමේ පූර්ව ගිණුම් වර්ෂ පදනම සංකීර්ණ සහ බදු පැහැර හැරීමට අවස්ථාව පාද දෙනු ලබන බවද පැහැදිලිවී තිබුණි. මින්පසු බදු එකතු කිරීමේ පදනම, පූර්ව වර්ෂයේ පිරිවැටුම නොව, තක්සේරු වර්ෂයේම පිරිවැටුම වනු ඇත.

(ආ) වර්ෂයේ ඕනෑම කාර්තුවක රුපියල් 18, 750 ට වැඩි මුළු පිරිවැටුමක් ඇති ඕනෑම පුද්ගලයකුගේ මුළු පිරිවැටුමෙන් බදු අයකළ හැකි කොටසට ඔහු බද්දට යටත්වේ. තවද වර්ෂයේ ඕනෑම කාර්තුවක් සඳහා රුපියල් 18, 750 ට වැඩි පිරිවැටුමක් ඇති සෑම පුද්ගලයෙකුටම, ඔහු බද්දට යටත් වුවද නොවුවද විස්තර ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීමට යෝජනා කරනු ලැබීය. පවතින නීතිය අනුව පුද්ගලයකු බද්දට යටත් වන්නේ තක්සේරු වර්ෂය සඳහා වන බදු අය කළ හැකි පිරිවැටුම් රුපියල් 75,000 ඉක්මවයි නම් පමණක් වන අතර විස්තර ප්‍රකාශයන් සැපයිය යුතු වන්නේ පිරි වැටුම් බද්දට යටත් වන පුද්ගලයන් විසින් පමණකි. නව විධිවිධානය බදු මඟ හැරීමේ අවස්ථා අවම කරනු ලබන අතරම, අතිරේක ආදයමක්ද ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. කෙසේ වෙතත් තක්සේරු වර්ෂයේ කාර්තු හතර සඳහාම වූ මුළු පිරිවැටුම රුපියල් 75,000 ට අඩුවන අවස්ථාවලදී ගෙවනු ලැබූ වැඩිපුර බදු ප්‍රමාණය නැවත ලබා ගැනීමට විධිවිධාන යොදනු ලබනු ඇත.

(ඇ) 1963 මූල්‍ය පණතේ නිර්වචනය කර ඇති "පිරිවැටුම" යන්න වෙන්දේසි කරුවන්ගේ, කොමිස් ඒජන්තවරුන්ගේ සහ බ්‍රෝකර්වරුන්ගේ ලැබීම් මෙන්ම, මූල්‍ය ආයතන විසින් දෙනු ලැබූ දළ ණය, පොලී සහ ඒවා විසින් අය කරන අනෙකුත් ගාස්තුද ඇතුළත් වනසේ, නැවත නිර්වචනය කිරීමට යෝජනා කරනු ලැබීය. පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පිරිවැටුමද මෙයට ඇතුළත් කෙරෙනු ඇත. ව්‍යාපාර පිරිවැටුම් බද්ද සම්බන්ධ මෙම යෝජනා-වන් (උකස් ව්‍යාපාරය සඳහා වූ පිරිවැටුම් බද්ද හැර) රුපියල් දශලක්ෂ 15 ක අතිරේක ආදයමක් ලබාදෙනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

(2) උකස් ව්‍යාපාරිකයන්ගේ ආදයම සහ පිරිවැටුම් බදු පිළිබඳ අතිරේක එකතුකිරීම

මෙරට ව්‍යාපාරික කටයුතු කෙරෙන උකස් ව්‍යාපාරිකයන්ගෙන් විශාල කොටසක් නිවැරදි බදු ප්‍රමාණයන් නොගෙවනු ලබන බව පෙනී ගියේය. ඔවුන් විසින් මාසිකව අය කරනු ලබන සියයට 2 සිට සියයට 3 දක්වා වූ පොළී අනුපාතිකයන් දේශීය ආදයම් දෙපාර්තමේන්තුවට නියම වශයෙන් හෙළිකරනු ලැබුවේ ඉතා සුළු සංඛ්‍යාවකි. මෙම විධිවිධානයේ පවතින යථා තත්ත්වයන් ගැලපෙන අතර දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ බදු ලැබීම් වැඩිකර ගැනීමේ ප්‍රයත්නයට එය ආධාරකාරී වනු ඇත. උකස් ව්‍යාපාරය ව්‍යාපාර පිරිවැටුම් බද්ද යටතට ගෙනඒමේ යෝජනාවෙන් රුපියල් දශලක්ෂ 10 ක අතිරේක ආදයමක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(3) ගස් බදු ක්‍රමය අවලංගු කිරීම

මෙම ක්‍රමයේ පැවති දුර්වලතාවන් හා දූෂණයන් නිසා අවුරුදු 35 ක් පමණ තිස්සේ යාපන අර්ධද්වීපයේ පැවති ගස් බදු ක්‍රමය අවලංගු කරනු ලැබීය. ලැබීම් එකතු කරනු ලැබූ අතරමැදියන්, මෙම ක්‍රමය ගස් මදින්නන් සූරා කෑමට ප්‍රයෝජනයට ගෙන තිබේ. නීති විරෝධී සංක්‍රමිකයන්ට රැකියා සැපයීමටද ගස්බදු ක්‍රමය මග හෙළි කරනු ලැබ තිබෙන බව පෙනේ. මෙම ක්‍රමය හා සම්බන්ධ පරිපාලන වියදම් හා සාපේක්ෂව බැලීමේදීද, මෙය ආදයම් මූලාශ්‍රයක් ලෙස නොවැදගත් එකක් විය.

පවතින ගස් බදු ක්‍රමය වෙනුවට, 1972 මාර්තු මස[1] සිට නැබැරුම් ක්‍රමය යාපන අර්ධද්වීපයේ නැවත ඇති කරනු ලබන බව ප්‍රකාශ කෙරිණ. සමුපකාර සමිති පිහිටුවා ගැනීමට ගස් මදින්නන් ධෛර්යමත් කොට එමගින් රා සැපයීම පිළිබඳව වෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ සලසනු ඇත. මේ මගින් රුපියල් දශලක්ෂ 10 ක අතිරේක ආදය මක් අපේක්ෂා කරනු ලැබේ.

(4) තැපැල් ගාස්තු සංශෝධනය කිරීම

තැපැල් සහ විදුලි සංදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තැපැල් සේවා කටයුතුවල ආදයම සහ ක්‍රියාකාරි වියදම් අතර පවතින හිඟය අඩුකිරීම උදෙසා තැපැල් ගාස්තු පිළිබඳව පහත සඳහන් සංශෝධනයන් කරනු ලැබීය.

(අ) සාමාන්‍ය ලිපි සඳහා වූ ගාස්තු සත 10 සිට 15 ට ඉහළ නැංවීමට.

(ආ) තැපැල් පත් සඳහා වූ ගාස්තු සත 5 සිට 10 ට ඉහළ නැංවීමට.

(ඇ) මුද්‍රිත ලිපි ද්‍රව්‍ය පිළිබඳව පළමු අවුන්සය සඳහා වූ ගාස්තු සත 10 සිට සත 15 දක්වාද, ඊට වැඩි සෑම අවුන්සයක් සඳහාම වූ ගාස්තු සත 4 සිට සත 5 දක්වාද ඉහළ නැංවීමට.

තැපැල් සේවා ආදයමින් ආසන්න වශයෙන් හතරෙන් තුනක් පමණම ලැබෙනුයේ සත 10 යේ ලිපි සහ සත 5 තැපැල් පත්වලිනි.

මෙම යෝජනාව නිසා රුපියල් දශලක්ෂ 10 ක අතිරේක ආදයමක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(5) රෝහල් ගාස්තු

රජයේ රෝහල්වල බාහිර රෝගීන්ගේ අංශයන්ගෙන් ප්‍රතිකාර ගන්නා අය සඳහා එසේ ප්‍රතිකාර ගනු ලබන එක් වරකට සත 25 ක නාමික ගාස්තුවක් පනවන ලදී. බාහිර රෝගීන්ගේ අංශවල පවතින නාස්තිකාරිත්වය හා තදබදය අඩු කිරීමට මෙය හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බාහිර රෝගීන්ගේ අංශයන්හිදී රෝගීන්ට සත 25 මුද්දර අලෙවි කිරීම මගින් මේ ගාස්තුව එකතු කර ගනු ඇත. කොළඹ මහ රෝහලේ වෙළඳ වාට්ටුවේ සහ සියලු රෝහල් වල පළමුවෙනි පංතියේ වාට්ටුවල දෛනික කාමර ගාස්තු රුපියල් 10 කින් ඉහළ නංවනු ලැබූ අතර, දෙවෙනි පංතියේ වාට්ටු සඳහා වූ ගාස්තු දිනකට රුපියල් 5 කින් වැඩි කරනු ලැබීය. වෛද්‍ය ප්‍රතිකාර අපේක්ෂා කරන වතු කම්කරුවන් සඳහා සේවායන්ගෙන් අයකළ ගාස්තු දිනකට රුපියල් 2·50 කින් ඉහළ නැංවීය.

මේ මගින් රුපියල් දශලක්ෂ 10 කින් ආදයම ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලැබේ.

(6) බඩු උකස් ගන්නන්ගේ බලපත්‍ර ගාස්තුවලින් එකතුවන අතිරේක ලැබීම්

බඩු උකස් ගන්නන්ගෙන් වාර්ෂිකව අය කරනු ලබන බලපත්‍ර ගාස්තුව රුපියල් 1000 දක්වා වැඩි කරන ලදී. මෙමගින් අපේක්ෂිත අතිරේක ආදයම රුපියල් දශලක්ෂ 1 කට ඇස්තමේන්තු කර ඇත.

(7) පිටි මිල වෙනස් කිරීම[2]

පිටි මිල රාත්තලකට ශත 15 බැගින් රාත්තල ශත 48 දක්වා වැඩි කරන ලදී. මෙම විධිවිධානය නිසා දේශීය පිටි පරිභෝජනය අඩුවීම මගින් පිටි වෙනුවෙන් ඉහළ යන විදේශ විනිමය පිරිවැය අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරිණ. පිටි මිළ වැඩි කිරීම නිසා රුපියල් දශ-ලක්ෂ 125 ක අතිරේක ආදයමක් බලාපොරොත්තු වන ලදි.

---

1. මෙය පසුව 1972 මැයි 1 වෙනිද සිට ක්‍රියාත්මක වන ලෙසින් සංශෝධනය කරන ලදී.
2. මෙම යෝජනාව 1971 නොවැම්බර් මස 13 වෙනි දින ඉවත් කර ගන්නා ලදී. 1971 නොවැම්බර් 13 දින අංක 14984/4 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

(8) සීනි මිල වෙනස් කිරීම

සීනි සඳහා ද්වි-මිල ක්‍රමයක් හඳුන්වාදී තිබේ. මෙම ක්‍රමය යටතේ සෑම පුද්ගලයකුටම රාත්තලක් ශත 72 ක් වන පාලන මිලට සතියකට සීනි රාත්තල් ½ ක් ලබා ගත හැක.[1] සලාක-යට වඩා සීනි අවශ්‍ය නම් රාත්තලක් රුපියල් 1·50 ගණනේ අවශ්‍ය තරම් මිලදී ගැනීමට ඉඩ සලසා ඇත. මෙමගින් රුපියල් දශලක්ෂ 55 කින් විදේශ විනිමය ඉතිරිවේ යයිද, රුපියල් දශලක්ෂ 131 ක අතිරේක ආදයමක්[2] ලැබේ යයිද අපේක්ෂා කෙරේ.

(ii) නව වියදම් යෝජනාවන්

දෙවැනි සහල් සේරුවේ මිල වැඩි කිරීම

සහල් සලාක ක්‍රමය යටතේ දෙනු ලබන දෙවැනි සහල් සේරුවේ මිල සත 75 සිට රුපියල දක්වා වැඩි කරනු ලැබීය. පරිභෝජකයාට දෙනු ලබන සහල් සහනාධාරය පිළිබඳව රජයට දැරිය යුතු බර පසුගිය කාලය තුළදී සැළකිය යුතු වේගයකින් වැඩිවීම මෙම පියවර ගැනීමට හේතු විය.

මෙම යෝජනාවේ ප්‍රතිඵලයක් වශයෙන් වියදමේ සිදුවන අපේක්ෂිත පහළ යාම රුපියල් දශලක්ෂ 100 කි.[3]

(iii) අයවැය කථාවේදී ප්‍රකාශිත අනෙකුත් යෝජනා:

(1) අනිවාර්‍ය ඉතිරි කිරීමේ පනතට සංශෝධනයන්

පහත සඳහන් වෙනස් කිරීම් අනිවාර්‍ය ඉතිරි කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් සිදු කෙරේ.

(අ) අනිවාර්‍ය ඉතිරි කිරීමේ ක්‍රමය, යටත් පිරිසෙයින් තව අවුරුදු දෙකකට දීර්ඝ කිරීම.

(ආ) අනිවාර්‍ය ඉතිරි කිරීමේ ක්‍රමය සඳහා ව්‍යවස්ථාපිත වර්ෂය මෙතැන් සිට අප්‍රේල් 1 දින ආරම්භවී ඊළඟ වසරේ මාර්තු 31 දිනෙන් අවසන් වන මාස 12 සඳහාවූ ආදයම් බදු තක්සේරු වර්ෂය වේ.

(ඇ) පුද්ගලයකු ලබන මුළු ආදයමම ආදයම් බද්දට අසුවන අවස්ථාවලදී ඔහු අනිවාර්‍ය ඉතිරි කිරීම් ලෙස ගෙවිය යුතු වන්නේ ආදයම් බද්දෙන් සියයට 40 කි. ආදයම් බද්දෙන් නිදහස් වන ආදයම් ලබන අයවලුන් අනිවාර්‍ය ඉතිරි කිරීම් වශයෙන් දයකවීමට අවශ්‍ය වනුයේ ඒ සහනය නොතිබුණා නම් ගෙවිය යුතුව තිබෙන බද්ද සහ එම බද්දෙන් තවත් සියයට 40 කි. 1972/73 තක්සේරු වර්ෂයේ සිට ආදයම් බදු සහ අනිවාර්‍ය ඉතිරි කිරීම් ගණන් බලනුයේ ඒකාබද්ධ ක්‍රමයක කොටසක් වශයෙන් ස්වයං තක්සේරු ක්‍රමයක් මතය.

(ඈ) වාර්ෂිකව රුපි. 12,000 ට වඩා අඩු ආදයමක් ලබන තනි පුද්ගලයින් අනිවාර්‍ය ඉතිරි කිරීමේ දයකත්වයන්ගෙන් නිදහස් කරනු ලැබේ. මධ්‍යම ආදයම් ලබන පන්ති වලට සහනයක් වශයෙන් නිදහස් කිරීමේ සීමා පවුලේ තත්ත්වයන් සමග අනු ක්‍රමිකව වැඩි කරනු ලැබේ. දරුවන් හෝ යැපෙන්නන් සතර දෙනෙකුගෙන් යුත් පවුලක එය රුපි: 15,100 දක්වා වැඩි කෙරේ.

---

1. 1971 නොවැම්බර් 13 වෙනි දින සිට සීනි සඳහා මාසික සලාකය රා: 3 දක්වා වැඩි කරන ලදී. මාසික සීනි සලාකය 1972, මාර්තු 1 දින සිට නැවත වරක් රා: 2 දක්වා අඩු කරනු ලැබිය.

2. ආදයමේ දැන් අපේක්ෂිත වැඩිවීම රුපියල් දශලක්ෂ 70 කි.

3. මෙම යෝජනාව ක්‍රියාත්මක කරනු ලැබූ නමුත් පාර්ලිමේන්තුව විසින් අවසන් ඇස්තමේන්තු සම්මත කරගත් පරිදි, එනම් මූලික ඇස්තමේන්තු වියදමේ මේ අඩුවීම නොපෙන්වයි. 174 පිටුවෙහි 1 වෙනි පා සටහන බලන්න.

(ඉ) ආදයම් බද්ද සහ අනිවාර්‍ය ඉතිරි කිරීම් වශයෙන් එම බද්දෙන් සියයට 40 ක් අඩු කළ විට මාසික ආදයම රුපි. 2,000 ඉක්මවන්නේ නම් එම සම්පූර්ණ අතිරික්තයට අතිරේක අනිවාර්‍ය ඉතිරි කිරීමේ දයකත්වයන් වශයෙන් ගෙවිය යුතුව තිබේ.

(ඊ) බද්දෙන් නිදහස් ආදයම් ලබන සමාගම් එම ආදයම්වලින් සියයට 50 ක් අනිවාර්‍ය ඉතිරි කිරීම් ක්‍රමය සඳහා දයක දීමනා වශයෙන් ගෙවිය යුතුය. නිර්‍යාත වෙළඳාමේ නියැලුනු සමාගම්වලට මේ සම්බන්ධයෙන් විශේෂ සහන ප්‍රදානය කරනු ලැබේ. අනිවාර්‍ය ඉතිරි කිරීමේ දයකත්වයන් ලෙස රුපියල් දශලක්ෂ 40 ක මුදලක් එකතු වෙතැයි අපේක්ෂා කෙරේ.

(2) බදු අය කිරීම

1972/73 තක්සේරු වර්ෂයේ සිට ආදයම් බද්ද සහ ධන බද්ද සඳහා ස්වයං-තක්සේරු ක්‍රමයක් ඇති කිරීමට යෝජනා කෙරිණ. 1970/71 තක්සේරු වර්ෂය සඳහා අනිවාර්‍ය ඉතිරි කිරීමේ දයකත්වයන් වෙනුවට සියයට 10 කින් වැඩි කළ සීමිත සමාගම්වල බදු ගෙවීමේ අනුපාතිකය 1970/71 තක්සේරු වසරෙන් පසුවද බලපවත්වනු ඇත. එසේ වනුයේ අනිවාර්‍ය ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය තවත් කාලච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක වන බැවිනි.

(3) සමාජ ශාලා

සමාජ ශාලාවලින් විශාල කොටසක් නොහොබිනා සහ සමාජ විරෝධී ක්‍රියාවල නිරතවී ඇති බැවින්, ඒවා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ පරීක්ෂාවට යටත් කරනු ලැබේ. මේ අදහස ඉටු කර ගැනීම සඳහා මෙකී සමාජ ශාලාවලින් වාර්ෂිකව රුපියල් 600 ක් අය කොට ලියාපදිංචි කිරීමට අදහස් කරනු ලැබේ. මෙම මූලයන්ගෙන් ලැබෙන ලැබීම් පලාත් පාලන ආයතනවලට ලබා දෙනු ඇත.

(4) රාජ්‍ය සේවකයන් සහ රජයේ සමායතනවල හා එවැනි වෙනත් ආයතනවල සේවකයන් සඳහා ඇති වෘද්ධෝපගත ආධාර ක්‍රමය

1972 ජනවාරි 1 ද හෝ ඊට පසුව ආණ්ඩුවේ ස්ථිර සේවයට කරන ලද අළුත් පත්වීම් සම්බන්ධයෙන් දයකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථසාධක අරමුදල් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරිණ.[1] පසුගිය අවුරුදුවල විශ්‍රාම වැටුප් සඳහා රජය දරණ ලද වියදම් සීඝ්‍රයෙන් වැඩිවීම මෙම පියවර ගැනීමට හේතු විය. රජයේ මුළු වියදමේ ප්‍රතිශතයක් වශයෙන් විශ්‍රාම වැටුප් සඳහා කරන ලද වියදම 1950/51 දී සියයට 4 සිට 1970/71 දී සියයට 7 දක්වා වැඩිවිය. මෙම කාල පරිච්ඡේදය තුළදීම රජයේ ආදයමේ ප්‍රතිශතයක් ලෙස එම වියදම සියයට 3·6 සිට සියයට 7·1 දක්වා වැඩිවිය. විශ්‍රාම වැටුප් සඳහා මුළු වියදම 1971/72 දී රුපියල් දශලක්ෂ 224 සිට 1974/75 දී රුපියල් දශලක්ෂ 255 දක්වා වැඩිවනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම යෝජනාව, විශ්‍රාම වැටුප් වෙනුවෙන් ආණ්ඩුව කරන වියදම් කෙරේ දිගු කලක් යන තෙක් බලපෑමක් ඇති නොකෙරේ.

(5) විගණක විධිවිධාන හා තක්සේරු කිරීම්

සමාගම්, හවුල් ව්‍යාපාර සහ තනි පුද්ගලයන්ගේ ගිණුම් කටයුතු සම්බන්ධයෙන්, පවත්නා ගණකාධිකරණ භාවිතයන්ගේ අඩුලුහුඩුකම් සමාගම්, හවුල් ව්‍යාපාර හා පුද්ගලයන් සම්බන්ධ වාර්තා හා සහතික පිළිබඳව අක්‍රමිකතාවලට මග පාදා ඇත. මෙවැනි අඩුපාඩුකම් බදු ආදයමේ අඩුවීම කෙරේ මෙන්ම විදේශ විනිමය ලැබීම කෙරේද අයහපත් අයුරින් බලපායි. මේ නිසා මෙම කටයුතු ගැන සලකා බලා අවශ්‍ය නීති කෙටුම්පත් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීමට යෝජනා කර ඇත.

---

1. මෙය මුල් අවස්ථාවේදී අර්ථසාධක අරමුදල් පදනමක් යටතේ විය යුතු බැව් තීරණය කෙරිණ.

රාජ්‍ය සංස්ථාවල විගණන කටයුතුවල තත්ත්වය නගා සිටුවීමේ අදහසින් රජයේ විගණන සහ කළමනාකාරසේවා කාර්යාංශයන් පිහිටුවීමට යෝජනා කර ඇත. රාජ්‍ය සංස්ථාවල කාර්යක්ෂමතාවය හා ක්‍රියාකාරිත්වය අගැයීම හැර, කළමනාකාරිත්වය හා ඊට සම්බන්ධ අනෙකුත් කටයුතු සඳහා උපදෙස් දීමද මෙම කාර්යාංශයට පැවරේ. රජයේ දෙපාර්තමේන්තු වල පමණක් නොව පලාත් පාලන ආයතන, බැංකු සහ සමුපකාර ආයතන සහ අනෙකුත් ව්‍යවසායන්ගේ ගිණුම් විගණනය කිරීමේදී මෙම කාර්යාංශයෙන් ආධාර හා උපදෙස් ලැබෙනු ඇත.

සංවර්ධනය වන ආර්ථිකයක තක්සේරුකරුගෙන් ඉටු විය යුතු කාර්ය සම්භාරය ඉතා වැදගත් වන බැවින්, තක්සේරුකාර වෘත්තියේ කටයුතු පාලනය කිරීමට සහ විශ්ව විද්‍යාල මට්ටමින් ඉගෙනීම් සඳහා පාඨ මාලාවක් සංවිධාන කිරීමට තක්සේරුකරුවන්ගේ ආයතන යක් මෙරට ඇති කිරීමේ හැකියාව ගැන සොයා බලනු ලැබේ. තක්සේරු දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථාපිත තත්ත්වයක් දීමේ අදහස සලකා බලනු ලැබේ.

(6) රාජ්‍ය මැණික් සංස්ථාව

රාජ්‍ය මැණික් සංස්ථාවේ කටයුතු සාර්ථක කිරීම සඳහා යම් යම් බදු සහනතා ඇති කරනු ලැබේ. එම නිසා සංස්ථාවට මැණික් අලෙවි කරන ලංකාවේ සෑම පුද්ගලයකුටම මාස තුනක ආදයම් බදු හා ව්‍යාපාර පිරිවැටුම් බදු සමාවක් දීමට අවශ්‍ය නීති රීති සකස් කරනු ලැබේ. තවද, යථෝක්ත සමා කාලපරිච්ඡේදයෙන් පසුවත් ලාංකිකයෙකු සංස්ථාවට මැණික් අලෙවි කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ සංස්ථාව මාර්ගයෙන් මැණික් අපනයනය කිරීමෙන් ලැබෙන ලාභයක් හෝ ආදයම් බද්දෙන් නිදහස් කිරීමට හැකිවන පරිදි 1963 අංක 4 දරණ දේශීය ආදයම් බදු පනත සංශෝධනය කිරීමට අදහස් කරනු ලැබේ. බදු සමා කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසුව මැණික් අලෙවි කිරීමේ පිරිවැටුම් මත පිරිවැටුම් බදු ගෙවිය යුතුය. යථෝක්ත යෝජනාවන් හේතුවෙන් ආදයමේ සැලකිය යුතු පහළයාමක් අපේක්ෂා කළ හැකි නමුත් එමගින් ඇතිවන විදේශ විනිමය වාසි මගින් එවැනි පාඩු මගහැරී යතැයි අපේක්ෂා කෙරේ.

(7) රාජ්‍ය ස්කාගාර සංස්ථාව

වැඩිවන ඉල්ලුම සපුරාලීමට සහ ඒවායේ තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා අරක්කු මුළු නිෂ්පාදනය පුළුල් කිරීමේ අදහසින් රාජ්‍ය ස්කාගාර සංස්ථාවක් ස්ථාපනය කිරීමට අදහස් කරනු ලැබේ. මෙම සංස්ථාව දැනට පවතින සියළුම ස්කාගාර පවරා ගන්නා අතර එම සංස්ථාව අරක්කු පෙරීම පිළිබඳ පරම ඒකාධිකරු බවට පත්වේ.[1]

11. අනෙකුත් රාජ්‍ය මූල්‍ය විධිවිධාන

1970/71 මුදල් වර්ෂය තුළදී පනවන ලද අනෙකුත් වැදගත් රාජ්‍ය මූල්‍ය විධිවිධානයන් පහත දැක්වේ:

(අ) 1970/71 අය-වැය වාර්තාව අනුව ආනයන බදු සුවිධානය කිරීම යටතේ බීඩී කොලවලින් අය කරන ආනයන බද්ද රාත්තලට ශත 21 සිට රු. 5·00 දක්වා ඉහළ නැංවූ අතර ගරු මුදල් ඇමතිතුමා විසින් නිකුත් කරන ලද අතිරේක නියෝගයක් මගින් එය රු. 3·50 දක්වා අඩු කෙරිණ.

(ආ) 1971 අප්‍රේල් 5 දින සිට ඔට්ටු ඇල්ලීමේ හෝ ඔට්ටු මගින් ගනුදෙනු කරන හෝ ඊට සම්බන්ධව ව්‍යාපාර හෝ එවැනි ව්‍යාපාරයකින් සියයට 5 ක පිරිවැටුම් බද්ද පැණවින.[2]

---

1. සංස්ථාව විසින් පවරා ගනු ලබන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවේ වාණිජ කටයුතු පමණක් බැව් රජය විසින් පසුව තීරණය කෙරිණ.

2. 1971 අප්‍රේල් 5 දින අංක 14952/5 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය.

(ඇ) 1970/71 තක්සේරු වර්ෂය සඳහා සමාගම් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සියයට 10 කින්, එනම් සියයට 50 සිට 60 දක්වා වැඩි කෙරිණ. 1970/71 අය-වැය වාර්තාවෙන් මූලික වශයෙන් යෝජනා කළ පරිදි සමාගම්වලට අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමය අදාළ නොකිරීමට ගත් තීරණය නිසා මේ විධිවිධානය පැනවිණ.

(ඈ) 1971 ඔක්තෝබර් 28 ද සිට පිරි සහ සුපිරි පැවරල්වලින් අය කරන ව්‍යාපාර පිරිවැටුම් බද්ද සියයට 37 සිට 48 දක්වා වැඩි කරන ලදී.[2]

(ඉ) 1971 ඔක්තෝබර් 28 ද සිට පයිප්ප දුම්කොළ හා සිගරට් නිෂ්පාදනයෙන් අය කරන දුම්කොළ බද්ද රාත්තලකට රුපි. 42·50 සිට 47·50 දක්වා වැඩි කරන ලදී.[2]

---

1. 1971 අංක 37 දරණ දේශීය ආදායම් බදු සංශෝධන පණත.
2. 1971 ඔක්තෝබර් 27 වෙනි දින අංක 14981/5 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය.